56 වන කාණ්ඩය
5 වන කලාපය

අඟහරුවාදා
1964 ජූලි 14

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

### අන්තර්ගත ප්‍රධාන කරුණු

**1964 ජූලි 13 වන සඳුදා**

[වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම]

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [හතර වන දිනය]
විවාදය කල් තබන ලදී.

---

**1964 ජූලි 14 වන අඟහරුවාදා**

පිළිගන්වන ලද කෙටුම්පත් පණත් :

**Ceylon Shipping Corporation Bill**
**Registration of Business Names Bill**
**Companies (Amendment) Bill**
**Tea Propaganda (Amendment) Bill**

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [පස්වන දිනය]
විවාදය ඉදිරියට ගෙන යන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 56
இல. 5

செவ்வாய்க்கிழமை,
14, ஜுலை 1964

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

**திங்கட்கிழமை, 13 ஜுலை, 1964**

[நிகழ்ச்சித் தொடர்]

மகா தேசாதிபதியினது பேச்சு :
நன்றியுரை மீதான விவாதம் [நாலாம் நாள்]
விவாதம் ஒத்திவைக்கப் பெற்றது

---

**செவ்வாய்க்கிழமை, 14 ஜுலை, 1964**

முதல் மதிப்பிடம்பெற்ற மசோதாக்கள் :
Ceylon Shipping Corporation Bill
Registration of Business Names Bill
Companies (Amendment) Bill
Tea Propaganda (Amendment) Bill

மகா தேசாதிபதியினது பேச்சு :
நன்றியுரைமீதான விவாதம் [ஐந்தாம் நாள்]
விவாதம் தொடர்கிறது.

---

Volume 56
No. 5

Tuesday,
14th July, 1964

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

(Uncorrected)

PRINCIPAL CONTENTS

**Monday, 13th July, 1964**

[*Continuation of Proceedings*]

GOVERNOR-GENERAL'S SPEECH :
Debate on the Address [*Fourth Day*]
Debate Adjourned

---

**Tuesday, 14th July, 1964**

BILLS READ THE FIRST TIME :
CEYLON SHIPPING CORPORATION BILL
REGISTRATION OF BUSINESS NAMES BILL
COMPANIES (AMENDMENT) BILL
TEA PROPAGANDA (AMENDMENT) BILL

GOVERNOR-GENERAL'S SPEECH :
Debate on the Address [*Fifth Day*]
Debate *contd.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
## 1964 ජූලි 13 වන සඳුදා

[1964 ජූලි 13 වන සඳුදා නිල වාර්තාවේ 448 වන තීරයේ සිට ඉතිරි වැඩ කටයුතු.]

## අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [සතරවන දිනය]

*மகா தேசாதிபதியின் பேச்சு*
*நன்றியுரை மீதான விவாதம்*
*[நான்காம் நாள்]*

## GOVERNOR-GENERAL'S SPEECH DEBATE ON THE ADDRESS [FOURTH DAY]

අ. භා. 5.58

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රාජාසන කථාව සම්බන්ධයෙන් අපේ ගරු වෙළඳ ඇමතිතුමා විසින් කරුණු කීපයක් කියන්න යෙදුණා. රාජාසන කථාවේ ගැබ් වී තිබෙන කරුණුවලට බහින්න පෙර එතුමගෙ කථාවෙදි කියන්න යෙදුණු වචන තුනක් පමණක් අරන් මතක් කරන්න කැමතියි, ඒ කරුණු තුන නියම ප්‍රතිපත්ති උඩ සලකා බලන විට මේ රාජාසන කථාවට අදාළ නැති බව. මේ රාජාසන කථාව බෞද්ධ නීතියටත් මාර්ක්ස් වාදයටත් රාජ නීතියටත් යන තුනටම පටහැණිව ඉදිරිපත් කර තිබෙන රාජාසන කථාවක්ය කියා මම මුලින්ම කියනවා. ඒ අනුව මේ රජය සම්බන්ධව වචන ටිකක් මුලින්ම කිය යුතුව තිබෙනවා.

බුද්ධාගමත් මාර්ක්ස් වාදයත් ගැන ගරු වෙළඳ ඇමතිතුමා විසින් කියන්න යෙදුණා. ඔව්, ඒ දෙකේ ඉතාමත්ම කිට්ටු සම්බන්ධයක් තිබෙනවා. ප්‍රතිපත්ත්‍යානුකූලව ඉතා කිට්ටු සම්බන්ධකමක් තිබෙනවාය කියා මා කියනවා. ඒ ප්‍රතිපත්ත්‍යානුකූලව තිබෙන සම්බන්ධකම ඉදිරියට ගෙන යෑම පිණිස රජයේ නීතියත් හරියාකාර ක්‍රියාත්මක කරන්න ඕනෑය කියා මා කියනවා. නමුත් මේ තුනම එකට ගැබ් වී තිබුණත් ඒ තුනටම පටහැණිවයි මේ රජය අද ගෙන යන්නේ කියන එක මේ රාජාසන කථාවෙන් පැහැදිලි වශයෙන් අපට ඔප්පු කරන්න පුළුවන්. මෙය ඔප්පු කරන්න පෙර ඉතිහාසය ගැන ටිකක් මතක් කළ යුතුව තිබෙනවා. අපේ ගරු වෙළඳ ඇමතිතුමා විසින් නිදහස් හා සම්බන්ධ ඉතිහාසය ගැන ටිකක් කියන්න යෙදුණ නිසයි ඒ. මේ රටේ ජනතාවගේ බලපෑම නිසා පමණක් නිදහස ලැබුණාය කියා 1946, 1947 අලලා එතුමා විසින් කියන්න යෙදුණා. එය සුළු වශයෙන්වත් මතක් කිරීම ගැන මා එතුමාට කෘතඥ වෙනවා. ඒ ගැන අපට ඊට වඩා දුරට යන්නට තිබෙනවා. විශේෂයෙන්ම මේ රටට සර්වජන ඡන්ද බලය දෙන අවස්ථාවේදී—එය ලබා ගන්නා අවස්ථාවේදී—ඔය උදවියත් දැනට මේ පැත්තේ සිටින එක්සත් ජාතික පක්ෂය බිහි කළ මූලික පරම්පරාවත් මේ රටේ සර්වජන ඡන්ද බලය සම්බන්ධව ඒ අවස්ථාවේදී කී කරුණු ගැන අපි මතක් කළ යුතුව තිබෙනවා. මා විශේෂයෙන්ම මේ කරුණ කියන්නේ සර්වජන ඡන්ද බලය දීම සම්බන්ධයෙන් 1927 පමණ කාලයේදී මේ රටට පැමිණි ඩොනමෝර් කොමිෂන් සභාව ඉදිරිපිට කොල්ලකු වශයෙන් මාත් සාක්ෂි දුන් නිසයි. "කොස්මොපොලිටන් කෘෘ" නමැති සංවිධානයකින් අපි 7 දෙනෙක් සාක්ෂි දෙන්නට ගියා, මේ ඩොනමෝර් සාක්ෂි දෙන්නට ගියා, මේ ඩොනර්මෝර් කොමිෂන් සභාව ඉදිරිපිටට. එයින් එක් කෙනෙක් මම. ඒ "කොස්මොපොලිටන් කෘෘ" එකේ සාමාජිකයකු වශයෙන් සිටියා ඇල්බට් වැලිකල කියා පතල් කම්කරුවෙක්. ඒ වාගේම අබ්දුල් කරීම් කියා මුස්ලිම් කම්කරුවෙකුත් හිටියා. ඒ වගේම නීතිඥ ශිෂ්‍යයින් දෙපොලක් හිටියා හැරී ගුණවර්ධන හා ඩී. පී. අතපත්තු කියා. ඒ වගේම තවත් නීති ශිෂ්‍යයෙක් හිටියා කදිරවේලු පොන්නම්බලම් කියා—යාපනයේ නගරාධිපතිතුමා. ඒ වගේම දකුණු ප්‍රදේශයේ හිටියා ඩී. පී. අතපත්තු.

අපි මේ සාක්ෂි දෙන අවස්ථාවෙදි රටේ බලවත් සංවිධාන එතැනට ගිහින් සාක්ෂි දුන්නා. "ප්ලාන්ටර්ස් ඇසෝසියේෂන්"—[illegible] සංගමය, "ලෝ කන්ට්‍රි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

ප්ලාන්ටර්ස් ඇසෝෂියේෂන් "— අපේ සෙනෙට් මන්දිරයේ දැනට සිටින උන්නැහේ ඒ සංවිධානයේ සභාපති වී සිටියා—ඒ වගේම "මර්කන්ටයිල් ඇසෝසියේෂන්" ආදී වශයෙන් මූලික සංවිධානත්, පුද්ගලයන් වශයෙන් එවකට සිටි අපේ දේශපාලන ප්‍රධානීන්, සර්. ඩී. බී. ජයතිලක, අපේ එක්සත් ජාතික පක්ෂයේ දැනට සිටින විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමාගේ පියාණන්, ආර්. එල්. පෙරේරා, චන්ද්‍රසේකර, ඔබේසේකර, බණ්ඩාරනායක, ඔය ඔක්කොම සාක්ෂි දෙන්ට ගියා. ගිහින් කීවෙ මොකක්ද? මේ රටේ ජනතාවට, වයස 21 න් වැඩි උදවියට, ඡන්ද බලය දීම යෝග්‍ය නැහැ කියලයි කීවෙ. ඒක මම හොඳට සටහන් කර තියන්න ඕනෑ. ඒ. ඊ. ගුණසිංහ මහත්මයාගෙ "ලේබර් පාටි" එක තමයි සර්වජන ඡන්ද බලය කෙළින්ම ඉල්ලුවෙ. එතකොට සංවිධාන වශයෙන් මේ රටට සර්වජන ඡන්ද බලය ඉල්ලුවෙ දෙකයි. එකක් ඒ. ඊ. ගුණසිංහ මහත්මයාගෙ "ලේබර් පාටි" එක; අනික් එක "කොස්මොපොලිටන් කෘෘ කියන සුළු සංවිධානයයි. ඒක මම විශේෂයෙන් සටහන් කළ යුතුව තිබෙනවා.

ගරු ඇමතිතුමා ප්‍රකාශ කරන්ට යෙදුණා නිදහස් සටන් ගෙන ගිය බව. ඔව්, එක් දහස් නවසියතිස් ගණන්වල මුලින්ම මේ රටේ වාමාංශික ව්‍යාපාරය පටන් ගත්තා. එ ගැන සඳහන් කරන්ට පෙර මම වචනයක් කියන්ට ඕනෑ මන්ද, මගේ සහෝදරයා, අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) මෙතන වචනයක් කියන්ට යෙදුණු නිසයි. තමා දේශපාලන ගුරුවරයාය කියා එතුමා කීවා. මම හුඟක් දුරට එය පිළිගන්නව. යම් යම් විදේශීය රටවල සංචාරය කර අවුරුදු 11 කට පසු 1932 නොවැම්බර් මාසයේදී එතුමා ලංකාවට ආවා. නමුත්, මම එතුමාට, අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාට, කියන්ට සතුටුයි, එතුමා එන්නට පෙරයි මේ රටේ සර්වජන ඡන්ද බලය උඩ 1931 දී මැතිවරණයක් පැවැත්වුණේ. මා මාක්ස් වාදය එ තරම් ඉගෙන ගෙන නැහැ. නමුත් රටේ පුරවැසියකු වශයෙන්, ගම්බද පරිසරය ආශ්‍රය කළ තරුණයකු වශයෙන්, ඒ අවස්ථාවේදී ගත් අඩිය සඳහන් කරන්ට ඕනෑ. මගේ ලොකු අයියා, හැරී ගුණවර්ධන තමයි ඒ අවසථාවෙදි මැතිවරණයට ඉදිරිපත් වුණේ. ඒ වගේම ජේ්පාරස්ටර් ඔබේසේකර මහත්මයාත් දකුණු ප්‍රදේශයෙන් මේ ප්‍රදේශයට, හේවාගම්කෝරළේට, තරඟ කරන්ට බැස්සා. නමුත් හැරී ගුණවර්ධන මහත්මයාගෙ දුර්වල ගතිය තිබියදීත් රදල පවුලට ඉඩ නොදෙන්න මා සිතා ගත්තා. ජේ්පාරස්ටර් ඔබේසේකර මහත්මයා කලක් මේ මුලසුන දරා ගෙන සිටියා. එතුමා 1931 ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ මාතර ආසනය වෙනුවෙන් පෙනී සිටියා. රාජ්‍ය මන්ත්‍රණ සභා ආසනයක් බලාපොරොත්තුවෙන් හේවාගම්කෝරළේ අවිස්සාවේල්ලට පනින්ට ආව. හැරී ගුණවර්ධන ඇතුළු තවත් දෙන්නෙක්, රෙව රන් බොතේජු, තවත් නීතිඥයෙක් —ජැකොලයින්—ආදී කීප දෙනෙක් මැතිවරණයට ඉදිරිපත් වුණා. ඉදිරිපත් වී ටික දවසකින් ජේ්පාරස්ටර් ඔබේසේකර මහත්මයාට ආසනයට ඉඩ සලස්වා ගන්න සාකච්ඡාවට අපේ ගෙදරට ආව. හෝමාගම ගරු මන්ත්‍රීතුමාගෙ (ගාමිනී ජයසූරිය මයා.) පියා වන බර්නාඩ් ජයසූරිය මහත්මයාත්, සෙනෙට් මන්ත්‍රී චන්ද්‍ර ගුණසේකර මහත්මයාගෙ පියාත්,—ඔහු මගෙ මාම කෙනෙක්—බණ්ඩාරනායකතුමාත්, ඇතුළු කීප දෙනෙකු ඇවිත් හැරීට නතරවන්ට කිව්ව. කලින් සාකච්ඡාවකදී හැරී ඉඩ දෙනවාය කියා තිබුණු නිසා, කෙලින්ම ඉඩ ලබාගන්න අපේ ගෙදරට ආව. ඒ සාකච්ජාවෙදි මා කලින්ම කිව්ව, මාතරින් පන්නා දැමූ මේ රදල කොවුලට —ජේ්පාරස්ටර් ඔබේසේකරට—හේවාගම් කෝරළේ මුල් බහින්ට හේවාගම් කෝරලේ සටන්කාමී ජනතාව ඉඩ දෙන්නෙ නැහැ, ඒ නිසා හැරී එන්නෙ නැත්නම් කුඹුරු වැඩ කරන ප්‍රධාන ගොවිරාළ වන පොඩිසිංඤො අයියා මේ රදල කොවුලට විරුද්ධව ඉදිරිපත් කරනවාය කියා. රදලයන්ට විරුද්ධව ඒ සටන පටන් ගත්තෙ 1931 දියි. ඉතිහාසය සමහරුන්ට අමතක වී තිබෙන නිසා මේ කාරණා මතක් කළ යුතුයි. විශේෂයෙන්ම මෙය මතක් කළ යුත්තෙ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාටයි (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.)— ගුරුකම ගැන මතක් කළ නිසා. ඔය ආකාරයට 1931 ගෙන ගිය සටනේ ප්‍රති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එලයක් වශයෙන් ඒ ප්‍රදේශයේ එඩිතර ජනතාව දිගටම නැගගෙන ආව. 1933 දී කණ්ඩායමක් ඇති කර කටයුතු කරගෙන ගොස්, 1935 දෙසැම්බර් 18 වැනිදා සම සමාජ පක්ෂය වශයෙන් සංවිධානයක් බිහි කළා. එය බිහි කරන්ට පෙර ගරු මුදල් ඇමතිතුමා, මා හිතන්නෙ, ශ්‍රෑන්ඩ්පාස් එකෙන් එහා පැත්තෙ කවුරුවත් දැන ගෙන හිටියෙ නැහැ කියායි. අපට භාග්‍ය ලැබුණා, එතුමාව ඒ පැත්තට එක්ක ගිහින් තබාගෙන ටිකක් ආශ්‍රය කරවා ගම්වල මිනිසුන්ට හඳුන්වා දී රුවන්වැල්ල ආසනයට ඉදිරිපත් කරවන්න. තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. රුවන්වැල්ලට එන්. එම්. වත්, අවිස්සාවේල්ලට පිලිප්වත්—නැහැ. පළමුවෙන් රුවන්වැල්ලට ලෙස්ලින්, අවිස්සාවේල්ලට පිලිපුත් දමන්න යෝජනා කළ අවස්ථාවේ, පානදුර ආසනයට ලෙස්ලි සවාධීන ඉදිරිපත් වෙනවා යයි කියා සිටීම නිසා එන්. එම්. රුවන්වැල්ලටත් පිලිප් අවිස්සාවේල්ලටත් ඉදිරිපත් වුණේ මා හිතන්නෙ මගේ කටින්ය කියායි. පිලිප් අවිස්සාවේල්ලට දමන්ට යෑමේදී අපේ ගෙදර පොඩි පටලැවිල්ලක් ඇති වුණා. ඉතිහාසය කීමේදී ඒ කාරණා මතක් කළ යුතුයි. ඒ වෙලාවෙ, 1931 දී දුබල, චපල ගතිය පා පැරදුණු හැරී නැවත එන්ට ඕනෑයි කිව්වා. 1931 දී මාසයක් පමණ එන්නෙ නැතැයි කියමින් සිටී හැරී අන්තිමේදී ඉදිරිපත් වී 7,000 කින් දිනන්ට තිබුණු එක 700කින් පැරදුණා. 1936 හැරී ඉදිරිපත් වන්ට ඕනෑය කිව්ව අවස්ථාවේදී ඊට විරුඩ වන්ට මට සිද්ධ වුණා. 1931 දී ඉදිරිපත් වී චපල ගතිය පෑ නිසා මේ චපලයාට මින් මත්තට ඉඩ දෙන්න බැරිය, පිලිප්ට මේවර තරඟ කරන්ට ඉඩ දෙන්න ඕනෑයයි මා කිව්ව. හැරී කිව්ව, "නැහැ මම එන්ට ඕනෑ" කියා ගරු මන්ත්‍රීවරයෙක් මතක් කළපරිදි අපේ ගෙදර අවුරුදුපතා පිරිතක් පැවැත්වෙනව. ඒ අවුරුද්දෙ පිරිත පැවැත් වෙන දවසෙයි මේ කාරණය මතු වුණේ. මා ඒ අවසථාවේදී කිව්ව, පැය ½ක් ඇතුළත ඔය වචනය හැරී වෙනස් කළේ නැත්නම් මේ බාල මල්ලී තමයි, හැරීගෙ ප්‍රධාන හතුරා කියා. ඒ කියා පැය භාගයක් යන්ට කලින් ඒ වචනය අස්කර ගත් නිසා තමයි, පිලිප්ව 1936 දී අවිස්සාවේල්ලට දමා ගන්න පුළුවන් වුණේ. ඉතිහාසය අමතක වෙලා ගුරුවරුන්ය කියමින් රටේ හැමදාම දඟලන්ට ලැහැස්තිවන නිසා ඉතිහාසය ටිකක් මතක් කරන්ට ඕනෑ.

සමාජවාදී ව්‍යාපාරය 1935 දී බිහි කරල ප්‍රතිපත්ති අනුව වැඬ කිරීමට රටට බැස්ස. ඒ අවස්ථාවේදි නොයෙක් සිද්ධීන් ඇති වුණා. ඒ සිද්ධීන්වලදී සංවිධානය රැක්කෙ කවුද? එංගලන්තයේ සිටි උදවිය නොවෙයි; කැති පිහිටිය, තුවක්කුඅරගෙන ඒ අවස්ථාවල සංවිධානය රැක ගත්තෙ මේ රටේ සිටි සුළු කොටසයි. ඒ උදවියගෙ නම් මතක් කරන්ට අද බොහොම දෙනා ලැජ්ජයි. පෝරෙ ස්ටීවන්ලා, මීපෙ අබරන්ලා, මානිස් අප්පුහාමිලා, ටී. ඩී. fප්‍රැන්සිස්ලා, බෝගල සවුන්දියස්ලා, ඇල්බට් අර්නස්ට් පීරිස්ලා, ඇම්. කේ.ඩී. කොරනේලිස්ලා, සිරිසේනලා බෝගොඩ ඇල්බට්ලා, යනාදී අය නෙවෙයිද අපේ ජීවිත ටික බේරා ගත්තෙ? ඇයි ඒ මූලික ටික දෙනා අමතක කර දමා තිබෙන්නෙ? ඒකයි මට කනගාටු. ඒ නිසා තමයි අද ගරු මුදල් ඇමතිතුමා—වෙළඳ ඇමතිතුමා කොහොම ප්‍රකාශ කරන්න යෙදුණත්—ඔය ධනපති රදල රජයට හවුල්කාරයන් වීමෙන් තිස් අවුරුද්දක් තිස්සෙ ගෙන ගිය ව්‍යාපාරය පාවා දී තිබෙන බව කියන්නෙ. ඒක මම මුලදීත් කිව්වා. බෞඩ ධර්මයටත් මාක්ස් වාදයටත්, රාජ නීතියටත් පටහැනිවයි මේ ක්‍රියාව කර තිබෙන්නෙ.

මාර්තු මාසෙ හරියේදී ගරු අගමැතිණියට අමුතු අදහසක් පහළ වුණාලු. දැන් වෙළඳ ඇමතිතුමා ඒ ගැන ප්‍රකාශයක් කරන්න යෙදුණා. මොකක්ද මේ අමුතු අදහස? මේ රජය දුබල තත්ත්වයට වැටී තිබෙනවාය, ඒ දුබල තත්ත්වයෙන් බේරා ගෙන 1956 පටන් ගත් ක්‍රියා මාර්ගය මේ රටේ ස්ථාපිත කිරීම පිණිස වමේ කොටස්වලට කථා කළ යුතුය යන්නයි එම අදහස. ඔව්., වෙන්න පුළුවන්. මම අහනවා මේ ඇමතිවරුන්ගෙන් මාර්තු මාසෙ 8 වෙනි දායින් පස්සෙ මේ ඇමතිවරු සිටියේ තමන්ගේ ගෙවල්වලද, එහෙම නැත් නම් හැංගිලාද කියා. හැංගිලා හිටියා නම් ඒකට හේතුව මොකක්ද කියාත් මම අහනවා. ඔව්, ඒකට හේතුව මොකක්ද කියා මම අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමාගෙන් (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) අහනවා. මම තව දුරටත් අහනවා, අගමැතිණිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

විසින් කැඳවන්න යෙදුණේ මොකද කියා. වැරදුණු කුරුමානමයි ගරු අවිස්සාවේල්ලෙ මන්ත්‍රීතුමාට වුණේ. වැරදුණු කුරුමාණමෙන් පස්සෙ කඩවුණු පොරොන්දුවට භාජන වුණා. වැරදුණ කුරුමාණමත්, කඩවුණ පොරොන්දුවත් දෙකම එතුමාට විඳින්න සිද්ධ වුණා. කඩවුණ පොරොන්දුව නළුවා මුදල් ඇමතිතුමායි. රුක්මණී දේවීත් එහා පැත්තෙ ඉන්නවා.

හොඳයි මම ගරු මුදල් ඇමතිතුමාගෙනුත්, වැරදුණු කුරුමාණමෙනුත් අහනවා, කඩවුණ පොරොන්දුවෙන් දුන් පොරොන්දු දූන් තිබෙනවාද කියා. ඒ ගැන ප්‍රකාශයක් කරන්නය කියා මම ඉල්ලනවා. දැනට මුදල් ඇමතිතුමා මෙහි නැහැ. හොඳයි අපට ඒ ප්‍රකාශය ඉදිරියෙට ලැබේවි. අවිස්සාවේල්ලෙ මන්ත්‍රීතුමා ඊයෙ පෙරේදා කිව්වා, පුදුම විධියේ වචන ටිකක්. මට නම් මුලක් අගක් හොයා ගන්න බැරි වුණා. ඒ වාගේම මැද කොළඹ ගරු දෙවැනි මන්ත්‍රීතුමා (පී. ජී. බී. කේනමන් මයා.) කළ කථාවත් තේරුම් ගන්න මට බොහෝම අමාරුයි. මාක්ස්වාදයට අනුවද, ධනපති වාදයට අනුවද, එසේ නැත්නම් රදළ වාදයට අනුවද ආණ්ඩුව යන්නෙ කියන එක පැහැදිලි කර කිව්වෙ නැහැ. ප්‍රතිගාමීන් ඉන්නවාය, ප්‍රතිගාමීන්ට විරුද්ධව සිට රජය ආරක්ෂා කිරීම අපේ අදහසය කියා කිව්වා මිසක් ඊට වඩා දෙයක් කිව්වෙ නැහැ. ඒක අමුතු එකක් නොවෙයි. මෙතෙක් කාලයක් මේ රටේ නියම ප්‍රතිපත්ති අනුකූලව ගෙන ගිය පංක්ති සටනින් ඇත් වී ගොස් සිටින උදවියගේ අලුත් ලක්ෂණය තමයි, ඔය පංක්ති සහයෝගතාවය.

ගරු සභාපතිතුමනි, අපේ ගරු මුදල් ඇමතිතුමා ගැනත් ඔහුගේ පක්ෂය සම්බන්ධවත් වචනයක් කියන්නට ඕනෑ. විශේෂයෙන් අවුරුදු 30ක පමණ දීර්ඝ ඉතිහාසයකුත්, ලක්ෂණ ප්‍රතිපත්තිත්, විනය ගරුක භාවයකුත් එතුමන්ලාට තිබුණා. නමුත් මේවා උල්ලංඝනය කර එම පක්ෂයෙන් 1960 මැයි මාසයේදී මා පිටුවහල් කර ඔය සාරියේ එල්ලෙන්නට ගියා. එතුමන්ලාට ඒක මතක් කරන්නට තිබෙනවා. 1960 මැයි මාසයේ 1 වනදා පිටවුණ පත්‍රවල ලංකා සමසමාජ පක්ෂයේ පාවාදීම පිළිබඳව පළ වී තිබුණේ මෙන්න මේ ආකාරයටයි.

"Robert (gagged) throws May Day bombshell at High Command

LSSP'S 'GREAT BETRAYAL'

Quotes secret drafts to prove pacts with S. L. F. P. & F.P.

Gagged on the eve of May Day by the high command of the L. S. S. P., Mr. Robert Gunawardena yesterday accused the leadership of his party of gradually liquidating the party deliberately, in order that some of its members might share in a Joint Government of the 'capitalist' Sri Lanka Freedom Party, and the 'racialist' Federal Party.

He said : 'I feel it is my duty to bring before the people the facts concerning the great treachery and betrayal the present leadership is carrying on.'

Mr. Robert Gunewardena, a veteran of the L. S. S. P. Central Committee for 28 years, was yesterday told that he would not be allowed to speak at the party's May Day Rally to be held today in view of the speech he had made in Parliament during the debate on the Throne Speech."

I was in that Central Committee since the inauguration of the Party on the 8th December. 1935 up to the date of my expulsion. I was the only Central Committee member who was in the Party right through that period.

1960 මාර්තු මාසයේදී මේ රටේ අගමැතිවරයා වශයෙන් සිටියේ එක්සත් ජාතික පක්ෂයේ ගරු ඩඩ්ලි සේනානායක මැතිතුමායි. ඒ අවස්ථාවේදී එවකට තිබුණු ආණ්ඩු පැරදවීම පිණිස ලංකා සමසමාජ පක්ෂයේ සම්මේලනයේදී තීරණයක් ගත්තා. එසේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පරදවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සී. පී. ද සිල්වා මහතාගේ රාජාසන කථාවට පක්ෂව ඡන්දය දීමයි, 1960 අප්‍රියෙල් මාසයේ 17 වනදා පැවති සමසමාජ පක්ෂයේ විශේෂ සම්මේලනයේදී ඉදිරිපත් කරන ලද යෝජනාව. මෙම යෝජනාවට මම තරයේම විරුද්ධ වුණා. මා පමණක් නොවෙයි, බුලත්සිංහල මන්ත්‍රීවරයා (එඩ්මන් සමරක්කොඩි මයා.) ඇතුළු 168 දෙනකුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධ වුණා. නමුත් අපි පැරදුණා. එක්සත් ජාතික පක්ෂය පැරද්දීම සම්පූර්ණයෙන්ම පිළිගන්න නමුත් තමුන්නාන්සෙල කොහොමද දනනෙ සී. පී. ද සිල්වා මහත්මයා අගමැති වී රාජාසන කථාව ගෙනේවිය කියා. මෙම සම්මේලනයේ දී මම ප්‍රශ්න කළා ඊළඟට මම දෙහිවල-ගල්කිස්ස මන්ත්‍රීතුමාගෙන් (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) ඇහුවා, ගරු මන්ත්‍රීතුමා මේ ගැන දන්නවාද, කියා. එතකොට එක පාරටම හදිසියෙන්ම වාගේ ඒ මන්ත්‍රීතුමා නැගිටල අහනවා, "ඇයි මගෙන් අහන්නෙ, මම සී. පී. ද සිල්වාගෙ මාමා නිසාද" කියා. මම කීවා "ඔව්, දැනට දෙහිවල-ගල්කිස්ස ආසනය පැරදිලා, සෙනෙට් සභාවට දමලා, අධිකරණ ඇමති පදවිය දීමේ පොරොන්දුව පිටය" කියා. ගරු මුදල් ඇමතිතුමා එම සම්මේලනයේ මූලාසනයේ දැරූ නිසා මම කියන කාරණා ගැන හොඳින් දන්නවා ඇති. මම මේ අවස්ථාවේදී ප්‍රශ්න කළා. මුදල් ඇමති ධුරය දෙන්නට පොරොන්දු වී සිටින නිසා සී. පී. ද සිල්වා මහතා අගමැති කරවීමේ අදහසින් රාජාසන විවාදයේදී, සී. පී. ද සිල්වා මහතාගේ කථාවට පක්ෂව ඡන්දය දෙන්නට තීරණය කර තිබෙනවා නොවේද, කියා. මගේ අදහස්වලට විරුද්ධව වැඩි කොටසක් සිටියත් අවසානයේදී සිද්ධ වුණේ මොකක්ද? එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට තීරණය කළා. 1960 මාර්තු මාසයේදී බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂයේ රාජාසන කථාව පැරදීම නිසා ඉල්ලා අස් වන්නට සිදු වුණා. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පරාජය කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට පත් කර වන්නට සමසමාජ පක්ෂය උදව් කෙළේ එවකට මහජන මන්ත්‍රීකමක් නොතිබුණු දැන් දෙහිවල-ගල්කිස්ස ගරු මන්ත්‍රීතුමා සෙනෙට් සභාවටත් පත් කොට අධිකරණ ඇමතිකම දීම හා යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට මුදල් ඇමතිකම දීම පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමග පොරොන්දුවකට පැමිණි නිසයි. නමුත් මේ තත්ත්වය සැලකිල්ලට ගෙන එදා එක්සත් ජාතික පක්ෂයේ රාජාසන කථාව පිළිබඳ විවාදයේ දී මා කීවේ කුමක්ද?

"I shall not permit you to stabilize the capitalist S. L. F. P. Government. I shall oppose that. If we do permit you to stabilize the capitalist S. L. F. P. Government we have to dissolve ourselves."

ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් සථාපිත කිරීමට මා ඉඩ නොදෙන බවත්, එසේ ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් ස්ථාපිත කිරීම සඳහා සහයෝගය දුන්නොත් සමසමාජ පක්ෂය විසුරුවා හැරිය යුතු බවත් මා කීවා. මේ සිද්ධිය වී දැන් හතර අවුරුද්දයි. හතර අවුරුද්දකට පසුව දැන් සිදු වී තිබෙනනේ මොකක්ද? එදා කරන්නට ලෑස්ති වූ පාවා දීමම නේද? ද්‍රෝහියන් එකතු වී මහා පාවා දීමක යෙදුණා නේද? කම්කරු සටන් මඟින් මේ රටේ ජනතාව සිය ගණන් මරා දමා, හිර ගෙවල්වල ලගින්නට සල්වා පවුල් විනාශ කරවා නේද මේ කාලකණ්ණි මුදල් ඇමතිවරයා මේ ස්ථානය ලබාගෙන තිබෙන්නේ? 1960 මැතිවරණයෙන් පසුව මේ රටේ වාමාංශිකයන් පක්ෂ තුනක් වශයෙන් අවුරුදු 3 ක් කල් සිටියාට පසුව වාමාංශික එක්සත් පෙරමුණ පිහිටුවා ගත්තා. 1962 වර්ෂයේදී පවත්වන ලද මහජන එක්සත් පෙරමුණේ අවසාන සම්මේලන වාරයේදී, වාමාංශිකයන් එක පෙරමුණකට එකතු කිරීමේ යෝජනාවක් සම්මත කර ගත්තා. දීර්ඝ සාකච්ඡාවකින් පසුව එක පෙරමුණක් සඳහා එක්වන ලෙස අනිකුත් වාමාංශික පක්ෂවලට ආරාධනය කිරීමට මහජන එක්සත් පෙරමුණේ සම්මේලනයේ කැමැත්ත ලැබුණා. මේ අළුත් වැඩ පිළිවෙළ අනුව ක්‍රියා කිරීම සඳහා ශක්තිමත් මධ්‍යම කාරක සභාවක් පත් කළ යුතුව තිබුණත්, මහජන එක්සත් පෙරමුණේ නායකත්වයෙන් ඒ සඳහා කටයුතු සිදු වුණේ නැහැ. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයාට (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) වුවමනා වී තිබුණේ තමුන්ගේ පන්දම්කාරයන් පිරිසක් මධ්‍යම කාරක සභාවට පත් කර ගැනී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

මටයි. ඒ අනුව පත්දමුන්ගෙන් යුත් මධ්‍යම කාරක සභාවක් පත් වුණා. ඒ නිසා තිස්සමහාරාමයේ ගරු මන්ත්‍රීතුමාටවත් මධ්‍යම කාරක සභාවට ඇතුළු වන්නට පුළුවන් වුණේ නැහැ. තිස්සමහාරාමයේ ගරු මන්ත්‍රීතුමා මධ්‍යම කාරක සභාවට පත් කිරීමට මා යෝජනා කළ විට මහජන එක්සත් පෙරමුණේ නායකත්වය ඊට විරුද්ධ වෙමින් කුසුමා ගුණවර්ධන මහත්මිය පත් කර ගැනීමට ක්‍රියා කළා. කුසුමා ගුණවර්ධන කියන්නේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයාගේ භාර්යාවයි. ඇය 11 අවුරුද්දක් පාර්ලිමේන්තුවේ සිටියලු. එහෙම නම් තිස්සමහරාමයේ ගරු මන්ත්‍රීතුමා 14 අවුරුද්දක් පාර්ලිමේන්තුවේ සිටියා නේදැයි මා ප්‍රශ්න කළා. එවිට අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා කීවේ, මහජන එක්සත් පෙරමුණේ මධ්‍යම කාරක සභාවේ තීරණ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී තිස්සමහාරාමයේ ගරු මන්ත්‍රීතුමාට දැනුම් දිය හැකි බවයි. තත්ත්වය එසේ නම්, මධ්‍යම කාරක සභාවේ තීරණ හැන්දෑවට තමන්ගේ ගෙදරදී තම භාර්යාවට දැන්විය හැකි නේදැයි ප්‍රශ්න කරන්නට මට සිදු වුණා. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයාගේ දුර්ජන ගති නිසා වමේ ව්‍යාපාරය පිරිහී ගියා. අවිස්සාවේල්ලේ පිලිප් වමේ ව්‍යාපාරය විනාශ කළා. මෙය වරක් දෙවරක් නොව හත් වතාවක්ම කර තිබෙනවා. ඔහු 1942 කේ සිටම මේ රටේ ගොවියන්ගේ හා කම්කරුවන්ගේ සටන කඩාකප්පල් කළා. ගොවියන් හා කම්කරුවන් එකතු කොට ප්‍රතිගාමී එක්සත් ජාතික පක්ෂයත්, බණ්ඩාගේ රජයත් නැති කළ හැකිව තිබුණත් මොහු නිසා ඊට ඉඩක් ලැබුණේ නැ. නායකකම්වලට කෑදර වීම නිසා වමේ සමගිය, කම්කරු සමගිය කැඩුවා. ඔහු බැලුවේ ගොවි කම්කරු විමුක්තිය නොව නායකත්වය තහවුරු කර ගැනීමයි. නමුත් වාමාංශික එක්සත් පෙරමුණ දැන් පක්ෂයක් වශයෙන් මේ රටේ ධනපති එක්සත් ජාතික පක්ෂය හා අනෙකුත් රදළ ධනපති කොටස් මේ රටින් ඉවත් කරන තුරුම ඉදිරියට යන බව මා මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. ගරු මුදල් ඇමතිතුමා ඇවිත් සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක්ක් කියන්න ඕනෑ. හතරවන ජාත්‍යන්තරයෙ මධ්‍යම කාරක සභාවට මාත් මුලින් ගියා. මෙතුමාලට එව්ව පණිවුඩය මේකයි:

"Pabloite attitude to LSSP Congress.

Below, the "Newsletter" prints a confidential letter sent by the Pabloite International Executive Committee from Paris to members of the Lanka Sama Samaja Party on May 25, 1964, which reiterates their proposal, echoed at the LSSP conference by their representative Pierre Frank, which calls for a United Left Front Government ...."

අපිත් ඉල්ලන්නෙ ඒකයි. එවැනි ආණ්ඩුවක් ඇති කිරීමටයි, අපි එම අගෝස්තු මාසේ 12 වෙනිදා නිදහස් චතුරශ්‍රයේදි ගිවිසුම ගැව්වෙ.

"....This line at the conference was defeated by 579 votes to 75.

The International Executive Committee of the Fourth International took up at its plenum meeting the key problems which you face at present and discussed them at some length. The discussion ended with unanimous endorsement of the letter sent to you by the United Secretariat April 23.

It is clear that throughout Asia, the equilibrium reached at the time of the Geneva agreement of 1954 has been broken and that in every country in this part of the world the class struggle is again sharpening. If the mass movement does not move boldly now, reaction will inevitably set in and the present opportunity will turn into its opposite.

In Ceylon, the SLFP government, acting as the agency of the bourgeoisie, is seeking through its proposals to disintegrate the United Left Front and to associate the LSSP with its bankrupt policies and further decline. The LSSP has reached a crucial moment in its history...."

ඇහෙනවද? මුදල් ඇමතිතුමා ගෙනුයි, මා ඇහුවෙ.

".... Let the SLFP government appeal to you in vain! The only real alternative is audacious action by the LSSP. It should serve as the central driving force in mobilizing the ULF, appealing to the masses to establish a United Left Front government on the basis of a genuinely socialist programme. This would prove highly attractive to elements that have been sucked into the SLFP because of its demagogy in the past, help reorient them and open up the possibility for a powerful bloc of the left organisation.

The International Executive Committee of the Fouth International sends you its warmest comradely greetings. It hopes

that the LSSP as a whole will remain faithful to its long tradition of uncompromising struggle against imperialism and national bourgeoisie, and that it will sucessfully resist the manoeuvres of the bourgeois government in order to open the road for genuine representatives of the masses to come to power.

No coalition at the expense of socialist principles and the possibility of a socialist victory !

Forward with the masses in struggle for a government of the United Left Front."

අපේ ගරු මුදල් ඇමතිතුමා නුපුරුදු ආකාරයට [බාධා කිරීමක්] මා අද කියන්නම්. එතුමා තමන්ට පුරුදු ආකාරයට පාවා දීමට ගියා. එතුමා 1935 අවුරුද්දෙ පටන් සිටියත්, වැඩ කළත් ඉදිරියට අඩිය තැබූ ආකාරය පැහැදිලි වශයෙන් කරුණකින් දෙකකින් මා ඔප්පු කරනව. එතුමා 1947 දී මෙම ගරු සභාවෙ විරුද්ධපාර්ශ්වයෙ නායකයා වශයෙන් සිටිය. ඒ නායකත්වය ලැබුණු අවස්ථාවෙදි පක්ෂයට නොකියා අක්කර 1,000 ක "ඔක්ෆිල්ඩ්" වත්ත ගත්ත. ඒ අවස්ථාවෙදි මුළු රටටත්, ජාත්‍යන්තරයටත්, වාමාංශික පක්ෂයටත් පහර වැදුණා. දිගට හරහට එක්සත් ජාතික පක්ෂය පහර ගන්න පටන් ගත්ත. එතුමා ඒක ගත්තෙ පක්ෂයට නොකියයි. මධ්‍යම කාරක සභාවෙ 1951 සාකච්ඡාවෙදී ඒක විකුණන්න තීන්දු කෙරුව. විකුණන්න කීවාම එතුමා කීවෙ මොකක්ද ? "මා පක්ෂයෙන් අස් වෙලා යන්නම් ; ගිහින් විකුණල එන්නම්." ඒකයි කීවෙ. ඒව ධනපති ප්‍රතිපත්ති. මට එතනදි වචනයක් කියන්න සිදු වුණා. "Get Out— " කියා මා කීව. මේ, ඉතිහාසයෙන් ටිකක්. ඔය ආකාරයටයි එතුම කටයුතු කළේ. අදත් මේව අමුත්තක් නොවෙයි, අපට. අදත් ධනපති කාර්මික ස්ථාන හිමි කර ගන්න බොහොම වෑයම් කරනව. උදේ රෑ දෙකේ කාර්මික ආයතන හිමි කර ගන්න යනව. අර පූගොඩ, ගිරිදර මෝල් ගෙනියනව, හවුල් එක්ක. ඒවගෙම උදේ පාන්දර "Economist" පත්තරේ ගන්නව. "Call of Nature" එකට යනකොට ගෙනියන්නෙ "Share-List" එකයි ; "Economist" එකයි. ඒක අපට අමුත්තක් නොවෙයි. එකට හිටපු අය ඒක දන්නව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතුමා "Share Market" එකේ "gambling" වලට බොහොම දක්ෂයි. එතකොට අර නියම ස්වරූපය අනුව ගමන් කරල තියෙන්නෙ ධනපති ආයතනය රැකීම පිණිසයි. දැන් ඉන්න තැන හරි. ඔතනින් ඔයිට වඩා දක්ෂිණාංශයට ගමන් කරනවට කිසිම සැකයක් නැහැ. පිටිපස්සෙන් සිටින දෙතුන් දෙනකු ඔකට අසු වී සිටීම ගැන මට කණගාටුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කරුණු ටික මම විශේෂයෙන් කියන්න ඕනැ. රාජාසන කථාව ගැනත්, විශේෂයෙන් මේ කළ පාවාදීම ගැනත් මම වචන ස්වල්පයක් ඉංග්‍රීසියෙන් කියන්න බලාපොරොත්තු වෙනව.

This year's Throne Speech claims to carry forward the victory of the common people and to strengthen the struggle against reactionaries. Far from realizing these two objectives what the ruling clique intends to do is to roll back the mounting tide of socialist solidarity and to get the pseudo-socialist newcomers to the Cabinet to help in the task of stabilizing the bastions of feudalist reaction.

The capitalist Government has now installed as its Minister of Finance an agent of capitalist reaction who has for three decades hoodwinked the common people of this country by masquerading in the guise of socialism. Among the stooges. sidekicks and understudies of the capitalist ruling clique is the undoubtedly able lawyer. Dr. Colvin R. de Silva, a man with consummate forensic skill in the use and abuse of language and logic to suit every kind of nefarious and opportunistic interests. Here is a man who, having amassed a fortune in the form of investments and bank balances, has the impudence and the audacity to tell the toiling masses that he is now ready to abandon his practice in the courts in order to serve their socialist cause.

I do not know whether the hon. Member for Dehiwala-Mt. Lavinia does he accept the word "honourable"?—has forgotten the days when once when I was in the party and wanted him to attend the Organizational Bureau Meetings at least on

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

Wednesday at 3.30 p.m., his remark to me, " Robert is going to kick me in the stomach. "

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (දෙහිවල-ගල්කිස්ස)
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா—தெஹிவலை-கல்கிசை)
(Dr. Colvin R. de Silva—Dehiwala-Mt. Lavina)

That is not true.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டி. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

It is in the minutes of the meeting of the Bureau. Although these are matters of the past, I must state these things as they are very necessary and relevant.

Who is the man who paved the way for the present political marriage of strange bedfellows who now have avowed to be the grave-diggers of the working people of the land ? He is no less a person than my own brother, Mr. Philip Gunawardena, the hon. Member for Avissawella. He played the part of a midwife at the birth of the reactionary power in 1956, and in his seasoned manner he has once again pioneered in his midwifery at the second birth of capitalist reaction.

After he was kicked out by his capitalist sponsors and thereafter rejected by his former working classes, this enemy of progress and unity of the working classes conspired to seize political power as a dictator, in which he failed objectly and totally. It is consequent on this failure to get to power through the backdoor that he determined to crawl on his belly and lick the feet of reactionary rulers in order to beg them to take him in the role of a servile errand-boy and running-dog of feudalist reaction.

The Throne Speech limits its concern only to South Vietnam in the matter of the violation of human rights. What about violation of fundamental human rights and the denial of natural justice to millions of people in many other parts of Asia, Africa and Latin America ? Is ti a matter for surprise that these running-dogs of imperialism have failed to utter a single word about or take notice of the anti-imperialist struggles of the peoples of Angola. South Africa and other heroic peoples?

For the same reason is it any wonder that these reactionaries have completely abandoned the insistent demand of the Ceylonese people to proclaim a Republic and to sever their ties with the Commonwealth ?

I have already warned the people of this country about the threat posed by the conspiracy to postpone the General Elections and to amend the Constitution in order that the ruling capitalists would be able to consolidate and entrench themselves in power against the true interests of the working classes of this country.

Finally, I wish to warn the reactionaries in power and to remind the common people of this country that we of the U. L. F. P. alone have consistently preserved and furthered the principles of Left Unity agreed to on August 12th, 1963, and that we alone preserve the continuity of the socialist struggle that was begun for the first time in this country over three decades ago.

මේ කරුණු ගැන මම විශේෂයෙන් මතක් කරන අතර නව කරුණු රාශියක් කියන්න තිබෙනව. මේ රාජාසන කථාවේ කම්කරු වන් ගැන යමක් කියා තිබෙන්නේ නිකම් වනල පමණයි. 1951 දී විට්ලි කවුන්සිල්ස් ඇති කළ ආකාරයට නේද තමුන්නාන්සෙල මේ කම්කරු මණ්ඩල ඇති කරන්න යන්නෙ ? කම්කරුවට කිසිම බලයක් නැතිව උපදෙස් දීම පිණිස විතරයි, ධනපති රජයට සහයෝගය දීම පිණිස විතරයි, එදා විට්ලි කවුන්සිල්ස් ඇති කළේ. මුදල් ඇමති තුමත් ඔහුගේ රජයේ ආයතනත් ඒ ආකාරයටම නේද ගෙන යන්න බලා පොරොත්තු වන්නෙ ? මට පුදුමයි, ඊයෙ පෙරේයිදා සාකච්ඡාවට ගිය අපේ කම්කරු වන්ට කියා තිබෙනව, අපි උපදෙස් දෙන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවස්ථාව පමණක් නොවේය, බලතලත් දෙනවය, කොන්ට්‍රෝල් බලතල දෙනවය, යුගෝස්ලේවියාවෙ බලතල දුන්නෙ අවුරුදු 12 කට පසුය, මේ පටන් ගැනීම පමණක්ය, කියා. එතකොට කම්කරුවෙක් ඇහුවලු, 12 අවුරුද්දක් ගියාමද අපට බලතල ලැබෙන්නෙ, කියා.

ඔය ආකාරයටයි, අද තමුන්නාන්සෙල අදහස් කරන කම්කරු සංවිධාන ඇති කරන්න යන්නෙ. කම්කරුවන් මුළා කරමින් එදා කම්කරු නායකයන් වශයෙන් සිට කම්කරුවාට ද්‍රෝහිකම් කර, අද මේ ආකාරයටයි කටයුතු කරන්න යන්නෙ. එදා ට්‍රේඩ් යුනියන් නායකයන් හැටියට හිටපු අය අද ළඟ ඉන්නව. එදා රුපියල් තුන් සියය හාර සියය අරගෙන අද රුපියල් දාහ දෙදහ ගසාගෙන කන නායකයො ඉන්නව. එදා කම්කරු පන්තියෙන්ම නැගිටල අද මේ ධනපති මුදල් ඇමතිගෙ උපදෙස් පිට එසේ කරනව. මේ කාරණය මේ රටේ කම්කරු පන්තිය කවදාවත් අමතක කරන්නෙ නැහැ. අවුරුදු විසි ගණනක් තිස්සෙ ගෙන ගිය ව්‍යාපාරය පාවා දුන් නායකයන් කොතන හිටියත්, ඔවුන්ගේ ආරක්ෂාවට කඩු තුවක්කු කෙළින් කර ගෙන, මැෂින් තුවක්කු කෙළින් කරගෙන හිටියත්, නියම පිළිතුරු දෙන අවස්ථාවේදී ඒ මැෂින් තුවක්කු සමග කම්කරු ජනතා වත් එකට ගමන් කරල ඔබතුමාලගෙ මේ රජය ඉවත් කරනවට කිසිම සැකයක් නැහැ.

ධනපති කොටස් සම්බන්ධව මේ රාජාසන කථාවේ කිසිම දෙයක් හරියට ප්‍රකාශ කරල නැහැ. ඒජන්සි හවුසස් කොන්ට්‍රෝල් කරනවලු. කොහොමද කොන්ට්‍රෝල් කරන්න යන්නෙ? තමුන් නාන්සෙගෙ ලන්ඩන් ෂෙයාර් මාර්කට් එකේ ගන්න ඒව විතරක් එහෙන් කොන්ට්‍රෝල් වේන්නද? මම දන්නව හොඳට ෂෙයාර් මාර්කට් එකේ කටයුතු කටයුතු කෙරෙන ආකාරය.

ජන රජයක් පිහිටුවීම ගැන කාලයක් තිස්සෙ කියා තිබෙනව. දැන් ඒකත් කියන්නෙ නැහැ. ඒක අමතක වෙලා තියෙන්නෙ මොකද? පොදු රාජ්‍ය මණ්ඩලය නැවත අස්වැද්දීම පිණිස ධනපති කොටස් සමග එකතු වුණු නිසා නේද මේ විධියට කටයුතු කරන්නෙ? මේ රටේ ජන රජයක් පිහිටුවීම පිණිස මෙතෙක් කල් ගත් පියවරවලට කළේ මොකක්ද? මේ වතාවෙ ඒ මූලික ප්‍රශ්නය ඉවත් කර තිබෙන්නෙ ඇයි? ඇයි ඒක කරන්නෙ නැත්තෙ? ඒ ගැන කෙලින්ම පිළිතුරු බලා පොරොත්තු වෙනව.

මේ රටේ වස්තුව උපදවන්න බලා පොරොත්තුවක් තියෙනවද? එවැනි බලා පොරොත්තුවක්, වුවමනාවක් තියෙනව නම් ලක්ෂ සංඛ්‍යාවක් දෙනා සූදානමින් ඉන්නව තම තමන්ගෙ ශ්‍රමය යොදා වස්තුව උපදවන්න. එයින් තමුන්නාන්සෙ නිසි ප්‍රයෝජන නොගන්නෙ මොන හේතු වක් නිසාද? තමුන්නාන්සෙ ෂෙයාර් මාර්කට් එකෙන්ද වස්තුව උපදවන්න කල්පනා කරගෙන ඉන්නෙ? ශ්‍රමය යෙදීම ගැන එකම වචනයක්වත් නැත්තෙ මොන කාරණයක් නිසාද? ශ්‍රමය නැතිව වස්තුව උපදවන්න බැරි බව ගරු මුදල් ඇමති තුමාගෙ මොළයට වැටෙන විධියට කියා දෙන්න ලෙස්කිට පුළුවන්කමක් තිබුණේ නැද්ද? ඒ කතාවට විරුද්ධයි අද. ධනපති යන්ට අස්වැද්දීම පිණිසයි දැන් වැඩ කර ගෙන යන්නෙ. ඔවුන්ගෙ වැඩට ආධාර කළ බව දැන් අපට පැහැදිලියි. මේ රටේ දියුණුව සඳහා දේශීය ආදායම් වැඩි දියුණු කරන්න දේශීය ජනතාව නිතරම ලැස්තියි. තමන්ගෙ ශ්‍රමය ඒ සඳහා වැය කරන්නත් ලැස්තියි. ඒ සඳහා ගරු මුදල් ඇමතිතුමා ක්‍රියා කරන්න ඕනෑ. මොනවද කරන්න යන්නෙ? අද පැය අටක් වැඩ කර ශ්‍රමය වැය කරනව. හෙටත් ඒ විධියට පැය අටක් ශ්‍රමය වැය කරන්න බලාපොරොත්තු වෙනව. කොහොමද ඒක කරන්නෙ? පෝෂ්‍යදායක ආහාර වුවමනා කරනව ඒකට. ඒක නැතුව දිගටම වැඩ කරගෙන යන්න බැරි බව තමුන්නාන්සෙ දන්නව නේද? ඉතින් ඒ සඳහා වැඩ පිළිවෙළක් රාජාසන කථාවේ එක වචනෙකින්වත් මතක් කරන්න බැරි වුණාද? ජනතාවගේ ශ්‍රම ශක්තිය තව දුරටත් වැඩි කර ශක්ති මත් කිරීමට එක වචනෙකින්වත් ආධාර කරන්න මේ ධනපති ආණ්ඩුවෙ ඉන්න එකම එක මැති ඇමතිවරයෙකුටවත් බැරි වුණාද? මේ සම්බන්ධයෙන් අම්මට උප දෙස් දෙන්න කවුරු වත් ඉදිරිපත් වුණේ නැත්තෙ ඇයි?


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

කම්කරුවන් ගැනයි ඔය මතක් කළේ. ගොවි ජනයා ගැනත් යමක් කියන්න ඕනෑ. ඉඩම් ලබාගෙන වැඩ කරන්න ආශාවෙන් ඉන්නව ලක්ෂ ගණන් ගොවියෝ. ඒක තමුන්නාන්සෙල දන්නව හොඳට. දැන ගත්තට විතරක් මදි; වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. මේවා හංගලාද වැඩ කරන්න යන්නෙ? අපි දන්නව. තමුන්නාන්සේලත් දන්නව. විශේෂයෙන්ම දෙහිවල-ගල්කිස්ස ආසනේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) මේවා හොඳට දන්නව. පන්ති සටන එන විට ඉදිරි කාලෙදි තමුන්නාන්සෙ ඒ පැත්තෙද මේ පැත්තෙද ඉන්න බලාපොරොත්තුව? ගරු මුදල් ඇමතිතුමා නම් එන්නෙ නැහැ. ඒක මා දන්නව. මේ පැත්තෙන් තව එක් කෙනෙක් ඉන්නව. කවුද ඒ? දකුණු කොළඹ දෙවැනි මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) උන්නැහෙ එදාට කොතන ඉදීවිද දන්නෙ නැහැ. මොකක්ද මේ කරගෙන යන්නෙ? ඒක අපි දන්නව. මේකත් මේ දේශපාලන පක්ෂ උපායයක් තමයි. සියේට එකක් විතර හරි යාවි. නැති වුණාම නවතින්නෙ කොතනද? ඒකට මධ්‍යස්ථානයක් වුවමනා කරනව. මේ ගමන තව දුරටත් ඉදිරියට ගෙන යන්න මධ්‍යස්ථානයක් ඕනෑ. නැති වුණොත් අතරමං වෙනව. අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) කොයි පැත්තටත් කුරුමානම් අල්ලනව. කුරුමානම හරි ගියොත් යන්නත් පුළුවනි. කුරුමානම් අල්ලගෙන යන්න හදනව. මගෙ හිතේ කොයි වෙලාවක හෝ හරි යාවි කියන එකයි. අකුරැස්සෙ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) නම් තවම ඉන්නෙ එතනමයි. ඒ වුණාට මොකද අවිස්සාවේල්ලෙ මන්ත්‍රීවරයත් උන්නැහෙලත් ඔක්කොම එක පැත්තෙ ඉන්න ක්ලාස් කොලැබරේටර්ස්ලා තමයි. කොයි හැටි වුණත් මම නම් ඉතින් අර පරණ මිනිහමයි. මම තනියමවත් මේ සටන ගෙන යනවමයි. තනියමවත් ඉදල මම වෙඩි කන්නම්. මේ හවුල් ආණ්ඩුව ආවා විතරයි, මොකද වුණේ? පෙරේදා ආවා මිනිත්තු විස්සෙ නීතිය දාන්න. මීට පස්සෙ මේ ගරු සභාවෙ කථා කරන්න දෙන්න යන්නෙ මිනිත්තු විස්සලු එක් කෙනාට. හොඳයි නේද? මීට ඉස්සරවෙලා මේ විධියෙ මුකවාඩම් බැන්දෙ නැහැ. මුකවාඩම් බැඳීම පිණිස දැන් තමුන්නාන්සේලා, "මගේ ආණ්ඩුව මින් ඉදිරියට මින් මත්තට දෙන්නෙ මිනිත්තු විස්සයි" කියන්නයි හදන්නෙ. පෙරේදා ගරු කථානායකතුමාගේ කාමරේදී ගරු මුදල් ඇමතිතුමා ඒ විධියට කියාගෙන ආවා. හෙට අනිද්දා පත්තරෙත් නැහැ. ඒ නිසා මම කෙලින්ම කියන්නම්. ධනපති රදළ පක්ෂයෙ ආණ්ඩුවකට පත්තර පාලනය භාර දෙන්න බැහැ. ඒක වැඩ කරන ජනතාවගෙ සංවිධානයකට භාර දෙන්න ඕනෑ. මේ ගරු සභාවෙ කථාවලුත් මිනිත්තු විස්සෙන් ඉවර කරන්න ලැස්ති වුණා නම් තව ටිකක් කල් ගත වන විට ගන්න යන දේවල ස්වරූපය පැහැදිලිවම කියන්න පුළුවනි. මම එකක් කියන්නම්. මේ කොට්ටාවෙ මන්ත්‍රී ඉන්න කල් නම් තමුන්නාන්සෙලට කවදාවත් මිනිත්තු විස්සෙන් කතාවක් නවත්තන්න ලැබෙන්නෙ නැහැ. මිනිත්තු විස්සෙන් මම යන්නෙ නැහැ. ඕනෑ නම් හිර ගෙදර යන්න පුළුවනි. තමුන්නාන්සේ විටින් විට මා මේ ගරු සභාවෙන් එළියට පන්නන්නෙ නැත්නම් මට තවත් එක් අවුරුද්දක් මෙතන ඉන්න පුළුවන් වේවි. මේ මිනිහා සිටින තුරු නම්, මෙතනින් ඔසවා වරින් වර එළියට දමමින් මිස තමුන්නාන්සේලාට මිනිත්තු 20 ට කථා සීමා කර කටයුතු කර ගෙන යන්න බැහැ. එසේ කරන්න නම් මාව නැති කරන්න වේවි. නැති කළොත් නම් වඩා හොඳයි. එතකොට ජනතාව තමුන්නාන්සේලාට විරුද්ධව නැගී සිටීවි. වාමාංශික සමගි බලය කැඩීමට මූලිකයාව හත් වතාවක්ම කටයුතු කළේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමායි. ගරු මුදල් ඇමතිතුමා දෙවතාවක් කෑවා. පක්ෂය වාමාංශික එක්සත් පෙරමුණ වශයෙන් ගමන් කරන විටයි ඔය පංති ද්‍රෝහියා ඔය නැන ගත්තේ.

Share markets, estates, big factories—those were the things he was associated with whilst in the socialist movement. So, he cannot leave them behind. He has enjoyed the happiness that he managed to accrue from most of these ventures in the past, both in the factory and outside the factory and with even the factory owners.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I do not want to prolong my speech although there are many more points which I want to comment on. But I must say that the U. L. F. cause will be carried on with the help of the working class and the peasants and those other elements who are ready to carry the struggle forward to a victorious conclusion. You all accept that position but you feel that there are other forces. Certainly there are other forces—national forces—which I have not given up. I say that the national forces must be there. That was why I stated, in opening my speech, that Marxism and governmental regulations—

මේ සියලුදේම බුද්ධ නීතිය අනුවද? බුද්ධ නීතිය කියන්නේ නීතියක්. සමාජයේ හැසිරීමට තිබෙන නීතියක්. එය මෙතෙන්ට හොරා මෙතනින් කරන්න බැහැ. අවංකභාවය මුල්කර ගෙන ඒ බෞද්ධ නීතිය අනුව, මාර්ක්ස් ධර්මය අනුව, මේ රටේ රාජ නීති සකස්කර මේ රටේ ජනතාවට විමුක්තිය ඇති කර දෙන්න ඕනෑ.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී. එතැන් සිට විවාදය 1964 ජුලි 14 වැනි අඟහරුවාදා පවත්වනු ලැබේ.**

## කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7 ට, අද දින සභාසම්මතිය අනුව, 1964 ජුලි 14 වන අඟහරුවාදා පූ. භා. 10 වනතෙක් කල් ගියේ ය.**

*சபையினது இன்றைய தீர்மானத்துக் கிணங்க பி. ப. 7 மணிக்கு, 1964, ஜூலை 14 ஆம் தேதி செவ்வாய்க்கிழமை மு. ப. 10 மணிவரை சபை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned accordingly at 7 p.m. until 10 a.m. on Tuesday, July 14, 1964, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## 1964 ජූලි 14 වන අඟහරුවාදා

---

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය. කථානායකතුමා [ගරු හියු ප්‍රනාන්දු] මූලාසනාරූඪ විය.

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்*

PAPERS PRESENTED

1963-64 අංක 11 දරණ පරිපූරක ඇස්තමේන්තුව මම ඉදිරිපත් කරමි.—[ගරු චම්ලි ගුණවර්ධන.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

1962 වර්ෂය සඳහා රබර් නැවත වගා කිරීමේ ආධාර අරමුදලේ පරීක්ෂා කරන ලද ගණන් මම ඉදිරිපත් කරමි.—[ගරු ටී. බී. ඉලංගරත්න.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

(454 වැනි පරිච්ඡේදය වන) රජයේ ඉඩම් ආඥා පනතේ 95 සහ 96 යන වගන්ති යටතේ සම්පාදිත රෙගුලාසියක් මම ඉදිරිපත් කරමි.—[ගරු සී. පී. ද සිල්වා.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 36 සහ 52 යන වගන්ති යටතේ පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් සම්පාදනය කරන ලද ව්‍යවස්ථා දෙකක් මම ඉදිරිපත් කරමි.—[විවියන් ගුණවර්ධන මිය.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்*

BILLS PRESENTED

### CEYLON SHIPPING CORPORATION BILL

"to provide for the establishment of a Shipping Corporation to operate services for the transport of goods and passengers by sea and to carry on business as ship-owners, charterers of ships and vessels and operators of ships and vessels; to regulate the powers and duties of such Corporation; and to make provision for purposes connected with the aforesaid matters".

**පිළිගන්වන ලද්දේ අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති ගරු ටී. බී. ඉලංගරත්න විසිනි. 1964 ජූලි 15 වන බදාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.**

### REGISTRATION OF BUSINESS NAMES BILL

"to provide for the registration of certain business names and the persons carrying on businesses under such business names, for the prohibition of the carrying on of any business in certain areas, for the repeal of the Business Names Ordinance, and for purposes connected therewith or incidental thereto".

**පිළිගන්වන ලද්දේ අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති ගරු ටී. බී. ඉලංගරත්න විසිනි. 1964 ජූලි 15 වන බදාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.**

### COMPANIES (AMENDMENT) BILL

"to amend the Companies Ordinance".

**පිළිගන්වන ලද්දේ අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති ගරු ටී. බී. ඉලංගරත්න විසිනි. 1964 ජූලි 15 වන බදාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.**

### TEA PROPAGANDA (AMENDMENT) BILL

"to amend the Tea Propaganda Ordinance".

**පිළිගන්වන ලද්දේ අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති ගරු ටී. බී. ඉලංගරත්න විසිනි. 1964 ජූලි 15 වන බදාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.**

**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා. (මූතූර් පළමුවන)**

*(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)*

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

*கௌரவ சபாநாயகர் அவர்களே, இப்பொழுது கௌரவ அமைச்சர் அவர்கள் நான்கு மசோதாக்களை இங்கே சமர்ப்பித்தார்கள். அவை மிகவும் முக்கியமான மசோதாக்கள். ஆனபடியால் அவை தமிழிலும் இருக்கவேண்டும். சில தினங்களுக்கு முன்பு கௌரவ நல்லூர்ப் பிரதிநிதி (வைத்தியகலாநிதி ஈ. எம். வீ. நாகநாதன் அவர்கள்) இப்பிரச்சினையைக் கிளப்பியபோது இவற்றைத்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தமிழிலும் இனிமேல் சமர்ப்பிப்பதாக இங்கே கூறப்பட்டது. ஆனால், இன்றுவரை இதுவிஷயத்தில் நடவடிக்கை யெதுவும் எடுக்கப்படவில்லை. இத்தகைய அநீதமான செயல்களுக்கு எனது சார்பாகவும் எனது கட்சி சார்பாகவும் பலத்த ஆட்சேபனையைத் தெரிவித்துக் கொள்ளுகிறேன்.

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

சபை அமர்வு

### SITTING OF THE HOUSE

**මතු පළවන යෝජනාව සභාසම්මත විය :**

"අද දින විසිර යෑමේදී මන්ත්‍රී මණ්ඩලය 1964 ජූලි 15 වන බදාදා පූ. භා. 10 වන තෙක් කල් තැබිය යුතුය.—[ගරු සී. පී. ද සිල්වා.]

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

"අංක 8 දරණ ස්ථාවර නියෝගයේ කුමක් සඳහන් වී තිබුණද, 1964 ජූලි මස 15 වැනි බදාදා මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම පූ. භා. 10 සිට දවල් 12 දක්වාද ; අ. භා. 2 සිට අ. භා. 4 දක්වාද ; අ. භා. 4.30 සිට අ. භා. 9.30 දක්වාද විය යුතුය ; තවද (අ) අ. භා. 9ට අංක 8 දරණ ස්ථාවර නියෝගයේ (5) සහ (6) වන ඡේද ක්‍රියාත්මක විය යුතුය ; (ආ) කථානායකතුමා අ. භා. 9.30ට ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම කල් තැබිය යුතුය"යි මම යෝජනා කරනවා.

අද සවස කල් තැබීමේ යෝජනාව යටතේ පැයබාගයක් දෙන ලෙස වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) ඉල්ලා තිබෙනවා. ඊයේ යෝජනාවට එය ඇතුළත් නොවුවත් පැය බාගයක් දීම ගැන මගේ විරුද්ධත්වයක් නැහැ.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)

*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*

(Mr. K. M. P. Rajaratna—Welimada)

ඊයේ ප්‍රමාද දෝසයකින් ප්‍රශ්න ඇසීම සඳහා පැය බාගයක් දිය යුතුයයි මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීමේ යෝජනාවට ඇතුළත් කර නැහැ. ගරු සභානායකතුමා ඊට විරුද්ධ නැති නිසා ඔබතුමා අද සවස පැය බාගයක් ප්‍රශ්න ඇසීම සඳහා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சீ. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

මම එකඟ යි.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක** (ගාල්ල)

*(கலாநிதி டப்ளியு. தகனாயக்க—காலி)*

(Dr. W. Dahanayake—Galle)

Sir, you will notice that is proposed when we meet tomorrow to stop at 9.30 p.m. You are aware, on the last day of the Debate there is so much of pressure from various Members and Party Leaders for more time, and there is a tremendous amount of dissatisfaction arising out of the time limitation. I suggest that you take the voting at 11 p.m., and that this Motion be amended accordingly.

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

I think it was agreed unanimously at the meeting of Party Leaders that the vote be taken at 9 o'clock.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*

(Dr. W. Dahanayake)

I was not present at that meeting.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [පස්වන දිනය]

## மகா தேசாதிபதியினது பேச்சு நன்றியுரை மீதான விவாதம் [ஐந்தாம் நாள்]

## GOVERNOR-GENERAL'S SPEECH DEBATE ON THE ADDRESS [FIFTH DAY]

**සංශෝධන [ජූලි 13] පිළිබඳ විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ජූලි 2]—**

'අතිගරු අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පවත්වන ලද කථාවට පිළිතුරු වශයෙන් මෙම මන්ත්‍රී මණ්ඩලය විසින් පහත දැක්වෙන ස්තුති යෝජනාව ඉදිරිපත් කළ යුතුය:

"අතිගරු උතුමාණනි,

පාර්ලිමේන්තුව විවෘත කිරීමේදී ඔබතුමාණන් විසින් පවත්වන්නට යෙදුණු කථාව වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෝ වන අපි ඔබතුමාණන්ට ස්තුති කරමු. අප වෙත ඉදිරිපත් කරන ලද සියලුම කරුණුවලට අපගේ අවධානය යොමු කරන බව අපි ඔබතුමාට ස්ථිර ලෙස ප්‍රකාශ කරමු."'—[ලක්ෂ්මන් ජයකොඩි මයා.]

**යෝජිත සංශෝධන, ස්තුති යෝජනාව අගට එකතු කිරීමට:**

I "එහෙත්,

රැකීරක්ෂා හිඟය, ශීඝ්‍රයෙන් ඉහළ නගින ජීවන වියදම, අධ්‍යාපනික, වෛද්‍ය හා නිවාස පහසුකම් මදිකම, අල්ලස් ගැනීම හා දූෂණය යනාදී ජනතාවගේ ප්‍රධාන ප්‍රශ්න, 1956 සිට පැවැති ආණ්ඩු යටතේ වඩාත් උග්‍ර වී තිබෙන හෙයින් ද, තමන්ගේ ජීවන තත්ත්වය පිරිහීමේ හේතුවෙන් ජනතාවට මුහුණ පාන්නට සිදුවී ඇති දුක් කරදර තුනීකර ලීම සඳහා වැඩදායක විධිවිධාන රාජාසන කථාවේ ඇතුළත් නොවන හෙයින් ද අපගේ කණගාටුව ප්‍රකාශ කරමු."—[ජේ. ආර්. ජයවර්ධන මයා.]

II "එතකුදු වුවත්, උතුමාණන් වහන්සේගේ කථාවෙන්,

(අ) ලංකාව ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම සඳහා කිසිදු යෝජනාවක් ඉදිරිපත් නො කිරීම;

(ආ) වත්මාන රැකීරක්ෂා රහිත භාවය හා ආර්ථික අකර්මන්‍යතාව නැතිකර දැමීමට අත්‍යවශ්‍ය වූ රටේ ස්වාභාවික ධන නිධානයන් හා මිනිස් බලය පිළිබඳ සම්පූර්ණ සංවර්ධනයට අදාළවන, ආර්ථික දියුණුව සඳහා කිසිදු යෝජනාවක් ජනතාව ඉදිරියේ තැබීමට අපොහොසත් වීම;

(ඇ) විදේශීන් සතු බැංකු හා "ඒජන්සි" සමාගම් ජනසතු කිරීම සඳහා වැඩ පිළිවෙළක් රට ඉදිරියේ තැබීමට අපොහොසත් වීම;

(ඈ) ඉකුත් වර්‍ෂ 400 තුළත් ඔබතුමාණන්ගේ ආණ්ඩුව යටතේ දැනටත් රටේ වැඩි ජනතාවගේ ආගම වන බුද්ධාගම මුහුණ පා සිටින දුෂ්කරතාවයන් ඉවත් කර දැමීමට කතෝලික දේශපාලන ආක්‍රමණය ගැන සෝදිසි කිරීම සඳහා කිසිදු බලාපොරොත්තුවක් ඇති බව බෞද්ධ ජනතාව හමුවේ සහතික කිරීමට අපොහොසත් වීම;

(ඉ) බෞද්ධාගමට සහ අනිකුත් සෑම ආගම්වලටම හිමි ස්ථානය ලබාදීම සහතික කිරීම සඳහා වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 වන වගන්තියේ නොපැහැදිලි, වියවුල් සහගත තත්ත්වය සංශෝධනය කිරීම සඳහා අත්‍යාවශ්‍ය වූ ද, ක්‍රියාත්මක වූ ද, නිශ්චිත වූ ද, යෝජනා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම;

(ඊ) රටේ විදේශීය ප්‍රතිපත්තිය පැහැදිලිව අව්‍යාකූලව ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම, ඇතැම් රටවල බලාපොරොත්තු ඉටු කරන්නාක් සෙයින් නොබැඳුණු "විදේශ" ප්‍රතිපත්තිය යනු කුමක්දැයි පැහැදිලි කර නැති අතර ඒ වටා අවිනිශ්චිත ස්වභාවයක් පවතිද්දී ඔබතුමාණන්ගේ ආණ්ඩුව නොබැඳුණු විදේශ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් නැති ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීම; රටවල් බොහෝ ගණනක් සමග තානාපති හා වෙළඳ සම්බන්ධකම් ඇතිකර ගැනීම සතුටින් පිළිගන්නා අතර කැනඩාව සහ අළුතින් නිදහස ලබාගත් කීනියාව, ටැංගනිකාව හා උගන්ඩාව යන රටවල් සමග පූර්ණ තානාපති සම්බන්ධකම් ඇති කර ගැනීමට ඔබතුමන්ගේ ආණ්ඩුව අපොහොසත් වීම, නිසා උතුමාණන් වහන්සේගේ කථාව ගැන අපගේ අප්‍රසාදය කළකර සිටිමු."—[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

III "එහෙත්,

(අ) සිංහල පමණක් හා දෙමළ සමග යනුවෙන් සඳහන් කිරීම අර්ථානුකූලව හා දේශපාලන වශයෙන් විකාරයක් වන හෙයින්, 1956 අංක 33 දරන සිංහල පමණක් පනත ලංකා ආණ්ඩුව ක්‍රම පනතට ඇතුළත් කිරීමෙන්, සිංහල පමණක් ලංකාවේ රාජ්‍ය භාෂාව කිරීමේ නීතිය ලංකාවේ මූලික නීතියක් කිරීමටද,

(ආ) "බුද්ධ ශාසනය සම්පූර්ණයෙන්ම ආරක්ෂා කළ යුතු අතර, බෞද්ධ වත් පිළිවෙත්, මහ සංඝයා වහන්ස හා විහාරස්ථානවලට ආධාර කළ යුතු අතර රැක බලාගත යුතුයි" යනුවෙන් සඳහන් 1815 උඩරට ගිවිසුමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

5 වෙනි වගන්තිය, ලංකා ආණ්ඩුක්‍රම පනතේ 29 වෙනි වගන්තිය සංශෝධනය කර, ඇතුළත් කිරීමටද,

(ඈ) සතර පෝය රජයේ නිවාඩු දින කිරීමටද,

(ඇ) වෙළඳාම් කිරීම, කර්මාන්ත පිහිටුවීම, ඉඩම් අයිතිය හා රැකීරක්ෂා අයිතිය ලක් පුර වැසියන්ට පමණක් සහතික කිරීමටද, නොපමාව නීති සම්පාදනය කරන ලෙස අපි ඔබතුමාගේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටින අතර, මෙරට සමාජයේ පිළිකාවක් ලෙස පැවැත්වෙන ඉන්දියානු ප්‍රශ්නය විසඳීම පිණිස, පහත සඳහන් පියවර වහාම ගත යුතුයයි ඉල්ලා සිටිමු :—

(i) නොමිලයේ දෙන සෞඛ්‍ය හා අධ්‍යාපනික පහසුකම් හා සහල් සලාකය ඉන්දියානුවන්ට දීම නතර කිරීම,

(ii) ඉන්දියානුවන්ට, වෘත්තිය සමිතිවලට ඇතුල්වීමට හෝ වෘත්තිය සමිති පිහිටුවීමට හෝ ඉඩ නොදීම,

(iii) හැම තරාතිරමකම තිබෙන රැකියාවල් වලට ලක් පුරවැසියන් පමණක් බඳවා ගන්නා ලෙස බල කිරීම,

(iv) ඉන්දියානුවන්ට, වෙළඳාම කිරීම හෝ කර්මාන්ත පිහිටුවීම හෝ ඉඩම් අයිතිකර ගැනීම හෝ තහනම් කිරීම,

(v) සෑම ඉන්දියානුවෙක්ම නොපමාව ඉන්දියාවට යැවීම පිණිස අවශ්‍ය වැඩ කටයුතු යෙදීම."—[කුසුමා රාජරත්න මිය.]

IV "එතෙකුදු වුවත්,

(අ) ලංකාවේ දේශපාලන තත්ත්වය අනුව, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයෙන් ලංකාව නිදහස් කර ගැනීමේ අභිප්‍රායයක් වත් ප්‍රකාශ කරනු වෙනුවට පොදු රාජ්‍ය මණ්ඩලය සමග ලංකාවේ සම්බන්ධකම් ආරක්ෂා කර ගැනීම පිළිබඳව ඔබතුමාගේ ආණ්ඩුවේ අභිලාශය ප්‍රකාශ කිරීම නිසා ලංකාව තුළ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට ඔබතුමාගේ ආණ්ඩුවේ යටහත්කම ඔබතුමාගේ ආණ්ඩුව ශෝචනීය ලෙස සහතික කර ඇති හෙයින් ද ;

(ආ) අරමුණු වශයෙන් ඔබතුමාගේ ආණ්ඩුව සමාජවාදී බව ප්‍රකාශ කරතත්, මේ රටේ වැවිලි, වාණිජ හා කර්මාන්ත තුළ ධනෝපාර්ජනයෙහි නියුක්ත ධනපති සම්බන්ධතාවලට එරෙහිව පියවර ගැනීමේ කිසිම අභිප්‍රායයක් ඔබතුමාගේ ආණ්ඩුව දක්වා නැති හෙයින් ද ;

(ඉ) වාණිජ විෂයයෙහි, අපනයන ව්‍යාපාරය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් සහ ලාංකික ධනපතීන් අත පවතින්නට ඉඩ හැරීම ඔබතුමාගේ ආණ්ඩුවේ අදහස බව පැහැදිලි ලෙස එළිදරව් කර ඇති හෙයින් ද ;

(ඊ) අත්‍යවශ්‍ය භාණ්ඩ මෙරටට ගෙන්වීමේ ව්‍යාපාරය රජයට ගැනීමට අදහස් කරන බවක් අඟවන්නට වැයම් කරන අතර, ඇත්ත වශයෙන්ම, කරන්නේ ලාංකික කිරීමේ මුවාවෙන් ලාංකික ධනපතීන් සමග එක්වී විදේශීය ධනපතීන්ට ලංකාවේ කටයුතු කරගෙන යාමට ඉඩ ලැබෙන පරිදි ආනයන ව්‍යාපාරයේ වැඩි කොටස ධනපති පංතියත්, අධිරාජ්‍යවාදීනුත් වෙත පවතින්නට ඉඩ හැරීමට ඔබතුමාගේ ආණ්ඩුව තීරණය කිරීම වන බැවින් මෙසේ කිරීම ලාංකික ධනපතීන් සමග එකතු වී ඔවුනට මුවා වී මේ රටේ ව්‍යාපාර ගෙන යාමට විදේශීය ධනපතීන්ට ඉඩ සැලසෙන හෙයින් ද ;

(උ) විදේශීය ආයෝජකයින් විසින් ලාභාංශ සහ ප්‍රාග්ධන මින් ඉදිරියටත් පිටරට යැවීම නතර කිරීම සඳහා කිසිම පැහැදිලි පියවරක් නොගන්නා හෙයින් ද ;

තවද, වේතන ලබන්නන්ගේත්, වෘත්තිය සංගම් ව්‍යාපාරයේත්, පොදුවේ ජනතාවගේත් උග්‍ර ප්‍රශ්න සම්බන්ධයෙන්—

(අ) ධනපති වෙළඳ සමාගම් සහ පුද්ගලයන් යටතේ සේවය කරන වේතන ලබන්නන් සහ වැටුප් ලබන්නන් විසි ලක්ෂයක් දෙනා, දැනට මුහුණපාමින් සිටින පළි ගැනීම, සේවක සංඛ්‍යාව අඩු කිරීම පිණිස සේවකයන් අස්කිරීම සහ වෙනත් ක්‍රමවල සූරාකෑම් හා විවිධාකාර තාඩන පීඩනවලින් ආරක්ෂා කරන බවට සහතික කිරීමේ ක්‍රියා මාර්ග කිසිවක් ගැන සඳහනක් ඔබතුමාගේ ආණ්ඩුව විසින් කර නැති හෙයින් ද ;

(ආ) ඔබතුමාගේ ආණ්ඩුව ඊනියා ජාතික ශුභ සිද්ධියේ නාමයෙන් වඩ වඩා වැඩත් දැඩි විනයත් වැටුප් ලබන්නන්ගෙන් ඉල්ලා සිටින අතර රාජ්‍යාංශයේත් පෞද්ගලික අංශයේත් යන දෙතැන්හිම වැටුප් ඇවිරීමේ ප්‍රතිපත්තිය අත්හැර දමන බව කිසි සේත් සඳහන් කර නැති හෙයින් ද ;

(ඉ) රජයේ ව්‍යාපාරවලත් රජය විසින් පාලනය කරනු ලබන ව්‍යාපාරවලත් නිලධාරි පැලැන්තියේ අනිසි පාලනය, දූෂණය, නාස්තිය, අකාර්යක්ෂමතාව, නෑදැයින්ට පක්ෂපාතකම් දැක්වීම හා එම ව්‍යාපාරවල සේවකයන් සූරාකෑම නවත්වාලීමට ඇති එකම මග වශයෙන් මෙකී ව්‍යාපාර කම්කරුවන් මඟින් පාලනය විය යුතුයයි බොහෝ කාලයක සිට පවත්වන්නාවූත්, ක්‍රමයෙන් දැඩිවන්නාවූත් ඉල්ලීමක් තිබියදීත්, දැනට පවත්නා පාලනයට සහාය දීම සඳහා උපදේශක සභා පිහිටුවීමට පමණක් ඔබතුමාගේ ආණ්ඩුව බලාපොරොත්තු වන හෙයින් ද ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඊ) රජයේ පරිපාලන විෂයයටත් පාලන විෂයයටත් වැඩ කරන පංතිය ඈතුළත් කර ගන්නා බවට හැඟීමක් ඇති කිරීමට වෑයම් කරන අතරම සංවිධානය වූ වෘත්තීය සංගම් ව්‍යාපාරය ගැනත් වෘත්තීය සංගම් ඒකාබද්ධ කාරක සභාව ගැනත් ඔබතුමාගේ ආණ්ඩුව කිසිවක් සඳහන් කර නැති හෙයින් ද;

(උ) රජයේ සේවකයන්ගේත්, රජයේ සංයුක්ත මණ්ඩලවල සේවකයන්ගේත්, රජයේ පාසල්වල ගුරුවරුන්ගේත් දේශපාලන අයිතිවාසිකම් පිළිගැනීමටත්, එම අයිතිවාසිකම් ලබා දීමටත් ඔබතුමාගේ ආණ්ඩුව අපොහොසත් වී ඇති හෙයින් ද;

(ඌ) උග්‍ර ලෙසත් පෘථුල ලෙසත් පැතිර පවත්නා රැකී රක්ෂා විරහිතභාවය පිළිබඳ ප්‍රශ්නය ගැන කිසිසේත්ම සඳහන් කර නැති හෙයින් ද, විශෙෂයෙන්ම, රටේ උගත් තරුණ පෙළේ සහජ දක්ෂතාවන් රටේ සංවර්ධනය සඳහා නිසි ලෙස යෙදවීමේ මාර්ග සැලැස්වීමට ඔබ තුමාගේ ආණ්ඩුව අපොහොසත් වී ඇති හෙයින් ද;

(එ) ඉඩම් නැතිකම පිළිබඳ බරපතල ප්‍රශ්නය ගැනත්, ඉඩම් නොමැත්තවුන්ට කඩිනමින් රජයේ ඉඩම් දීම සඳහා ගතානුගතිකත්වයෙන් තොර, ප්‍රගතිශීලී, නොමසුරු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් හෝ පෞද්ගලික ඉඩම් අනිවාර්යයෙන්ම අත් කර ගනිමින් ගම් පුළුල් කිරීමේ ප්‍රබල ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් හෝ ඉඩම් නොමැත්තවුන්ට ඉඩම් ලබා දීමේ අවශ්‍යතාව ගැනත් ඔබතුමාගේ ආණ්ඩුව කිසිසේත්ම සඳහන් කර නැති හෙයින් ද;

(ඒ) ඔබතුමාගේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන බව කියා සිටිතත්, වැඩ වර්ජන කඩාකප්පල් කර දැමීමටත් වෙනුත් අන්දමින් මහජනයාට පහර දීමටත් පොලීසියට සහ යුද හමුදාවට බල තල පවරා දෙමින් වරින්වර ජනතාවගේ නිදහස සහ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහිමි කිරීම සඳහා පාවිච්චි කර ගෙන ආ මහජනාරක්ෂක පනත අවලංගු කරන බව සඳහන් කර නැති හෙයින් ද;

තවද සුළු ජාතීන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන්—

(අ) දෙමළ භාෂාවත් රාජ්‍ය භාෂාවක් කිරීමට නීතියෙන් විධිවිධාන යෙදීමෙන් දෙමළ භාෂාව කථා කරන සුළු ජාතිකයින්ට භාෂා අයිතිවාසිකම් ලබා දෙන බවට කිසිම සඳහනක් කිරීමට ඔබතුමාගේ ආණ්ඩුව අපොහොසත් වී ඇති හෙයින් ද;

(ආ) මේ රටේ වැඩ කරන ජනතාවගේ ව්‍යාපාරය විනාශ කරන ගුප්ත අදහසින්, එසේම වැඩ කරන පංතිය භේද භින්න කර ජනතාව තුළ ජාතිවාදී ඝට්ටන ඇති කිරීමටත්, ලාංකික ධනපති පංතියේ යහපත පිණිස ඩී. එස්. සේනානායක මහතා විසින් නීති පුස්ථකයට එක් කරන ලද අපකීර්තියට පාත්‍ර වූත්, හිංසාකාරීවූත්, පුරවැසි පනත අවලංගු කිරීමේ කිසිම අභිප්‍රායයක් ඔබතුමාගේ ආණ්ඩුවට නොමැති හෙයින් ද;

(ඉ) ඊනියා "නිර්රාජ්‍ය" පුද්ගල ගණයකට අයත්ව ජීවත් වන වතු කම්කරුවන්ට පුරවැසි අයිතිවාසිකම් දීමේ කිසිම අදහසක් ඔබතුමාගේ ආණ්ඩුව කෙරෙහි නොමැති හෙයින් ද;

උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසය නොමැති බව කණගාටුවෙන් ප්‍රකාශ කරමු." [මෙරිල් ප්‍රනාන්දු මයා.]

"එතකුදුවුවත්,

(V) උතුමාණන් වහන්සේගේ කථාවෙහි සඳහන් වන ප්‍රගතිශීලී ක්‍රියා මාර්ගයන් ඉතා සාදරයෙන් අප පිළිගන්නා අතර, පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහාද වර්තමාන සැසි වාරය තුළදී නොපමාව පියවරක් ගැනීමේ අවශ්‍යතාවය ඉතා ඕනෑකමින් ප්‍රකාශ කර සිටිමු, එනම්:—

(1) ජන රජයක් පිහිටුවීම;

(2) ලංකාවේ ලියා පදිංචි කර ඇති සියලුම වෙළඳ සමාගම් හා ලංකාවේ පදිංචිව සිටින සෑම පුද්ගලයකුම ඔවුන්ගේ ගිණුම් ලංකා බැංකුවේ හා/හෝ මහජන බැංකුවේ පමණක් තබාගත යුතු බව නීතිගත කිරීම;

(3) ලංකාවේ දැනට පවත්වාගන යනු ලබන සියලුම "යටිකූට්ටු අධිරාජ්‍යවාදී ව්‍යාපාර" වසා දැමීම;

(4) රාජ්‍යාංශයේ කාර්මික ව්‍යාපාරයන්හි ඇති ප්‍රමාදයන් හා අවහිරකම් නැතිකර ලීමත්. පෞද්ගලික අංශයේ නව කර්මාන්ත අනුමත කිරීමේ ක්‍රමය සමීක්ෂණය කිරීමත් හා කර්මාන්ත, කෘෂිකර්ම, ධීවර, වාරි මාර්ග සහ ඉඩම් සංවර්ධන පිළිබඳ මූලික ප්‍රතිපත්ති නැවත හැඩගැස්වීම;

(5) ගුරුවරුන්ට සහ, සිය රාජකාරි ඉටු කිරීමේදී මහජනයා හා සම්බන්ධ කටයුතුවලට සිය මනාපය නිල බලයෙන් පාවිච්චි කිරීමට අවශ්‍ය නොවන රජයේ සේවයේ ද, පළාත් පාලන සේවයේ හා නීතිගත සංස්ථාවන් හිද සේවයේ නියුක්ත සියලුම සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දීම;

(6) විදේශීය විනිමය වැය නොවන පිටරට සංචාරයටත් බලපාන සීමා කිරීම් ඉවත් කිරීම, ලියා පදිංචි කර ඇති වෘත්තීය සමිතිවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරීන්ට වතුවලට ඇතුලුවීමට හා ඔවුන්ගේ සාමාජිකයන්ගේ රැස්වීම් පැවැත්වීමටද නීතියෙන් අවසර ලබාදීම හා රාජ්‍යාංශයේ වෘත්තීය සමිති අනුබද්ධ කිරීමට ඇති අයිතිවාසිකම්වලට බලපාන සීමා කිරීම් ඉවත් කිරීම යන මේ පියවර ඇතුලු වනසේ ප්‍රජාතන්ත්‍රවාදී හා වෘත්තීය සමිති අයිතිවාසිකම් පුළුල් කිරීම;

(7) ගැමි ජනතාව ණය බරින් මුදාලීම සඳහා යෝජනා ක්‍රමයක් පිළියෙළ කිරීම;

(8) සෙසු කටයුතු අතර, ජනපද ප්‍රදේශ තුළ පිහිටි කුඹුරු ඉඩම් ඇතුලුව සියලුම කුඹුරු ඉඩම්වලට බලපාන ලෙසටත්, ගොවි කාරක සභාවලින් ඉඩම් හිමියන් අස්කරලීමටත්. බදු අයිතිය සම්බන්ධ ප්‍රශ්නයන් නීති කෘත්‍යයනට භාජනය වී තිබියදීත් අඳ ගොවියන්ට එම ඉඩම් සතු කිරීමේ බලය ගොවි කාරක සභාවන්ට ලබාදීමටත් හැකි වනසේ කුඹුරු පනත සංශෝධනය කිරීම;

(9) කම්කරු නීති අද තත්ත්වයට ගැලපෙන සේ ප්‍රතිශෝධනය කිරීමද; සේවකයන්ගේ, සේවක අර්ථ සාධක අරමුදලට අයත් නොවන පසුගිය සේවයත් ඇතුළත්වන සේ පාරිතෝෂික අරමුදල් පනතක් ඉදිරිපත් කිරීමද; කම්කරු දෙපාර්තමේන්තුව විසින් නියම විභාගයක් නොපවත්වා හෝ, එම දෙපාර්තමේන්තුවේ අනුමතිය නොලබා හෝ පෞද්ගලික ආයතනයන්හි සේවයෙහි නියුක්ත සේවකයන් සේවයෙන් පහ කිරීම තහනම් කිරීම; හා

(10) ජාතික රංග පීඨයක්ද, ජාතික චිත්‍රපට සංස්ථාවක් හා ජාතික ක්‍රීඩා සංගමයක් ද පිහිටුවීම;

යන මේ කරුණුය.''—[පී. ජී. බී. කෙනමන් මයා.]

(vi) "එතෙකුදුවුවත්,

අද රට මුහුණ පා සිටින ඉතාමත් බැරුරුම් ජාතික ප්‍රශ්නය ගැන එනම් සිංහල භාෂාව සහ ද්‍රවිඩ භාෂාව කථා කරන ජාතීන් අතර දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් පවතින ගැටීම ගැනද; දැනට පවතින ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, සිංහල භාෂාව කථා කරන බහුතර පක්ෂය, ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාව පාගා මැඩගෙන විනාශයට භාජන කරන බවද; එකිනෙකට වෙනස් භාෂා දෙකක් කථා කරන එකිනෙකට වෙනස් ජාතීන් දෙකකට පුරාතනයේ සිට වාසභූමියවූ ලංකාවේ දැනට පවතින ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, ද්‍රවිඩ භාෂාව කථා කරන සුළු ජාතීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ නිදහස, සදාකාලික බහු පක්ෂය වන සිංහල ජනතාවගේ හිතුමනාපය උඩ සදහටම රඳා පවතින බැවින්, එම සුළු ජාතීන් තදබල ලෙස පීඩා විඳ ඇති බවද; ද්‍රවිඩ භාෂාව කථා කරන සුළු ජාතීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ලබාදිය හැක්කේ ලාංකික ෆෙඩරල් ආණ්ඩු සංගම් සැලැස්මක් යටතේ භාෂාව අනුව බෙදා පිහිටුවන ස්වාධීන ද්‍රවිඩ රාජ්‍යයක් හෝ රාජ්‍යයන් මගින් පමණක්ය යන බවද කිසිසේත් අවබෝධ කරගෙන තිබෙන බවක් උතුමාණන් වහන්සේගේ කථාවෙන් නොදැක්වෙන හෙයින් කනගාටු වන අතර,

උදාහරණ වශයෙන් බලන කල ස්විට්සර්ලන්තය, යුගෝස්ලාවියාව, කැනඩාව, ඉන්දියාව, සෝවියට් රුසියාව සහ තවත් රාජ්‍යවල, විවිධ භාෂා කථා කරන විවිධ ජාතීන් ජීවත්වන රටවල පැනනගින නානාප්‍රකාර සංකීර්ණ ප්‍රශ්න ෆෙඩරල් ආණ්ඩු ක්‍රමයක් පිහිටුවීමෙන් සාර්ථක ලෙස විසඳාගෙන තිබියදීත්, එම ආණ්ඩු ක්‍රමය මගින්, විවිධ ජාතීන් ජීවත් වන මෙම රටවල මුළුමහත් ජනතාව අතර නියම එක්සත් භාවය ගොඩනංවා සුළු ජාතීන්ගේ නිදහස සහතික කර ආරක්ෂා කර දී තිබියදීත්, මේ රටේ ඉතාම වැදගත් අත්‍යුත්කෘෂ්ට කාර්යය වනුයේ වර්තමාන ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ෆෙඩරල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට පරිවර්තනය කිරීම බව පිළිගෙන ඇති බවක් හෝ ඒ පිළිබඳව සඳහන් කිරීමක් හෝ උතුමාණන් වහන්සේගේ කථාවෙන් නොපෙනෙන හෙයින් අපගේ බලවත් අප්‍රසාදය පළ කිරීමට සිදුවී තිබේ.''—[ඒ. අමිර්තලිංගම් මයා.]

(vii) "එහෙත්,

සමූපකාර තොග වෙළඳ ආයතනය දැනට කරගෙන යන වැඩ කටයුතු අනුව සමූපකාර ව්‍යාපාරය පිළිබඳ මුළු සංකල්පය ම අත්හැර ඇති බවත්, මෙම ආයතනය දැනට පවත්නා දූෂිත අකාර්යක්ෂම තත්ත්වය උඩ, තව තවත් බඩු භාණ්ඩ බෙදා හැරීම මෙම ආයතනයටම භාර දීමට කිසියම් වෑයමක් කළහොත් එසේ කිරීම ජීවන වියදම තව තවත් ඉහළ යෑමට හේතුවක් වන බවත් කණගාටුවෙන් ප්‍රකාශ කරමු.''—[ඒ. රත්නායක මයා.]

(viii) "එතෙකුදුවුවත්, .

(1) මේ රටේ ද්‍රවිඩ භාෂාවේ ඓතිහාසික තත්ත්වය හා ස්ථානය නැවත ලබාදීම සම්බන්ධයෙන් ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවගේ සාධාරන සහ යුක්ති සහතික ඉල්ලීම් සපුරාලීම් වස් යම්කිසි ස්ථිර පියවරක් ගැන උතුමාණන් වහන්සේගේ කථාව සඳහන් නොකරන හෙයින් ද;

(2) (අ) රජයේ හා රජයේ අනුග්‍රහය ලත් සංයුක්ත මණ්ඩලවල සේවය කිරීම,

(ආ) උතුරු හා නැගෙනහිර පළාත්වල ඉඩම් නිරවුල් කිරීම හා රජයේ අනුග්‍රහය ලත් ජනපද යෝජනා ක්‍රම පිළිබඳ ප්‍රතිපත්තිය,

(ඉ) කැංකසන්තුරේ වරාය ඉදිකිරීමේ යෝජනා ක්‍රමය කඩාකප්පල් කිරීමද ඇතුළත්, උතුරු හා නැගෙනහිර පළාත්වල කෘෂිකාර්මික හා කර්මාන්ත සංවර්ධනය,

යනාදී කරුණුවලදී, ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවට කෙරෙන දැඩි වෙනස්කම් සම්බන්ධයෙන් රජයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රතිපත්තිවල යම්කිසි වෙනස් කිරීමක් සිදුකර ඇති බවක් උතුමාණන්වහන්සේගේ කථාවෙන් අනාවරණය නොවන හෙයින් ද ;

(3) මේ රටේ දරුණු රැකී රක්‍ෂා ප්‍රශ්නය හා නිවාස හිඟය පිළිබඳව කිසිම සැලකිල්ලක්, උතුමාණන්වහන්සේගේ කථාවෙහි දක්වා නැති හෙයින් ද ;

ඔබතුමාගේ රජය කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බැව් කණගාටුවෙන් ප්‍රකාශ කරමු."- [එම්. සිවසිතම්පරම් මයා.]

(ix) "එතකුදුවුවත්, අල්ලස් චෝදනා ගැන විභාග කිරීම පිණිස විශේෂ උසාවි පිහිටුවීමට බලාපොරොත්තු වන රජය, තල්ගොඩපිටිය කොමිසට විසින් අල්ලස් ගැනීමේ චෝදනාවට වරදකරුවන් වශයෙන් පිළිගනු ලැබූ අයට විරුද්ධව කිසිම ක්‍රියා මාර්ගයක් නොගෙන ඇති හෙයින් අපගේ කණගාටුව ප්‍රකාශ කරමු."—

[සිරිල් මැතිව් මයා.]

(x) "එතෙකුදු වුවත්, ලංකාවේ පුරවැසිය පනත් අනුව දැනට පුරවැසි බවක් නොමැති ඉන්දියානුන් ගෙන් පැවැතෙන්නන්ගේ පුරවැසි භාවය විසඳීම සඳහා ලංකාණ්ඩුව හා ඉන්දියා ආණ්ඩුව අතර සාකච්ඡා දැනටමත් ආරම්භ කර ඇත" යන පුරුදු කියමන නැවත වරක් ප්‍රකාශ කර ඇති නමුත්, සම්පූර්ණ වරදරඳා ඇත්තේ වෙනස්කම් දක්වන, කූට රාජෝපායවලින් යුක්ත මෙරට පුරවැසි නීති හා ඒවායේ පාලන ක්‍රම මත බව උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව හරිහැටි තේරුම් ගෙන ඇති බවක් උතුමාණන් වහන්සේගේ කථාවෙන් නොපෙනෙන බැවින් ද, වතුකරයේ සිටින දශ ලක්ෂයක් වූ දෙමළ කම්කරුවන්ගෙන් ඉතා වැඩි සංඛ්‍යාවක්, මෙරට ඉපදී සහ/හෝ ස්ථිර වශයෙන් පදිංචි වී ඇති අය වන අතර, වුන්ගෙන් සැලකිය යුතු කොටසක් පරම්පරාවෙන් ලාංකික පුරවැසිකමට හිමිකම් ඇති අය වූ නමුත්, ඔවුන්ට පුරවැසි භාවය හා ඡන්ද බලය අහිමි වී ඇති බැවින් ද ; ලංකා පුරවැසි පනත හා එහි අයුතු පාලනය නිසා උතුරු සහ නැගෙනහිර පළාත්වල සිටින දෙමළ භාෂාව කථා කරන ජනතාවට මහත් අපහසුකම්වලට සහ අවමානයට පත්වී අවිනිශ්චිත පුරවැසියන් වශයෙන් ජීවත්වීමට සිදුවී ඇති නමුත්, අවිචාරවත් පුර වැසි නීති සහ ඒවායේ පාලන තන්ත්‍රය, පුරවැසි තත්ත්වය පිළිබඳ පිළිගන්නා ලද බුද්ධිමත් ජාත්‍යන්තර සම්මතවලට අනුකූලවනසේ යුක්තිසහගත සහ සාධාරණ පදනමක් මත සංශෝධනය කිරීමට උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව අදහස් කරන බවක් කථාවෙහි සඳහන් නොවන හෙයින් ද, උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බව කණගාටුවෙන් ප්‍රකාශ කරමු."—

[වී. නවරත්නම් මයා.]

(xi) "එහෙත්, අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය විසින් කරන ලද සිහි කල්පනාවෙන් තොර, අයථා ක්‍රියා නිසා ඒ ප්‍රදේශයේ වාසය කරන ජනතාවට අනන්ත අප්‍රමාණ දුක් කරදරවලට මුහුණ පාන්නට සිදුවීම ගැන අපගේ කණගාටුව ප්‍රකාශ කරමු"—

[ඊ. එල්. බී. හුරුල්ලෙ මයා.]

**එම වචන එතැනට එකතු කළ යුතුය; යනුවෙන් ප්‍රශ්නය යලින් සභාභිමුඛ කරන ලදි.**

පූ. භා. 10.7

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.** (කොට්ටාව)
*(திரு. டி. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)

ගරු කථානායකතුමනි, මා ඊයේ කළ කථාව අවසන් කරන්ට තවත් ඉතාම සුළු වේලාවක් කථා කරන්ට අවසර ඉල්ලනවා. මා ඊයේ කරුණු තුනක් ගැන කීවා. මේ රාජාසන කථාව බුද්ධ නීතියටත්, මාක්ස් නීතියටත්, රාජ නීතියටත් පටහැණිව ඉදිරිපත් කළ රාජසන කථාවක්ය කියා මා පෙන්වා දුන්නා. ඒ වාගේම මේ රටේ සිටින කම්කරු හා ගොවි ජනතාවට නියම ජීවිතයක් ගත කිරීම පිණිස යම් වැඩ පිළිවෙළක් මේ රාජාසන කථාවේ යොදා නැති බවත් මා විශේෂයෙන් පෙන්වා දුන්නා. අද ලක්ෂ සංඛ්‍යාත ගණනක් කම්කරු ජනතාව මේ රටේ සිටිනවා. පසුගිය මාර්තු 21 වැනිදා, ගෝල්පේස් පිට්ටනියේ පැවැත්වූ රැස්වීමේ දී, ඒ කම්කරු ජනතාව ඉදිරිපිට—කම්කරු සංවිධාන 14 කගේ සම්බන්ධකම ඇතිව පැවැත්වූ ඒ රැස්වීමේ දී මුලසුන ගත් මුදල් ඇමතිතුමා දිවුරා පොරොන්දු වුණා ඉල්ලීම් 21 ලබා ගැනීමට වැඩ කරනවාය කියා. නමුත් එතුමා ඊට පටහැණිව, ඊට පයින් ගසා ධනපති රදලයින් අස්වද්දන්න ආණ්ඩුවට රිංගා ගත්තා. අධිරාජ්‍යවාදී කාලයේ සිටම, යටත් විජිත ආණ්ඩුව පැවති කාලයේ සිටම මේ රටේ කම්කරු පන්තියටත්, ගොවි ජනතාවටත් ඇතිවී තිබෙන තාඩන පීඩනවලින් ඔවුන් මුදා ගැනීම පිණිස කම්කරු ජනතාවටත් ගොවි ජනතාවටත් ආරාධනා කිරීමට අද අපට සිද්ධ වෙනවා. එදා ලංකා සමසමාජ පක්ෂය හා මේ රටේ ඇතිවූ වෙනත් ප්‍රගතිශීලී සංවිධානත් මූලික ප්‍රතිපත්තියක් වශයෙන් ඉල්ලුම් කළ ඒ ක්‍රියා මාර්ග ඉදිරියවත් මේ රටේ සථාපිත කර ඒ මගින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවි-කම්කරු රජයක් ඇති කිරීමට මා නැවතත් තරයේම කම්කරු පන්තියටත් ගොවි ජනතාවටත් ආරාධනා කරනවා.

අපි වාමාංශික එක්සත් පෙරමුණක් පිහිටුවා තිබෙනවා. පිලිප් ගුණවර්ධනත් කොමියුනිස්ට් පක්ෂයත් සමසමාජ පක්ෂයත් එයින් තුරන් වී, ඇත්වී එහෙම එකක් නැත කියා ප්‍රකාශ කළාට, රටේ ජනතාව ඒ වාමාංශික එක්සත් පෙරමුණේ පක්ෂය මගින් ඉදිරියටත් මේ රටේ විමුක්ති සටන ගෙන යෑම පිණිස ඒකාරාශිවී සංවිධානය වී සිටිනවා. රටේ ජනතාව ඒ ක්‍රියා මාර්ග ඔස්සේ ගමන් කරන්ට සංවිධානය වී සිටින බව මා විශේෂයෙන් ප්‍රකාශ කරන්ට ඕනෑ.

ඒ සමගම අර ඉල්ලීම් 21 කම්කරු ජනතාවට ලබා ගැනීම සම්බන්ධයෙන් සටන් මාලාවක් ඉදිරියට එනවා ඇති. ඒ වාගේම වී බුසල අද රුපියල් 12 ක් වෙන්න පුළුවන්. හෙට අනිද්දා අර සටන් මාලාව වෙනුවෙන් මුදල් පිළියෙළ කිරීම පිණිස මුදල් ඇමතිතුමා වෙන අන්දමකින් එ වී බුසලේ වටිනාකම කපා හරින්ට ඉඩ ඇති.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ලක්ෂ සංඛ්‍යාත කම්කරු ජනතාවට රක්ෂා සපයා දීම පිණිස මේ රාජාසන කථාවේ කිසිම දෙයක් නැහැ. මේ රාජාසන කථාවේ තිබෙන්නේ රැකීරක්ෂා රහිත හමුදාව මේ රටේ වැඩි කිරීම පිණිසයි. ධනපති යන්ට ඕනෑ විධියට කම්කරුවා එළියට දමන්ට සැලැස්වීමේ වැඩ පිළිවෙළකුයි මේ රාජාසන කථාවේ තිබෙන්නෙ.

අධිරාජ්‍යවාදි ආණ්ඩුත් මේ රටේ දුම්රිය හා මහ පාර ජනසතු කර තිබෙනවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවත් විදුලිය ජනසතු කළා. ඒ වාගේම වාමාංශික එක්සත් පෙරමුණේ ආණ්ඩුවත් ඉඩම් කීපයක් ජනසතු කළා. ඔබත් ඇතැම් දේවල් ජනසතු කළා. ජනතාවට ප්‍රයෝජනවත් වන ඒ හැම ප්‍රගතිශීලි වැඩවලටම සෑමදාම අපි අත උස්සා තිබෙන බව මතක් කරන්ට ඕනෑ. ඉදිරියටත් එවැනි ප්‍රගතිශීලි වැඩවලට අපි ආධාර කරනවා. රදල ධනපති අධිරාජ්‍යවාදීන්ට ජන්දම් අල්ලන සියලුම වැඩවලට විරුද්ධව කෙළින්ම සටන් කරන්ට තමුන්නාන්සෙල මේ ආණ්ඩුවට රිංගා ගත්තත්, ඒ බලපෑම් බිඳ ගොවි-කම්කරු ජනතාව ඉදිරියට ගමන් කරවීමට, එක්සත් ජාතික පක්ෂයට බලයට එන්ට නොදී ගසන පහරවල ආකාරයටම ඔබගේ ධනපති රදල ආණ්ඩුවේ ප්‍රතිගාමී සියලුම වැඩවලට පහර ගසන අතර, ප්‍රගතිශීලි වැඩවලට ආධාර දෙන බවත් සඳහන් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

පූ. භා. 10.12

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, හවුල් ආණ්ඩුව පිහිටුවූ දා පටන්ම මා උත්සාහ දැරුවා, පුළුවන්කමක් තිබෙනව නම් මේ ආණ්ඩුවට පක්ෂව ඡන්දය දෙන්න. එහෙත් රාජාසන කථාවට පසුව මගේ හිතේ තිබුණු ඒ බලාපොරොත්තුව නැති වී ගොස් තිබෙනව. මට මේ රාජාසන කථාවට පක්ෂව ඡන්දය දෙන්ට බැරි වී තිබෙන්නෙ මන්ද කියන කාරණය මා ඉතාමත් ලුහුඬින් මතක් කර දෙන්ට කැමතියි. රාජාසන කථාවේ ඉතා වැදගත් ප්‍රශ්න අමතක කර තිබෙනව. ඒ ප්‍රශ්නවලින් කැපී පෙනෙන ප්‍රශ්න දෙකක් තමයි, රැකීරක්ෂා ප්‍රශ්නයත්, නිවාස ප්‍රශ්නයත්. ලංකා සමසමාජ පක්ෂය 1960 මැතිවරණයෙදි ඡන්ද ප්‍රකාශනයක් නිකුත් කළා. ඒ ප්‍රකාශනයෙහි සඳහන් කර තිබෙනව, යම්කිසි විධියකින් ලංකා සමසමාජ පක්ෂයට බලය ලැබුණොත් රැකීරක්ෂා නොමැතිකම අවසාන කරනවාය කියා—“ end unemployment ”. එහෙත් මෙතෙක් කල් රාජාසන කථාවල සඳහන් වී තිබුණු රැකීරක්ෂා ප්‍රශ්නයත් මෙවර රාජාසන කථාවෙන් ඉවත් කර තිබෙනව. රැකීරක්ෂා ප්‍රශ්නය නොවිසඳුන ආණ්ඩුවකට මහජන මන්ත්‍රීවරුන්ට කිසිසේත් ඡන්දය දෙන්ට පුළුවන්කමක් නැත කියා මා කල්පනා කරනව.

එමෙන්ම නිවාස ප්‍රශ්නය ගැනක් රාජාසන කථාවේ සඳහන් වී නැහැ. මේ ආණ්ඩුවෙ ඇස් දෙක ඉදිරිපිට කොළඹ නගරයේ පැල්පත් 30,000 ක් තිබෙනව. ඒ පැල්පත් 30,000 පදිංචිව සිටින 1,50,000ක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

දෙනා මේ ආණ්ඩුවට අභියෝග කරනවා. එමෙන්ම දෙලක්ෂයක් පමණ මේ රටේ නිවාස නැති පවුල්—දෙමව්පියෝ දූ දරුවන්—මේ ආණ්ඩුවට සාප කරනව, නියම ජාතික නිවාස ක්‍රමයක් මෙතෙක් කල් මේ රටේ ඇති නොකිරීම ගැන.

මේ ප්‍රශ්න දෙක හැර තවත් වැදගත් ප්‍රශ්න දෙකක් තමයි, අධ්‍යාපන ප්‍රශ්නයත්, සෞඛ්‍ය ප්‍රශ්නයත්. ඒ ප්‍රශ්න දෙක ගැන රාජාසන කථාවේ සඳහන් වී තිබෙන නමුත් ඒ ප්‍රශ්න දෙක පිළිබඳව කළ යුතු නියම ප්‍රතිකර්ම ගැන එහි කිසිම සැලකිල්ලක් දක්වා නැහැ. අධ්‍යාපන ප්‍රශ්න ගැන නීති ඉදිරිපත් කරනවායයි සඳහන් කර තිබෙනව. නීති ඉදිරිපත් කිරීමට පෙර අපේ පාසැල්වල තිබෙන මූලික අඩුපාඩුකම් හරි ගස්සන ලෙස මා ඉල්ලා සිටින්ට කැමතියි. මූලික අඩුපාඩුකම් හරිගස්සන්නෙ නැතුව නීති සකස් කිරීම හරියට අශ්වයාට ඉස්සරහින් කරත්තෙ බඳිනවා වගේ වැඩක්. නීති සකස් කරන්ට පෙර පාඨශාලාවල තිබෙන ඉඩකඩ මදිකම, ක්‍රීඩා භූමි නැතිකම, රසායනාගාර නැතිකම, අවශ්‍ය උපකරණ නැතිකම හා ගුරුවරුන් හිඟකම ආදි ප්‍රශ්න විසඳන්න කියා මා ඉල්ලා සිටිනව. ඒ අඩුපාඩු හරි ගස්සා ගත්තට පස්සෙ නීති සකස් කරන්න පුළුවන්. අඩුපාඩු හරි ගස්සන්නෙ නැතිව නීති සකස් කළොත් අවුලෙන් අවුලට ගොස් මේ රටේ අධ්‍යාපනය පිස්සිගෙ පළා මල්ල වැනි එකක් වෙනවාට කිසිම සැකයක් නැහැ.

සෞඛ්‍ය ප්‍රශ්නය සම්බන්ධයෙන් රාජාසන කථාවේ සඳහන් වී තිබෙනවා. සෞඛ්‍ය ප්‍රශ්නයේදීත් එවැනි අඩු පාඩුකම් හරි ගස්සන්නය කියා මම ඉල්ලනවා. ලංකා සම සමාජ පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයේදී කියා තිබුණා, සෑම ලෙඩකුටම ඇඳක් දෙනවාය කියා. සෑම ලෙඩකුටම අද වෙනි දවසෙ ඇඳක් තබා ඇඳන් යටවත් ඉන්න ඉඩ නැහැ. ඉස්තෝප්පුවලවත් ඉන්න ඉඩ නැහැ. ලෙඩුන් සුවය ලබන්න කලින් පන්නා දමනවා. ආරෝග්‍යශාලාවල සියලුම අඩු වැඩිය සහ උපකරණ ආදිය පිළිබඳ හිඟයක් තිබෙනවා. බෙහෙත් හිඟයි. ඉතාමත්ම අහිංසක දුප්පත් ලෙඩුන්ට ඩිස්පැන්සරිවලින් සාමාන්‍ය බෙහෙත් ගන්නය කියා නියම කරනවා. ආරෝග්‍යශාලාවේ නැවතී ප්‍රතිකාර ලැබිය යුතු තත්ත්වයේ සිටින ලෙඩාට ඩිස්පැන්සරියෙන් බෙහෙත් අරන් ගුණ වෙනවාද? ඒ වාගේම අද ආණ්ඩුවේ ආරෝග්‍යශාලාවල විශාල බෙහෙත් හිඟයක් තිබෙනව. ඒ වාගේම දොස්තරවරුන් හිඟයි. ඒ වාගෙ සේවකයන් හිඟයි. කම්කරුවන් හිඟයි. ඔය විධියෙන් ඇති මූලික අඩු පාඩු හරි ගස්සන්නෙ නැතිව සෞඛ්‍ය ප්‍රශ්නය විසඳන්නෙ කොහොමද කියා මම අහන්න කැමතියි.

කථානායකතුමනි, ජීවන වියදම් ප්‍රශ්නය පිළිබඳවත් රාජාසන කථාවේ සඳහන් වී තිබෙනවා. හවුල් ආණ්ඩුවේ පළමුවෙනි පොරොන්දුව තමයි, ජීවන වියදම පහත දැමීම. හවුල් ආණ්ඩුව අරඹා දැන් මාසයක් ගත වී තිබෙනවා. නමුත් අද ජීවන වියදම කලින් මාසෙට වඩා නැඟී තිබෙනවා. තව ඉදිරියටත් නඟිනවා ඇති. රාජාසන කථාව පැවැත්තුවාට පසුව බඩු මිල තවත් ඉහළ ගියා. ඒ මන්ද? ඉදිරියට වෙළඳ පොළේ වෙළඳාම මොන අන්දමට කෙරෙයිද කියන එක ගැන අවිශ්වාසයක් තිබෙනවා. මේ රාජාසන කථාවේ පෙන්වා දී තිබෙන පිළිවෙළේ හැටියට නම් බඩු මිල තව තවත් ඉහළ නඟින බවයි මගේ හැඟීම. සමුපකාර තොග වෙළඳ ආයතනයේ මාර්ගයෙන් ජීවන වියදම් ප්‍රශ්නය විසඳන්න බැහැ. සමුපකාර තොග වෙළඳ ආයතනය අද අලිබබා සහ හොරු 40 දෙනාගෙ ගුහාව බවට පත් වී තිබෙනවා. යම් කිසි ප්‍රමාණයකින් ජීවන වියදම පිළිබඳ ප්‍රශ්නය විසඳන්න වුවමනා නම් මූලික කරුණු දෙකක් තිබෙන්න ඕනැ. මුලින්ම අවශ්‍ය ප්‍රමාණයට බඩු තිබෙන්න ඕන. අද අවශ්‍ය ප්‍රමාණයට බඩු ගෙන්වන්නෙ නැහැ. මම සෝදිසි කර බැලුවා. ගෙවල් සෑදීම සඳහා ගන්න සිමෙන්ති සාමාන්‍ය කෙනෙකුට නියම මිලට ගන්න ලැබෙන්නෙ නැත්තෙ මන්ද කියා. බල පත්‍රයක් අරගෙන ගියත් සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් කියන්නෙ මොකක්ද? තමන්ට ලැබුණ සිමෙන්ත තොගය අවසාන බවයි. එනකොට එසේ හිඟ වෙන්නෙ ඇයි කියා මම සෝදිසි කළා. අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු වෙනයි බඩු ගෙන්වා තිබෙන්නෙ. එම නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊට හේතුව අවශ්‍ය ප්‍රමාණයට බඩු නොගෙන්වීමයි. සියලුම බඩු අවශ්‍ය ප්‍රමාණයට ගෙන්වන්නට ඕනෑ. දෙවැනි මූලික කාරණාව නම් නියම පිළිවෙළට මහජනතාවට ලබාගත හැකි අන්දමට ඒ බඩු බෙදා හරින්න ඕනෑ. නමුත් අද එහෙම වැඩ පිළිවෙළක් ඇත්තේම නැහැ. මම එක නිදර්ශනයක් ගෙන හැර පෙන්වන්නම්. ගාලු නගරයේ සුළු වෙළඳුන්—සිල්ලර වෙළඳුන් එක්සිය විසි දෙනකු පමණ එකතු වී වෙළඳ මණ්ඩලයක් පිහිටුවා ගෙන තිබෙනවා. ඒ වෙළඳ මණ්ඩලය වැඩ කටයුතු ගෙන යන්නේ ඉතාමත්ම හොඳිනුයි, ප්‍රතිපත්තිවලට අනුකූලවයි. ඒ වෙළඳ මණ්ඩලයේ නිලධාරීන් ආණ්ඩුවේ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් බඩු ඉල්ලනවා. ආණ්ඩුවේ තොග වෙළඳ ආයතනය ඒ අයට බඩු දෙනවා ; නමුත් කොහොමද දෙන්නෙ? සුදුරු රාත්තල් තුනයි මාසයකට දෙන්නෙ. ඒ වාගේම මාසයකට දෙන්නෙ සියඹලා රාත්තල් අටයි, අබ රාත්තල් පහයි. සිල්ලර වෙළෙන්දෙක් සුදුරු රාත්තල් තුනක් ගෙනල්ලා කොහොමද බෙදන්නෙ ? එක සිල්ලර වෙළෙන්දකුට මාසයකට දෙන්නෙ ප්ලාස්‍ටා මාළු ටින් 10යි. සිල්ලර වෙළෙන්දෙක් කොහොමද ප්ලාස්‍ටා ටින් දහයක් ගෙනල්ලා බෙදන්නෙ ? ගරු කථානායකතුමනි, මම තමුන්නාන්සේට කියා දෙන්නම් කොහොමද මේවා බෙදන්නෙ කියා.

සමුපකාර තොග වෙළඳ ආයතනය ගෙන යන ජාවාරම් ගැන පරීක්ෂා කර බැලීමට කොමිෂන් සභාවක් පත් කරන්නටය කියා අප නොයෙක් වර කියා තිබෙනවා. මේ මෑතකදී ටින් කෑම මෙරටට ගෙන්වීමට පිට කොටුවේ එක්තරා වෙළඳ සමාගමකට සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් බලපත්‍රයක් නිකුත් කර තිබෙනවා. පිට කොටුවේ ඉන්නවා, එක්තරා වෙළඳ මහතෙක්, පිටකොටුවේ ගෝගියා පාෂා කෙනෙක්. මන්ද මම එහෙම කියන්නෙ ? මේ ගෝගියා පාෂා ටින් කෑම ජාවාරමෙන් එක මාසයකට රුපියල් ලක්ෂ දහයක ලාභයක් ලබා ගෙන තිබෙනවා. මෙන්න ඒ පිළිබඳව විස්තර.

ගරු කථානායකතුමනි, සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් බලපත්‍රයක් නිකුත් කර තිබෙනවා, 4 වැනි හරස් වීදියේ නොම්මර 34 දරණ ස්ථානයේ වී. මානික්කම් සහ සහෝදර කොම්පැනියට.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා (මුදල් ඇමති)

*(கௌரவ கலாநிதி என். எம். பெரேரா—நிதி அமைச்சர்)*

(The Hon. Dr. N. M. Perera—Minister of Finance)

Is this the name of the company you are talking of?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක

*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*

(Dr. W. Dahanayake)

Yes.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා

*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*

(The Hon. Dr. N. M. Perera)

What is the address?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක

*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*

(Dr. W. Dahanayake)

34, Fourth Cross Street, Colombo 11.

රුපියල් 16 ලක්ෂයක ටින් කෑම ගෙන්වන්නට මේ කොම්පැනියට බලපත්‍රයක් නිකුත් කර තිබෙනවා. තමුන්නාන්සෙ කල්පනා කරන්නෙ ටින් කෑම බෙදා හරින්නෙ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් පමණක්ය කියලද ? වෙළෙන්දා පොරකනවා බලපත්‍ර ඉල්ලලා. නමුත් වී. මානික්කම් සහ සහෝදරයන්ගෙ කොම්පැනියට පමණක් රුපියල් 16 ලක්ෂයක ටින් කෑම ගෙන්වීම සඳහා විශෙෂ බලපත්‍රයක් නිකුත් කර තිබෙනවා. එම බලපත්‍රය යටතේ රුපියල් 41 කට ගෙන්වන ලද ටින් කෑම කේස් එක රුපියල් 80 ගණනේයි සිල්ලර වෙළෙන්දාට විකුණා තිබෙන්නෙ. වටිනාකම රුපියල් 40 යි ; විකුණුවේ රුපියල් 80 යි. නමුත් බිල ලිව්වේ රුපියල් 48 සිට 50 දක්වායි. රුපියල් 40 ට ගෙනා කේස් එක රුපියල් 80ට විකුණා මේ ගෝගියා පාෂා එක මාසයකට රුපියල් ලක්ෂ 10 ක ලාභයක් ලබා ගත්තා. ගරු කථානායකතුමනි, මම සඳහන් කරන මේ කාරණාව සිල්ලර වෙළෙඳුන්ගෙන්ම ඔප්පු කරන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

අපේ ආණ්ඩුව බඩු බෙදා හරින්නේ මේ විධියටයි. එම නිසා බඩු බෙදා හැරීම සඳහා දැන්වත් නියම වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ජීවන වියදම පහළ බැස්ස වීමට වුවමනා නම් බඩු බෙදා හැරීම සඳහා නියම වැඩ පිළිවෙළක් ඇති කරන්න.

ගරු කථානායකතුමනි, සමාජවාදී ක්‍රමයක් අනුව ඉදිරියට වැඩ කරගෙන යන බව මේ රාජාසන කථාවේ මුලින්ම සඳහන් කර තිබෙනවා. එසේ නම් මේ රටේ සිටින සාමාන්‍ය ජනතාව වෙනුවෙන් නියම සමාජවාදී ක්‍රමයක් ඇති කරන ලෙස මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලනවා. සමාජ සේවා කටයුතු පිළිබඳව 1947 දී නිකුත් වූ වාර්තාවක් තිබෙනවා. මේ වන තුරු ඒ වාර්තාවේ අඩංගු නිර්දේශයන්ගෙන් දෙකක් ක්‍රියාවට පරිවර්තනය වී තිබෙනවා. අර්ථසාධක අරමුදලක් ඇති කිරීම හා සහනදායක නීතිය ඇතිකිරීම මේ කරුණු දෙකයි. Those two are Employees' Provident Fund and Poor Law. නමුත්, මේ වාර්තාවේ ඉතාමත්ම වැදගත් තවත් නිර්දේශ හතක් තිබෙනවා. කරුණා කර වහාම ඒ හත ක්‍රියාත්මක කරන ලෙස මා මේ සමාජවාදී ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ඒ නිර්දේශ හත මා දැන් කියවන්නට කැමතියි.

(1) A Health Insurance Scheme for all employed persons.

රක්ෂාවල යෙදෙන සියලු දෙනාම සඳහා සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක්.

(2) An Unemployment Insurance Scheme for all employed persons.

දැනට රක්ෂා තිබෙන අයට රක්ෂා නැති වූ අවස්ථාවලදී ක්‍රියාත්මක වන රක්ෂණ ක්‍රමයක්.

(3) A Children's Allowance Scheme for the children in each family after the second child in attendance at recognized schools.

පවුලක සිටින දරුවන් ගණන අනුව, දෙවැනි දරුවාගේ පටන් පාඨශාලාවලට යවන දරුවන් වෙනුවෙන් මාස්පතා ආධාර මුදලක්.

(4) An Orphans' Allowance Scheme for orphans.

අනාථ වූ දරුවන්ට ආධාර දෙන ක්‍රමයක්.

(5) An Old Age Pension Scheme for men aged 70 or over and women aged 65 or over.

මහලු අයට විශ්‍රාම වැටුප් ක්‍රමයක්. අවුරුදු 70 න් වැඩි සියලුම පිරිමින්ටත්, අවුරුදු 65 වැඩි සියලුම ස්ත්‍රීන්ටත් විශ්‍රාම වැටුප් ක්‍රමයක්.

(6) A Blind Persons Pension Scheme for all blind persons aged 45 or over.

අන්ධයන්ට ආධාර දෙන ක්‍රමයක්.

(7) An Unemployment Assistance Scheme for unemployed persons.

රැකී රක්ෂා නැති අයට ආධාර දෙන ක්‍රමයක්.

1947 දී ඉදිරිපත් කරන ලද මෙම යෝජනා සමාජවාදී ආණ්ඩුවක් විසින් දැන්වත් සලකා බැලිය යුතුයි.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

What is the total cost of that?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

රුපියල් කෝටි 8½ ක වියදමක් මේ සන්දේශයෙන් පෙන්වා තිබෙනවා.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

It will cost you at least Rs. 1,000,000,000. Do you say you can do that for Rs. 84,000,000 ?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

No, I am only pointing out what is in the Report.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවීමට මුදල් නැත කියා මේ මුදල් ඇමතිතුමා කියනවා නම්, මා දන්නේ නැහැ කෙසේද සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවන්නේ කියා. අවශ්‍ය වැඩවලට වුවමනා කරන මුදල්, මුදල් ඇමතිතුමා සොයන්න ඕනෑ. එතුමගෙන් අපි බලාපොරොත්තු වන පළමුවන යුතුකම එයයි. එය හරි ගියාම ඊට පසුව අනිකුත් සියලු දේම හරි යනව ඇති. අවශ්‍ය වැඩ කටයුතු කරන්න මුදල් නැත කියනව නම්, මුදල් නැතුව බැරිය කියනව නම්, ඇමතිවරු වුවමනා නැහැ. ඇමති මණ්ඩලය වෙනුවෙන් ප්‍රධාන ලිපිකරු මණ්ඩලයක් පත් කර ගත්තා ම ආණ්ඩුවෙ වැඩ කටයුතු සම්පූර්ණයෙන් ගෙනියන්න පුළුවනි. වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන්ද සමාජවාදී බවක් ඇති කරන්න ඕනෑ

ගාලුපාරෙ රත්මලානෙන් එන විට මා දුටුව අද වෙලෝනා එකේ කම්කරුවන් ගෙනියන්නෙ මොන විධියේ සටනක්ද කියන එක. තමුන්නාන්සෙලාගෙ ටෙක්ස්ටයිල් කෝපරේෂන් යනුවෙන් හඳුන්වන රෙදිපිළි නිපදවීමේ සංයුක්ත මණ්ඩලයක් තියෙනව. ගැසට් නිවේදනයකින් දැනුම් දීල ඇයි තමුන්නාන්සෙල එම වෙලෝනා වැඩපොළ සංයුක්ත මණ්ඩලයට පවරා නොගන්නෙ? 6 මාසයක් වැල්ලවත්තෙ රෙදි මෝල අඩපණ වී තිබුණා. අපි කිව්ව ඒක ගන්නය කියල සංයුක්ත මණ්ඩලයට, ඇයි තමුන්නාන්සෙලාට බැරි වුණේ වැල්ලවත්ත රෙදි මෝල රජයේ සංයුක්ත මණ්ඩලය යටතට ගන්න. ?

ගරු කථානායකතුමනි, වචනයෙන් පමණක් නොවෙයි, ක්‍රියාවෙන්ද සමාජවාදී වන ආණ්ඩුවක් අපට අවශ්‍යයි. තමුන්නාන්සෙල සියලු දෙනාම වාගෙ දන්නව අද මේ රටේ තියෙන වී මෝල් සම්බන්ධව. මා නොබෝදා ගාල්ලෙ වී මෝලක් ගැන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිලධාරියාට ලිපියකින් දන්වා යැව්ව. ඒ වී මෝලෙ මසකට වරක් පුදුම දෙයක් සිදු වෙනව. ඒ මෝලට කරත්තයක් පුරවල තිරුවාන ගල් ගේනව. ගෙනත් කුඩු කරනව. කුඩු කරල අර හාල් එක්ක ඒව මිශ්‍ර කර බර වැඩි කර ආණ්ඩුවට දෙනව. ඇයි තමුන්නාන්සෙලාට මේ රටේ ඇති සියලුම වී මෝල් ආණ්ඩුවට ගන්න බැරි? හාල් එක්ක තිරුවාන ගල් මහජනයට කවන්නෙ නැතුව ඇයි එසේ නොකරන්නෙ? අද ගිනිපෙට්ටියක මිල ශත 10 යි; 12 යි; 15 යි. ඇයි ඒ ගිනිපෙට්ටි කර්මාන්ත ශාලා සියල්ලක්ම ආණ්ඩුවට ගන්න බැරි? එවැනි ෆැක්ටරි ආණ්ඩුවට ගන්නෙත් නැහැ. එවැනි ද්‍රව්‍ය බෙදා හැරීම ආණ්ඩුවට පවරා ගන්නෙත් නැහැ. නමුත් ඒ වෙනුවෙන් ක්‍රියා කරන ඇමති අංශයක් තියෙනව. අපි තමුන්නාන්සෙලාට කියා සිටිනව, නියම විධියෙ සමාජවාදි ආණ්ඩුවක් ඇති කරන්නය කිය. මේ වැඩ කරන්නය කීවම මුදල් ඇමතිතුමා මා සමග තරමක් කෝප වුණා, මුදල් නැති නිසා. හොඳයි, ගරු කථානායකතුමනි, මට තිබෙන අනික් විනාඩි ස්වල්පය තුළදී මා පෙන්වා දෙන්නම්, පසුගිය මාස දෙකේදි තමුන්නාන්සෙලාට පිට රටින් එන ලක්ෂ 50ක මුදලක් නැති වුණු වැඩ පිළිවෙළක්.

පසුගිය මැයි මස 15 වැනිදා සිට කොළඹ රේගුවේ එක්තරා අංශයක් අඩපණ වී තිබෙනව. ලංකාවේ නොයෙකුත් අය මැණික් ගල් සහ නොයෙකුත් ගල් වර්ග පිටරට යවනව. ඒ මගින් විශාල මුදලක් ලංකාවට එනව. ඒ කර්මාන්තයට ධෛර්‍යයක් දෙන්න ඕනෑ. නමුත් මැයි මස 15 වැනිදා සිට එවැනි සකස් කළ මැණික් ගල් පිටරට යැවීමට භාර ගන්න බැරිය කීම නිසා, කොළඹ රේගුවේ එක එක තැන්වල ඒ මැණික් ගල් පාර්සල් ගොඩ ගැහී තියෙනව. මේකට හේතුව මොකක්ද? දෙපාර්තමේන්තුවේ අරගලයක් ඇති වුණා. දෙපාර්තමේන්තුවේ ඒ අරගලය අනුව ප්‍රැන්සිස් ද සිල්වා සහ මැන්දිස් කියන තක්සේරුකාර මහත්වරු දෙපොළ, මින් ඉදිරියට එවැනි පාර්සල් තක්සේරු කරන්න බැරිය කියා තිබෙනවා. අද ඒ පාර්සල් තක්සේරු කරන්න කව්රුවත් භාර ගන්නෙ නැහැ. එම නිසා ඒ පාර්සල් පිටරට යවන්න බැරි වී තිබෙනව. ඒ නිසා මාස දෙකක් තිස්සෙ පිටරටින් මේ රටට එන්න තිබුණු රුපියල් ලක්ෂ 50 ක පමණ මුදලක් මේ රටට නැති වී ගොස් තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

මෙන්න කථානායකතුමනි, ඒකට සාක්ෂි:

"Sirinivasa",
Bekkegama Road,
Panadura,
July 2, 1964.

My dear MP.

My son contacted two foreign firms—one in Japan and the other in Germany—who import Ceylon precious stones. He has received two orders from these firms. To execute the order from Japan, we took a parcel of gems invoiced at £ 561—to the Colombo Customs to have the gems valued, the invoice stamped and the parcel sealed as required by regulations. There is only one appraiser for gems at the Customs—Mr. Francis de Silva. He refused to value our parcel of gems, stating that since the discovery in May last of an alleged undervaluation of gems he had ceased to value gems for export. He advised me to contact the Controller of Exchange who has the big say in the export of gems. Accordingly, the Exchange Controller was contacted on June 11 and was written to on June 20, but so far we have had no reply. I sent copies of my letter to the Exchange Controller, to the Minister of Finance and the Minister of Internal & External Trade & Supply. (2 copies of the letter enclosed).

Yours sincerely,
WILLIAM PEIRIS."

He sent this to me and I contacted the Controller of Exchange but there has been no result. The same complaint reached me from Mr. M. L. M. Siddique, 75, Kandewatte Road, Galle, who has five parcels worth about Rs. 30,000 but which cannot be sent.

මේ විධියට තමුන්නාන්සෙගෙ වැඩ අඩ පණ වන්න ඉඩ දෙන්නෙ ඇයි කියා මම ගරු මුදල් ඇමතිතුමාගෙන් අහනව. තමුන්නාන්සෙලාට ලැබෙන්න තිබෙන මුදල් ලබා ගන්නෙ නැත්තෙ ඇයි ?

තවත් එක් කරුණක් පමණක් කියා මම මගේ කථාව නවත්වන්නම්. තමුන්නාන්සෙලට සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවන්න වුවමනා නම් එකක් කියන්නම්. තමුන්නාන්සෙලා කථා සීමා කරන්න උත්සාහ කිරීම ගැන මා පුදුම වෙනව. මේ ගරු සභාවෙ වැඩ කටයුතු ඉක්මන් කරන්න වුවමනාවක් තිබෙනව නම් ඒ සඳහා ගතයුතු මාර්ගයත් මම පෙන්වා දෙන්නම්. ස්ථාවර නියෝගවලට අනුව මේ ගරු සභාවේ දැන් රැස්වීම් පවත්වන්නෙ මාසෙකට දවස් හයක් පමණයි. මාසෙකට සාමාන්‍ය යෙන් දවස් 30 ක් තිබෙනව.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

It is not relevant because it is not in the Throne Speech.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

It is in the Throne Speech because you have said that you want to amend the Standing Orders.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Standing Orders!

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

I am speaking about the Standing Orders—about the amendments to the Standing Orders.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

I think we came to an agreement on that.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகனாயக்க)*
(Dr. W. Dahanayake)

I want to criticize them, Sir, on a certain move, a recent move, of theirs.

දැනට ක්‍රියාත්මක වන ස්ථාවර නියෝග අනුව මාසයකට දවස් හයක් පමණයි රැස්වීම් පවත්වන්නෙ. ඒ ගණන දහයක් කළ යුතුයයි මා කියනව. ඒ වගේම අද වැනි දවසේ ස්ථාවර නියෝග සකස් වී තිබෙන පිළිවෙළ අනුව මාසෙකට පැය 31ක් පමණයි වැඩ කරන්නෙ, මේ ගරු සභාව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ ගණන පැය 60 දක්වා වැඩ කරන් - නෙයි කියනව අපි. දින ගණනත් පැය ගණනත් වැඩි කළාම ප්‍රශ්නය විසඳෙනව. ඒ සඳහා අවශ්‍ය සහයෝගය දෙන්න අපි ලෑස්තියි. සියලුම පනත් ස්ථිර කර ගැනීමටත්, සියලුම සාකච්ඡා ඉක්මනට ඉවර කර ගැනීමටත් වුවමනාය කියා මේ ගරු සභාවට මුකවාඩම් පනත් ඉදිරිපත් කිරීම ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රතිපත්තිවලට ලජ්ජාවක් බව කියමින් තමුන්නාන්සෙට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

පූ. භා. 10.45

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)

*(திரு. பி. எச். பண்டார—பதுளை)*

(Mr. B. H. Bandara—Badulla)

ගරු කථානායකතුමනි, මේ රාජාසන කථා විවාදයේදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු වැදගත් කාරණයක් තිබෙනව. ඒ වැදගත් කාරණය නම් දැනට විවාදයට භාජන වෙමින් තිබෙන්නෙ සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුවෙ පස් වැනි රාජාසන කථාව බවයි. ඒ ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුය කියා මා කල්පනා කරන්නෙ මේ රටේ වෙන මොනම ආණ්ඩුවකටවත් පස්වැනි අවුරුද්දෙ රාජාසන කථාවක් ඉදිරිපත් කරන්න පුළුවන් වුනේ නැති නිසයි. ඩී. එස්. සේනානායක අගමැති තුමාගෙ ආණ්ඩුවටත් පුළුවන් වුණේ නැහැ.

**ජේ. ආර්. ජයවර්ධන මයා.** (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)

*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)*

(Mr. J. R. Jayewardene—First Colombo South)

ඇයි නැත්තෙ? ඩී. එස්. සේනානායක මහත්මයගෙ ආණ්ඩුව රාජාසන කථාවල් පහක්ම ඉදිරිපත් කළා. පළමුවැන්න ඉදිරිපත් කරන්න යෙදුණෙ 1947 අවුරුද්දෙ. ඒ කථාවත් සමග රාජාසන කථා පහක්ම ඉදිරිපත් කළා. 1947, 1948, 1949, 1950 සහ 1951 යන පස් අවුරුද්දට රාජාසන කථාවල් පහක් ඉදිරිපත් කරල තියෙනව.

**බණ්ඩාර මයා.**

*(திரு. பண்டார)*

(Mr. Bandara)

මම දන්නෙ නැහැ. මම කිව්වෙ මගෙ මතකෙ හැටියටයි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**

*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*

(Mr. J. R. Jayewardene)

ඩී. එස්. සේනානායක ආණ්ඩුව රාජාසන කථාවල් පහක් ඉදිරිපත් කළා. 1947, 48, 49, 50, 51 යන අවුරුදුවලයි ඉදිරිපත් කළේ.

**ගරු චම්ලි ගුණවර්ධන** (රජයේ වැඩ ඇමති)

*(கௌரவ சம்லி குணவர்தன—அரசாங்கக் கட்டுவேலை அமைச்சர்)*

(The Hon. Cholmondeley Goonewardene—Minister of Public Works)

අවුරුදු පහකට ආණ්ඩුව තිබුණෙ නැහැ නේද?

**ජේ. ආර්. ජයවර්ධන මයා.**

*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*

(Mr. J. R. Jayewardene)

ඩී. එස්. සේනානායක ආණ්ඩුව රාජාසන කථාවල් පහක් ඉදිරිපත් කළ බවයි කිව්වෙ. ඉදිරිපත් කළ අවුරුදුත් කිව්වෙ.

**බණ්ඩාර මයා.**

*(திரு. பண்டார)*

(Mr. Bandara)

කෙසේ නමුත් මෙතන ඊට වැඩි වෙනසක් තියෙනව. පස්වන අවුරුද්දෙ රාජාසන කථාව ඉදිරිපත් කිරීමෙන් විශේෂ වාර්තාවක් ඉදිරිපත් කළා. සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුව 1960 ජූලි මාසෙ ආරම්භ කළායින් පස්සෙ බොහෝ දෙනෙක් කිව්වෙ මේ ආණ්ඩුව මාස හයෙන් වැටෙනවය, අවුරුද්දෙන් වැටෙනවය කියලයි. නොයෙක් දේශපාලන ශාස්ත්‍රකාරයො අනාවැකි කියන්න පටන් ගත්ත. ඒ කොයි හැටි වෙතත් අනාවැකි සියල්ලක්ම බොරු ඒවා බව පැහැදිලි කරමින් දැන් පස් වැනි අවුරුද්දටත් පා තබා සිටිනව. ඒ අනුව සලකා බලන විට සිරිමා බණ්ඩාරනායක



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

ආණ්ඩුව දැනටමත් විශිෂ්ඨ වාර්තාවක් හෙවත් ඉතිහාසගත වන වාර්තාවක් පිහිටුවා අවසානය කියා ප්‍රකාශ කරන්න පුළුවනි. සිරිමා බණ්ඩාරනායක මැතිනිය දේශපාලන භූමියට අලුතින් පා තැබූ නැනැත්තියක හැටියට බොහෝ දෙනෙක් ලොවට හඬ ගා කිව්වා. ඒ නිසාම එතුමිය දේශපාලනමය අවබෝධයෙන් තොර නැනැත්තියක හැටියටත් හඳුන්වා දෙනු ලැබුව. සෑහෙන පළපුරුද්දක් නැති නිසා ඇයට මේ ආණ්ඩුව දිගටම කරගෙන යාමට බැරිය කියාත් බොහෝ දෙනා ප්‍රකාශ කළා. එහෙත් මෙතෙක් එතුමිය වැඩ කරගෙන ගොස් තිබෙන ආකාරය ගැන විමසා බලන විට මේ රටේ පමණක් නොව විදේශවල පවා එතුමියගෙ කීර්තිය පැතිර ගොස් තිබෙන බව කියන්න පුළුවනි. මේ රටෙත් විදේශිය රටවලත් කවුරුනුත් හිතුවට වඩා හොඳිනුත් දක්ෂ අන්දමිනුත් ස්ථිරවත් එඩිතර ලෙසත් එතුමිය වැඩ කර ඇති බව අද පැහැදිලියි. එපමණක් නොව මේ රටේ අන් කිසිම අගමැතිවරයෙකුට නොදෙවැනි තරම් එඩිතර භාවයකින් යුක්තව තමන් ගත් අඩිය වෙනස් නොකර කටයුතු කිරීමේ ශක්තියත් එතුමියට තිබෙන බව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුත් පිළිගන්නවා ඇති. ඒ නිසාම සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුවෙ අනාගතය පිළිබඳවත් ලොකු විශ්වාසයක් සහ බලාපොරොත්තුවකුත් මේ රටේ මහ ජනයා තුළ තිබෙන බව මේ අවස්ථාවේ අමුතුවෙන් මතක් කරන්න වුවමනා කරන්නෙ නැහැ.

මේ විවාදයේදී මන්ත්‍රීවරු ගණනාවක්ම ඊට සහභාගි වුණා. ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) හැර අන් සැම ගරු මන්ත්‍රීවරයෙකු විසින් ම කරන ලද කථාවලින් පැහැදිලි ලෙස පෙනී ගිය එක් කාරණයක් ගැන සඳහන් කරන්න ඕනෑ. ඒ හැම කථාවකින් ම පෙනී ගියේ මෙතෙක් පැවතුනේ රාජාසන කථාව පිළිබඳ විවාදයක් නොව හවුල් ආණ්ඩුව පිළිබඳ විවාදයක් බවයි. බොහෝ විට අපට අසන්නට ලැබුණේ හවුල් රජය පිළිබඳ කථායි. ඒ නිසා අපටත් මේ පිළිබඳව යමක් නොකියා බැහැ. මේ හවුල් රජය පිහිටුවීමට කටයුතු ආරම්භ කළ අවස්ථාවේ සිට එය කඩාකප්පල් කරන්නට මේ රටේ ප්‍රතිගාමී පිරිස නොයෙකුත් උත්සාහ දැරූ බව අපි දන්නවා. හේතුව අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මේ ප්‍රගතිශීලී පක්ෂ එක්වුණාම පසුව ප්‍රතිගාමී පිරිසට යළිත් බලයට එන්නට බැරි බව ඔවුන් දන්නවා. ඒ නිසයි කඩාකප්පල් කරන්නට උත්සාහ කළේ.

මේ හවුල් රජය පිහිටුවන්නට අපි ඉඩ දෙන්නේ නැහැ. එසේ කරනවා නම් කරන්නෙ අපේ මළ කඳන් උඩින් ය යි එක්සත් ජාතික පක්ෂය කියා තිබෙනවා සමහර පුවත්පත්වලින් මා දැක්කා.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
නැහැ. නැහැ.

**බණ්ඩාර මයා.**
*(திரு. பண்டார)*
(Mr. Bandara)
මම පුවත්පත්වල දැක්කා. නමුත් අපි දැන් හවුල් රජයක් පිහිටුවා ඉවරයි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
එහෙම කිව්වේ නැහැ.

**බණ්ඩාර මයා.**
*(திரு. பண்டார)*
(Mr. Bandara)
මට පෙන්වන්න පුළුවන්.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
පුළුවන් නම් පෙන්වන්නකො.

**බණ්ඩාර මයා.**
*(திரு. பண்டார)*
(Mr. Bandara)
අපි හවුල් රජයක් පිහිටෙව්වා. නමුත් තවම එක මළ කඳක්වත් දැක්කේ නැහැ. එවැනි වචන පාවිච්චි කරන විට හවුල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රජයක් පිහිටුවීම නවතීවිය කියා ඔවුන් අදහස් කළා. නමුත් මේ රටේ වැඩි ජනතාවගේ පිළිගැනීම උඩ පසුගිය ජූනි 11 වැනි දින මේ රටේ හවුල් රජයක් පිහිටෙව්වා. මේ රටේ මහජනතාවගේ ප්‍රීතිය, ප්‍රසාදය, සහයෝගය, මේ හවුල් රජයට ලැබෙන බව අපට බොහොම පැහැදිලිව පෙනෙනවා.

සමහර මන්ත්‍රීවරුන් සඳහන් කළා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මේ ආණ්ඩුව ගෙන යන්නට බැරි නිසා හවුලක් ඇති කර ගත්තාය කියා. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවා මේ ප්‍රගතිශීලී පක්ෂ අතර භේද ඇතිවන තරමට, සමගිය නැති තරමට, ප්‍රතිගාමීන්ගේ බලය වැඩි වන බව. 1956 දී මේ රටේ ප්‍රතිගාමී පිරිස පරාජය කොට ප්‍රගතිශීලී රජයක් පිහිටුවන්නට හැකි වුණේ ප්‍රගතිශීලී පක්ෂ එකතු වූ නිසයි. නමුත් 1960 මාර්තු මාසයේදී යළිත් ප්‍රගතිශීලී පක්ෂ අතර ගැටුම් ඇතිවූ නිසා, වාද විවාද ඇති වූ නිසා, ඔවුනොවුන් වෙන් වෙන්ව මැතිවරණ කටයුතු කළ නිසා, මේ රටේ සාමාන්‍ය මහජනතාවගේ සිතුම් පැතුම්වලට විරුද්ධ ප්‍රතිගාමී ආණ්ඩුවක් යළිත් ඇති වුණා. 1960 ජූලි මාසයේදී යළිත් මේ තත්ත්වය තේරුම් ගෙන ප්‍රගතිශීලී පක්ෂ එක්ව කටයුතු කිරීම නිසා නැවතත් ප්‍රගතිශීලී ආණ්ඩුවක් ඇති වුණා.

ගරු කථානායකතුමනි, මැතිවරණයකදී පමණක් නොවෙයි, පාලන කටයුතුවලදීත් ප්‍රගතිශීලී පක්ෂ එක්විය යුතුයි කියා අපි කල්පනා කළා. මැතිවරණයක් ළං වන විට පමණක් එක්වීමෙන් මේ රටේ මහජනයා හැමදාම මුළා කරන්න අමාරුයි. ඒ නිසා ප්‍රගතිශීලී පක්ෂ එක්වී අපි වැඩ කරන්න ඕනෑය කියන හැඟීම උඩයි මේ හවුල් රජය ඇති වුණේ.

ඊයේ මේ පිළිබඳව කථා කරගෙන යද්දී අසන්නට යෙදුණා රාජාසන කථාවේ සඳහන් වී තිබෙන ප්‍රතිගාමී කියන වචනය පාවිච්චි කළේ කා සඳහාද කියා. කවුරුන් සඳහාද, මේ ප්‍රතිගාමී කියන වචනය පාවිච්චි කළේ යන්න ගැන කල්පනා කරන විට මම පාසල් යන අවධියේදී ඉගෙනගත් කථාවක් මතක් වුණා. ඒ පුහුල් හොරා කරින් දැනේ කියන කථාවයි. එක් ගම්වැසියෙක් තම පුහුල් වැලේ තිබුණු පුහුල් ගෙඩිය හොරු කඩාගෙන ගොස් ඇති බව දැන මහ හඬින් කෑ ගාන්නට පටන් ගත්තා. එවිට එතැනට බොහෝ මිනිස්සු පැමුණුනා. හොරාත් ආවා. එවිට ඒ ගම්වැසියා පුහුල් හොරා කරින් දැනේ යයි කිව්වා. එතකොට හොරා කර අතගෑවා. ප්‍රතිගාමීන් කවුරුන්දැයි අසා මම තමයි හොරා කියන්නාක් මෙන් කර අතගෑ හැටි අපට පෙනුණා. ඒ කෙසේ වුවත් මේ රටේ සිටින ප්‍රගතිශීලීන් කවුරුද, ප්‍රතිගාමීන් කවුරුද කියා මහජනයා අවබෝධ කරගෙන සිටිනවා.

ගරු කථානායකතුමනි, අද මහජනයා තුළ ලොකු උද්යෝගයක් ඇති බව අපට පෙනෙනවා. මේ රටේ සංවර්ධනයක් ඇති කළ යුතුය යන හැඟීමක් මහජනයාගේ සිත් තුළ ඇති වී තිබෙනවා. අද වරායේ වැඩ කලින්ට වඩා වේගයෙන් කෙරෙන බව අපට පෙනෙනවා. කම්කරුවන් වෙනදාට වඩා සහයෝගයෙන් හා උද්යෝගයෙන් යුතුව වැඩ කරන බව පෙනෙනවා. අනාගතය පිළිබඳව ලොකු බලාපොරොත්තුවක් හා විශ්වාසයක් ඇතිවයි, ඔවුන් අද වැඩ කරන්නේ. ඒ නිසා නුදුරු අනාගතයේදීම මේ රටේ විශාල දියුණුවක් ඇති වේයයි අපට විශ්වාස කරන්න පුළුවනි.

1956 ට පෙර මේ රටේ තිබුණේ සාමාන්‍ය මහජනයාගේ ආණ්ඩුවක් නොවෙයි. සාමාන්‍ය මහජනයාගේ සිතුම් පැතුම් අනුව කටයුතු කෙරුනු ආණ්ඩුවක් නොවෙයි. ඒ නිසා 1956 දී මහජන ආණ්ඩුවක් පිහිටු වූ පසු රටේ සෑම කොටසක්ම තම අයිතිවාසිකම් පිළිබඳව හැඟීම් ඇති කරගෙන නැඟී සිටියා. මේ අපේ ආණ්ඩුවය, ඒ නිසා අපේ අයිතිවාසිකම් දැන්වත් ලබාගත යුතුය යන හැඟීමක් ඇතිව මේ රටේ සිටින ගුරුවරුනුත්, භික්ෂූන් වහන්සේලාත්, වෛද්‍යවරුනුත්, කම්කරුවනුත් යන සෑම කොටසක්ම නැඟී සිටියා. ඒ නිසා මේ ඉල්ලීම් ඉෂ්ට කරන අතර බොහොම අමාරුවෙනුයි, ආණ්ඩුව කටයුතු කරගෙන යාමට සිද්ධ වූයේ. ඒ ඉල්ලීම් ඉටු කරන අතර සිංහල භාෂාව මේ රටේ රාජ්‍ය භාෂාව කොට රටේ සංස්කෘතියටත් තැනක් දී ක්‍රියා කිරීම හේතු කොටගෙන ආණ්ඩුව කෙරෙහි මහජනයාගේ පැහැදීමක් ඇති වුණා. එසේ වුවත් තම අයිතිවාසිකම් දිනාගත යුතුය යන හැඟීමත් සෑම කොටසක් තුළම ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

වුණා. එය ස්වාභාවික දෙයක්. මධ්‍යස්ථ භාවයෙන් සිට කල්පනා කරන අය එදාට වඩා අද රටේ දියුණුවක් ඇති වී තිබෙන බව පිළිගන්නවා ඇති.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) රටේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව කථා කළා. අපේ ආරෝග්‍ය ශාලාවල ඉඩ ඇත්තේ නැත, ඇඳන් ඇත්තේ නැත යනාදී වශයෙන් ප්‍රකාශ කළා. අපේ ආරෝග්‍යශාලාවල අඩුපාඩුකම් තිබෙන බව ඇත්තයි. එහෙත් ආසියාවේ අනික් රටවල් දෙස බලන විට අපේ රටේ උසස් සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව අප විසින් පිළිගත යුතුයි. මැලේරියා වැනි රෝග වැළැදීම නැවැත්වීම සඳහා ආණ්ඩුව සෑහෙන පමණ කටයුතු කර ඇති බව අප පිළිගත යුතුයි.

ඒ වාගේම රාජාසන කථාවේ මෙසේ සඳහන් වී තිබෙනවා:

"රජයේ වැඩ කටයුතුවලට බාධා කරන හෝ අකාර්යක්ෂම හෝ සහයෝගය නොදෙන සියලුම රජයේ සේවකයින් අනිවාර්ය වශයෙන් විශ්‍රාම ගැන්වීමට අවශ්‍ය රෙගුලාසි සම්පාදනය කරනවා ඇත."

ගරු කථානායකතුමනි, මෙය වැදගත් කාරණයක්. රජය මොන තරම් නීති රීති සම්මත කළත් වැඩ කරන නිලධාරීන්— සියල්ලන්ම නොවෙයි සමහර නිලධාරීන්— ඒවා කඩා කප්පල් කරන බව අපි දන්නවා. ඒ නිසා අප සම්මත කරන නීති රීතිවල නියම ප්‍රයෝජනය මහජනතාවට ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මේ වගන්තිය අනුව ක්‍රියා කිරීම ඉතාම අවශ්‍යයි. මහ ජනතාවගේ යහපත සඳහා පාර්ලිමේන්තුවේ සම්මත කරන නීති රීති නිලධාරීන් නියමාකාරයට ක්‍රියාත්මක නොකළොත් කවදාවත් ඒවායින් මහජනතාවට ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. දේශපාලන හේතූන් උඩ හෝ වේවා, රජයේ වැඩ ඕනෑකමින්ම කඩාකප්පල් කරන නිලධාරීන් සිටින නිසා මේ වගන්තිය අනුව ඉක්මණින්ම ක්‍රියා කළ යුතුයි. එවැනි නිලධාරීන් අනිවාර්යයෙන්ම විශ්‍රාම ගැන්වීම වැදගත් කාරණයක්. එසේ නොකළොත් රජය ඉක්මණින් වැඩ කරනවාය යන ප්‍රතිපත්තිය ගැන මහජනතාව තුළ තිබෙන අවබෝධය නැතිවෙන්න පුලුවන්. ඒ නිසා මෙය ඉතාම වැදගත් අදහසක්. එය ඉක්මණින්ම ක්‍රියාත්මක කළ යුතුයි.

ඒ සමගම ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) ජීවන වියදම් ප්‍රශ්නය ගැනත් එතුමාගේ කථාවේදී සඳහන් කළා. ජීවන වියදම අධිකය, අවශ්‍ය බඩු ගන්න ක්‍රමයක් නැත කියා එතුමා කීවා. ජීවන වියදම සෑහෙන ප්‍රමාණයකට ඉහළ ගිය බව අපි දන්නවා. නමුත් ජීවන වියදම එසේ ඉහළ යාමට හේතු මොනවාද කියා අපි කල්පනා කර බලන්ට ඕනෑ. මේ රටට බඩු ගෙන්වීම සීමා කළේ ඇයි? මේ නිසා බඩු හිඟයක් ඇති වුණාය කියායි ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා කිවෙ. නමුත් නාන්සේලා දන්නවා 1956 ට පෙර ඉතාම සුලු වශයෙනුයි මේ රටේ යම් යම් කර්මාන්ත තිබුණේ. නමුත් දැන් අප කර්මාන්ත 400 ක වැඩ ආරම්භ කිරීම නිසා මේ රටේ කර්මාන්ත යුගයක් උදාවී තිබෙනවා. ඒ කර්මාන්තවලින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය අලෙවි කර ගන්ට නම් පිටරටවලින් ගෙන්වන බඩු සීමා කරන්ට ඕනෑ. ඒ නිසයි බඩු ගෙන්වීම සීමා කළේ. අපි දන්නව හැම දෙනාම අවංක නැහැ. සමහර නිෂ්පාදකයන්ගේ නොයෙක් උපක්‍රම නිසා මේ රටේ නිෂ්පාදනය කරන ටයර් ටියුබ්, ගිනි පෙට්ටි, ටෝච් බැටරි ආදිය වුවමනා ප්‍රමාණයට මහජනයාට ලැබෙන්නෙ නැහැ. ඒ නිසා ගිනි පෙට්ටි ආදියේ මිළ ඉහළ ගොස් තිබෙනව. මේ ව්‍යාපාර රජයට නොගන්නේ මන්ද කියාත් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. නමුත් දැන් අපි සූදානම් කර තිබෙනවා, මේ ටයර් ටියුබ්, ගිනි පෙට්ටි, ටෝච් බැටරි ආදිය රජය මගින් ලබා ගෙන රජය මගින් මහජනයාට බෙදා දීමේ වැඩ පිළිවෙළක්. නොබෝ දිනකින් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා ඇති.

ගරු කථානායකතුමනි, බඩු සැඟවීම සම්බන්ධයෙන් රාජාසන කථාවේ මෙසේ සඳහන් වෙනව:

"බඩු සැඟවීම, කළුකඩ වෙළඳාම හා දූෂණතා මුලිනුපුටා දැමීම සඳහා බඩු බෙදා හැරීමේ කටයුතු පරීක්ෂා කර බැලීමේ නීත්‍යානුකූල බලතල සහිත ජනතා මණ්ඩල සෑම පළාතකම ඇති කිරීමට නිසි පියවර ගන්නවා ඇත."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බඩු සැඟවීම හා කළුකඩ වෙළඳාම සම්බන්ධයෙන් කටයුතු කිරීමට මිල පාලන පරීක්ෂකවරුන් සිටින බව අපි දන්නවා. නමුත් ඔවුන් හරියාකාරව ක්‍රියා කරන්නෙ නැහැ. ඒ නිසා තමයි අපි මේ ජනතා මණ්ඩල ඇති කර ඒවා මගින් බඩු සැඟවීම, කළුකඩ වෙළඳාම හා දූෂණතා මුලිනුපුටා දැමීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙන්නෙ. මේ කරුණු අනුව ජීවන වියදම අඩුවීමෙන් මහජනතාවට ඇති වී තිබෙන හිරිහැරය, කරදරය මග හරින්ට පුලුවන් වේය කියා අපට විශ්වාස කරන්ට පුලුවන්. එපමණක් නොව අප දැනටමත් කම්කරුවන් අතර කම්කරු මණ්ඩලත් පිහිටුවා ඒ මගින් කම්කරුවන් අතර උද්‍යෝගයක් ඇති කිරීමටත්, එමෙන්ම ඒ ඒ ආයතනවල දූෂණ පැහැදිලිව පරීක්ෂා කර බලා ඒවායේ දියුණුවක් ඇති කිරීමටත් කටයුතු කරගෙන යනවා. මේ වැදගත් කරුණු රාජාසන කථාවේ සඳහන් වී තිබෙන නිසා මේ කථාව හිස් එකක්ය, පුස් එකක්ය කියන කීම ප්‍රතිෂ්ඨා විරහිත කීමක් බව මා මතක් කරන්ට ඕනැ.

භාෂා ප්‍රශ්නය පිළිබඳවත් මේ රාජාසන කථාවේ සඳහන් වී තිබෙනවා. ෆෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන් මේ පිළිබඳව නොයෙක් අදහස් ප්‍රකාශ කළා. ඒ සම්බන්ධයෙන් මාත් වචන සවල්පයක් ප්‍රකාශ කරන්ට ඕනැ. සිංහලය මේ රටේ රාජ්‍ය භාෂාව කරන්ට කලින් මේ රටේ කවුරුත් රාජ්‍ය භාෂාව වශයෙන් සැලකුවේ ඉංග්‍රීසියි. සිංහල, දෙමළ, මුස්ලිම් යන අපි කවුරුත් කිසිම ප්‍රශ්නයක් නැතුව එකල ඉංග්‍රීසි ඉගෙන ගත්ත. එහෙත් සිංහලය මේ රටේ රාජ්‍ය භාෂාව වීමෙන් පසු, එය පිළිගන්ට සමහරුන්ට බොහොම අමාරුයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් සිංහල ගුරුවරුන් 2,000ක් උතුරු පළාතට යවනවාය කියන ආරංචියට, දැන් උපවාසයක් කිරීමට ෆෙඩරල් පක්ෂය සූදානම් වන බව අපට දැනගන්ට ලැබී තිබෙනවා. දෙමළ මහජනතාව හැමදාම මුළා නොකර, ඔවුන්ට සිංහල භාෂාව ඉගෙන ගෙන අනාගතය පිළිබඳව වගකීමක් ඇති උදවිය හැටියට ජීවත්වීමට අවස්ථාවක් ලබා දෙන ලෙස ෆෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මා මතක් කරන්ට සතුටුයි. ෆෙඩරල් පක්ෂයේ මන්ත්‍රීවරුන් කෙසේ කිව්වත් දෙමළ ජනතාවගෙන් වැඩි දෙනකු තුළ සිංහල භාෂාව ඉගෙන ගැනීමට ලැදිකමක් හා ඕනෑකමක් තිබෙන බව මා දන්නවා. සමහර විට ඇතැමුන් හොරෙන් පවා සිංහල ඉගෙන ගන්නවා. එදා කිසිම වාද භේදයක් නැතිව ඉංග්‍රීසි පිළිගත්ත. පාලක පක්ෂය හැටියට, දෙමළ ජනතාවට ජාති භේදයෙන් තොරව සිංහල ඉගෙන ගැනීමේ වරප්‍රසාදය ලබා දීම අපේ යුතුකමක්ව තිබෙනවා. ඒ යුතුකම උඩයි, සිංහල ගුරුවරුන් 2,000 ක් ඒ පළාත්වලට යවන්ට තීරණය කළේ. උපවාස කළත්, වෙන මොනයම් දෙයක් කළත් රජය ඒ ගුරුවරුන් යැවීමට කළ තීරණය වෙනස් කරන එකක් නැහැ කියා මා බලාපොරොත්තු වෙනවා. දෙමළ ජනතාවට සිංහල භාෂාව ඉගෙනීමට අවස්ථාවක් සැලසීමෙන්, සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාවට මේ රටේ එකම සහෝදර පිරිසක් වශයෙන් ජීවත්වීමට ඉඩ ලැබෙනවාට කිසිම සැකයක් නැහැ.

පූ. භා. 11.6

**ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්** (නාත්තන්ඩිය)

*(சேர் அல்பேட் எப். பீரிஸ்—நாத்தாண்டிய)*

(Sir Albert F. Peries—Nattandiya)

ගරු කථානායකතුමනි, මට ලැබී තිබෙන්නෙ මිනිත්තු 15 යි. ඒකත් මට ලැබුණේ මූලාසනයේ කැමැත්තෙන්. මිනිත්තු 15 කින් මොනවා කියන්ටද කියායි, මා කල්පනා කරන්නෙ. අද රටේ තත්ත්වය දෙස බලන විටත්, රාජාසන කථාවේ සඳහන් කරුණු දෙස බලන විටත් මිනිත්තු 15කින් යමක් කීම බොහොම අමාරු දෙයක්. එහෙත් ඉතා ලුහුඩු ලෙස වචනයක් දෙකක් කථා කරන්ට සතුටුයි. දැන් බදුල්ලේ ගරු මන්ත්‍රීවරයා (බී. එච්. බණ්ඩාර මයා.) කියන්ට යෙදුණා, හවුල් ආණ්ඩුව හෙවත් සමගි ආණ්ඩුව ගැන. ඒ හවුල් රජය මහජනයාගෙන් වැඩි දෙනෙක් බොහොම සන්තෝෂයෙන් අත්පොළසන් දී පිළිගත්තාය කිව්ව. මා දැනගන්ට සතුටුයි, කොහොමද ඒ වැඩි දෙනා සොයාගත්තෙ කියා. මහජනයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවට ඡන්දය දුන්නෙ ඒ ආණ්ඩුව මගින් මේ රටේ වැඩ කටයුතු කරගෙන යන්ටයි. නමුත් හවුල් ආණ්ඩුවකට ඇතුළුවීමේ කැමැත්තක් දුන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්]
හරි පිළිවෙළ නම්, එහෙම හවුල් ආණ්ඩුවට ඇතුල් වෙන්න පෙර ඒ අදහස් මහජනතාවට ප්‍රකාශ කර මහජනතාවගේ ඡන්දය ඒ සඳහා ලබා ගැනීමයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඔය හවුල් ආණ්ඩුවට ඡන්දය දුන්නා.

**ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්**
*(சேர் அல்பேட் எப். பீரிஸ்)*
(Sir Albert F. Peries)
කොයි වෙලාවේද ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
එල්. එස්. එස්. පිය සම්බන්ධවෙලයි ඡන්දය පැවැත්තුවේ.

**ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්**
*(சேர் அல்பேட் எப். பீரிஸ்)*
(Sir Albert F. Peries)
හවුල් වෙලා ඉදිරිපත් වුණා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්ම 76 දෙනකු පත් කර ගන්නට මහජනතාව ඡන්දය දෙන්නෙ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් 76 දෙනකු තෝරා ගැනීමෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවා ගන්නටයි මහජනතාව ඡන්දය දී තිබෙන්නෙ. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවේ හරි වැඩ පිළිවෙළක් නැති නිසා හෙල්ලි හෙල්ලී තිබුණා කොයි වෙලේ වැටේද කියා. අන්න ඒ නිසා තමයි, ලංකා සමසමාජ පක්ෂය මුක්කු ගහලා, සමගි ආණ්ඩුවක් කියා එකක් පිහිටුවා ගත්තෙ.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සෙ දන්නවා ලංකා සමසමාජ පක්ෂය අවුරුදු තිහක පමණ කාලයක් තිස්සෙ මේ රටේ පාලන බලය ලබාගන්නට උත්සාහ කළ නමුත් බැරි වුණු බව. දකුණු කොළඹ පළමුවැනි මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) කීවා වාගේ දැන් පස්සා දොරෙන් ඇතුල් වී ඒකටත් ඉඩ ලැබී තිබෙනවා. යම්කිසි විධියකින් හවුල් ආණ්ඩුවක් පිහිටුවීම සඳහා මහජනතාවගේ ඡන්දය විමසුවා නම් මහජනතාව මෙයට විරුද්ධ වන බව දන්නවා. තව ටික දවසකින් මහජන අදහස් විමසීම සඳහා ඡන්දයක් පැවැත්වුවොත් ඒ බව හොඳින් පෙනී යනවාට කිසිම සැකයක් නැත කියායි මගේ විශ්වාසය. රාජාසන කථාවෙහිත් මේ බව සඳහන් වෙන නිසාත්, දෙහිඹිවිට ගරු මන්ත්‍රීවරිය (සෝමා වික්‍රමනායක මිය.) ඒ ගැන සඳහන් කර ඇති නිසාත්, ඊට පිළිතුරු දීමටයි මා කල්පනා කළේ.

ඒ වාගේම රාජාසන කථාවෙහි මේ රට සංවර්ධනය කරන ආකාරය පිළිබඳව, ආර්ථික තත්ත්වය දියුණු කිරීම පිළිබඳව, කිසිම අන්දමක විස්තරයක් අඩංගු වෙන්නේ නැති බව ප්‍රකාශ කරන්නට ඕනෑ. සංවර්ධනය සම්බන්ධවත්, රැකීරක්ෂා රහිත ප්‍රශ්නය විසඳීම සම්බන්ධවත් මොන විධියේ වැඩ පිළිවෙළක් රජය මගින් අනුගමනය කරන්නට බලාපොරොත්තු වෙනවාද කියා සඳහන් වෙන්නෙ නැහැ. කර්මාන්ත සංවර්ධනය ගැනත් කාරණා සඳහන් කර නැහැ. එම නිසා අප දැනගන්නට සතුටුයි, මොන තරම් දුරට කර්මාන්ත සංවර්ධනයක් කරන්නට රජය බලාපොරොත්තු වෙනවාද කියා.

ගරු කථානායකතුමනි, පේස කර්මාන්තය සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී යමක් සඳහන් කිරීම වැදගත් යයි මම කල්පනා කරනවා. දැනට මේ රටේ පේස කර්මාන්තයෙහි හැට දහසක් පමණ දෙනා යෙදී සිටින බව අප දන්නවා. විශේෂයෙන්ම නාත්තන්ඩිය සමුපකාර සමිති සංගමය යටතේ හාර දහස් පන්සියයක් පමණ කාන්තාවෝ පේස කර්මාන්තයෙහි යෙදී සිටිනවා. හාර දහස් පන්සියකට නොවෙයි, විසි පන්දහසකට නොවෙයි, පනස් දහසකට නොවෙයි, ලක්ෂ ගණනකට වුණත් රක්ෂාව ලබා දෙන්නට පුළුවන් අන්දමටයි මෙම සමුපකාර සංගමය පිහිටුවා තිබෙන්නෙ. නමුත් ආණ්ඩුවේ ප්‍රතිපත්තියක්ය කියා මේ පේස කර්මාන්ත සමිති සියල්ලක්ම ආණ්ඩුවට අරගෙන තිබෙනවා. එම සංගමයේ සභාපති වශයෙන් මා කටයුතු කළ නිසා ඒ ගැන කනගාටු වෙන්නෙ නැහැ. මා පම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ණක් නොවෙයි, තවත් මහත්වරුන් රාශියක්ම තමන්ගේ කාලයත් ශ්‍රමයත් වැය කරමින් කිසිම මුදලක් ලබාගන්නේ නැතුව, අඩු ගණනේ ගමන් වියදම්වත් ලබා ගන්නේ නැතුව, සංගමයේ දියුණුව සඳහා වැඩ කටයුතු කළා. එම නිසාම සංගමය ඉතාමත් හොඳ තත්ත්වයකින් පවත්වා ගෙන එමින් විශාල සංඛ්‍යාවකට රක්ෂාව දී තිබෙනව. නමුත් අද එය ආණ්ඩුවට පවරා ගෙන වැඩ කටයුතු ගෙන යනව. දැනට ආණ්ඩුව මගින් නිලධාරීන් පත් කර එහි වැඩ කටයුතු නිසියාකාර ගෙන යන නිසා අප ඒ ගැන සන්තෝෂ වෙනව. අපේ හිසේ තිබුණු ලොකු බරක්— විශාල ගණනකට රක්ෂාව දෙමින් නිසි අන්දමට පාලනය කරගෙන යාම— අපෙන් දැන් නිදහස් වී තිබෙනව. අප සන්තෝෂ වෙනවා ආණ්ඩුව මගින් ඒ කටයුතු ගෙන යාම ගැන. එය හොඳින්, ලක්ෂණට පවත්වා ගෙන යනවා නම් අපට හැකි සෑම ආධාරයක් කිරීමට අප හැම අවස්ථාවේදීම උත්සාහ දරන බව කියන්නට කැමතියි. නමුත් අප කනගාටු වෙනවා, "ඔබ්සවර්" පත්‍රයේ පළවූ ලිපියකින් අපට පෙනී ගියා, තවදුරටත් අත් යන්ත්‍රවලින් වැඩ කිරීමට බැරි තත්ත්වයක් ඇති වී තිබීම ගැන. මොකක්ද මේ ඇති වී තිබෙන තත්ත්වය ? "සිලෝන් ටෙක්ස්ටයිල් චේම්බර්" කියා ඉන්දියන් කාරයන්ගේ සමාගමක් තිබෙනව. ඒ සමාගමටයි රෙයොන් රෙදි විවීම භාර කර තිබෙන්නෙ. ඒ සමාගම පිළිබඳ ලියවිල්ලක් ජුලි මාසයේ 11 වන සෙනසුරාදා "ඔබ්සවර්" පත්‍රයේ පළ කර තිබෙනව. මේ ලිපිය ලියා තිබෙන්නෙ රෙදි වියන්නකු විසිනුයි. ඉන්දියානු සමාගමකට විදුලි බලය යොදා රෙදි විවීමට මාර්ග සලසා දීම ගැන එක්තරා රෙදි වියන්නකු හොඳ ලියවිල්ලක් පත්‍රයේ පළ කොට තිබෙනවා. එහි කොටසක් මා කියවන්නට කැමතියි :

"In a few months the textile market will be flooded with cheap rayons unfit and unhealthy for tropical wear, but the ordinary man will be compelled to purchase them due to the cheapness of the material. What is going to happen to the 60,000 poor folk engaged in the manufacture of cotton goods ?"

60 දාහකටත් වැඩි වූ රෙදි විවීමේ කර්මාන්තයේ යෙදී සිටින්නවුන්ගේ යහපත ගැන ආණ්ඩුව කල්පනා කර බැලිය යුතුයි. මෙයට ටික කලකට පෙර නොයෙක් අවස්ථාවන්හිදී අත් යන්ත්‍රවලින් රෙදි වියන්නන් වෙනුවෙන් අප කර්මාන්ත ඇමතිවරයා සමග සාකච්ඡා කොට තිබෙනවා. අත් යන්ත්‍රවලින් රෙදි වියන උදවියට සහනයක් සැලසීමක් වශයෙන් ඔවුන් සඳහා වෙනම රෙදි "කෝටා" එකක් දෙන බවට ගරු ඇමතිවරයා පොරොන්දු වුණා. ඒ රෙදි "කෝටා" එක විදුලි බලය ආධාර කොට ගෙන රෙදි වියන්නන්ට නොදෙන බව ගරු ඇමතිවරයා ප්‍රකාශ කළා. එම නිසා මින් ඉදිරියටත් මේ පොරොන්දුව අනුව වැඩ කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. මේ පොරොන්දුව ඉටු නොකළහොත් ගම්බද දුප්පත් ජනයාට ලොකු පහරක් වදින බව තේරුම් යා යුතුයි. අත් යන්ත්‍ර මාර්ගයෙන් රෙදි විවීමේ යෙදී සිටින ගම්බද දුප්පත් ගැහැණු ළමයකුට මාසයකට රුපියල් 150ක් තරම උපයා ගන්නට පුළුවනි. එක පවුලක තුන් හතර දෙනකු ඒ කර්මාන්තයේ යෙදී සිටින විට අමාරුවක් නැතිව ඔවුන්ට ජීවත් වෙන්නට පුළුවනි. එම නිසා ඒ දුප්පත් ගැමියන්ට පහර වැදෙන ආකාරයට කටයුතු නොකරන්නට ආණ්ඩුව වගබලා ගන්නවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ජීවන වියදම ගැනත් බොහෝ ගරු මන්ත්‍රීවරුන් විසින් කියන්නට යෙදුණා. ජීවන වියදම ඉතාමත්ම ඉහළ ගොස් තිබෙන නිසා අද ගම්බද ජනතාව ඉතාමත් භයානක තත්ත්වයකට මුහුණපා සිටිනවා. තේ කෝප්පයේ උපකාරයෙන් දවස පසු කරන අය ගම්බද බොහෝ සිටිනවා. සමහර විට ඔවුන් වේල පසු කරන්නේ නිකම් තේ කහට කෝප්පයකින් පමණයි. එම නිසා ගැමි ජනතාවගේ දුක ගැන සලකා බලා කෙසේ හෝ ජීවන වියදම අඩු කරන්නට කටයුතු යොදන ලෙස මා ඉල්ලා සිටිනවා. ජුනි මාසයේ ජීවන වියදම ඉතාමත්ම ඉහළයි. මෙම ජුලි මාසයේ ජීවන වියදම ගණන් බැලූ විට තත්ත්වය කෙසේ වේදැයි කියන්නට බැහැ. රාජාසන කථාවේ යෝජනා කර තිබෙන ක්‍රම අනුව නම් ජීවන වියදම අඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් ඇල්බට් එෆ් පීරිස්]

වෙතැයි සිතන්නට බැහැ. ජීවන වියදම අඩු කිරීමට නම් රාජාසන කථාවේ අඩංගු කරුණු නොව වෙනත් කරුණු ක්‍රියාවට පරිවර්තනය කළ යුතුයි. ඒ කරුණු ගැන කියා දෙන්නට වුවද මට පුළුවන්කම ඇතත් දැන් ඒ සඳහා වෙලාවක් නැහැ. ඇත්තෙන්ම ජීවන වියදම කෙසේ හෝ අඩු කෙළේ නැත්නම් ගම්බද ජනතාව මිය යන තරම් භයානක තත්ත්වයක් ඇති වෙන්නට පුළුවනි. දැන් තිබෙන තත්ත්වය අනුව රෙදි කෑල්ලක් මිලයට ගන්න බෑ. රෙදි යාර 3ක් ලබා ගෙන මොනවා කරන්නද ? බඩු සීමා කිරීම් නොකොට වුව මනා තරම් බඩු වෙළෙඳ පොළට වැටෙන්නට සැලැස්සුවේ නැත්නම් බොහෝ කරදර වලට මුහුණ පාන්නට මේ රටේ ජනතාවට සිදු වෙනවා ඇති.

ගරු කථානායකතුමනි, මේ වර පාර්ලිමේන්තුව විවෘත කිරීමේ උත්සවය සඳහා අපට ලැබුණු ආරාධනා පත්‍රවල කළු පාට ඉරක් ගසා තිබුණා. මේ කළු පාට ඉර කුමන අදහසක් අනුව යෙදුවාදැයි මා දන්නේ නැහැ. මොකක් හෝ දුකක්, කනගාටුවක් ප්‍රකාශ කිරීම සඳහා ඒ කළු ඉර යෙදුවා වෙන්නට ඇති· මොකක්ද මේ කනගාටුවට හේතුව? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මැරුණු නිසාද? ලංකා සමසමාජ පක්ෂය අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු නැති කරන්න යන නිසාද? අප ඒ ගැන පිළිතුරක් දැනගන්න කැමතියි.

ගරු කථානායකතුමනි, කොයි අතින් කල්පනා කර බැලුවත් මේ රාජාසන කථාව ගැන සතුටු වන්නට පුළුවන්කමක් නැහැ. අනික් කරුණු ගැන මෙන්ම අධ්‍යාපනය ගැන සලකා බැලුවත් අපට සතුටු වන්නට බැහැ. අධ්‍යාපනය හැඩ ගැස්වීම සඳහා කරුණු යෝජනා කිරීම පිණිස කොමිෂන් සභා 3ක් පත් කළා. ඒ කොමිෂන් සභා මගින් ඉදිරිපත් කරන ලද වාර්තා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නැවතත් සංශෝධනය කරගෙන යන බව දැනගන්නට තිබෙනවා. එසේ කරන්නට හේතුව කුමක්ද කියා අපට තේරෙන්නේ නැහැ. අපේ පාඨශාලා දිනෙන් දින අබල දුබල වෙනවා. ළමුන් නරක් වේගෙන යනවා. ගුරුවරුන් හරියාකාර උගන්වන්නෙ නැහැ. ඒවා ගැන බොහොම කනගාටුයි.

අපි ලංගම මගින් කරගෙන යන බස් ව්‍යාපාරය ගැන බලමු. පාරේ යන විට තමුන්නාන්සේලාට පේනව ඇති, දිනකට කොතරම් විශාල සංඛ්‍යාවක් බස් නැතුව පාර අයිනෙ සිටගෙන ඉන්නවද කියන එක. අළුතින් පත් වී සිටින ඇමතිතුමා මෙම අංශය ගැන බොහොම උනන්දුවෙන් වැඩ කරන බව පේනව. මේ විධියට කටයුතු කර ලංගම මගින් කරගෙන යන බස් සේවාව හොඳින් දියුණු කළොත් අපි එතුමාට ස්තුතිවන්ත වෙනව.

ආරෝග්‍යශාලා පිළිබඳව ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය. ඩබ්ලිව්. දහනායක) මතක් කළා. එම කරදර ලංකාවෙ සෑම පළාතකම වාගෙ පවතිනව. එම නිසා එවා ගැන කල්පනා කර බලා සුදුසු වැඩ පිළිවෙළක් යොදන්නය කියා මා ඉල්ලා සිටිනව.

මෙම රාජාසන කථාවෙ ධීවර කර්මාන්තය ගැන කිසිවක් කියා නැහැ· අපේ ලංකාව දූපතක්. මෙම දූපත වටේම මුහුද තිබෙනව. එම මුහුදෙ මාළු බහුලව සිටිනව. අපේ කෑමට අවශ්‍ය කරන සම්පූර්ණ මාළු ප්‍රමාණය අපේ රට වටේට තිබෙන මුහුදෙන් සපයා ගන්න පුළුවනි. එම නිසා ඒ ගැන හොඳ ක්‍රමයක් යොදන ලෙස මා ඉල්ලනව. රෙදි පිළිබඳ සංගමය වාගෙ සංගමයක් මේ ධීවර අංශය පිළිබඳවද පිහිටුවා ක්‍රියා කළොත් කිසි කරදරයක් ඇති වන්නෙ නැහැ. වුවමනා පමණටත් වඩා මාළු අපට ඒ ආකාරයෙන් ලබා ගන්න පුළුවනි. වෙනෙකක් තබා පිටරටවලටත් යවන්න පුළුවන් වෙනවට කිසි අනුමානයක් නැහැ. දැන් ධීවර කර්මාන්තයෙහි යෙදෙන්නන්ට යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන බෝට්ටු දෙන්නෙ සීමා සහිතවයි. ඒවා ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර සෑම පළාතෙන්ම ලැබෙනව· ඒ නිසා ධීවර ව්‍යාපාරිකයන්ට යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරන බෝට්ටු දීම පිළිබඳව සුදුසු ක්‍රමයක් ඇති කරන්න ඕනැ.

ගරු කථානායකතුමනි, අපේ පාර්ලිමේන්තුවෙ කථාවලට දෙන කාලය සීමා කරන්න යනවාය කියන ආරංචියක් පැතිර තිබෙනව. ඒ ගැන මා විරුද්ධත්වය ප්‍රකාශ කරනව. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමත් ඒ ගැන කීව. "Criticism is the essence of democracy" කියා ඉංග්‍රීසියෙන් යෙදුමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තියෙනව. එහි තේරුම නම්, "විවේචනය ප්‍රජාතන්ත්‍රවාදයෙහි ජීවයය" යන්නයි. විවේචනය කරන්නෙ නැති නම්, "ක්‍රිටිසයිස්" කරන්නෙ නැති නම් එතැන ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. එම නිසා පාර්ලිමේන්තුවෙ කථාවලට දෙන වේලාව සීමා කරන්න හොඳ නැහැ. ස්ථාවර නීති රීති ක්‍රියාවෙ යෙදීමෙදී ගරු කථානායකතුමාටත් හුඟක් බලතල තියෙනව. එම නිසා කථාවලට දෙන කාලය සීමා නොකර කටයුතු කරන ලෙස මා එතුමාගෙන් ඉල්ලනව. විනාඩි 15ක කතාවක් පැවැත්වීමට මට අවස්ථාවක් ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

පූ. භා. 11.20

**පී. ආර්. රත්නායක මයා. (ප්‍රවාහණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. பீ. ஆர். ரத்நாயக்க—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. P. R. Ratnayake—Parliamentary Secretary to the Minister of Communications)

ගරු කථානායකතුමනි, මෙම ආණ්ඩුවෙ 5 වන රාජාසන කථා විවාදයෙදි වචන ස්වල්පයක් මෙසේ කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා පළමු කොට සන්තොෂ වෙනව. මේ ඉදිරිපත් කර ඇති රාජාසන කථාව ගැන කල්පනා කරන විට අපට සාකච්ඡා කරන්න තියෙන ප්‍රධානම දෙය නම්, මේ රාජාසන කථාව මගින් ඉදිරිපත් කර තියෙන වැඩ පිළිවෙළට අනුව අපේ ජනතාවට මුහුණ පාන්න සිදු වී තිබෙන ප්‍රශ්න විසඳන්න පුළුවන් වේද යන කාරණයයි. නමුත් අපේ සමහර දේශපාලන නායකයන්, විශෙෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ අය, උත්සාහ කළේ මෙම රාජාසන කථාවේ සඳහන් කරුණු විවෙචනය කරනවාට වඩා හැකි තරම් දුරට මහජනතාව මුලා කරන්න පුළුවන් වන ආකාරයට යම් යම් කරුණු ඉදිරිපත් කිරීමටයි. නමුත් නාන්සෙට මතක ඇති ඊයේ අපේ කොලොන්නෙ ගරු මන්ත්‍රීතුමා (මැතිව් මයා.) කළ කථාව එතුමාගෙ කථාවෙන් පුළුවන් තරම් උත්සාහ කළේ අසාධාරණ ලෙස ආණ්ඩු පක්ෂයට පහර ගහන්නයි. ජනතාව තුළ වැරදි අවබෝධයක් ඇති කරන්න කථා කළා. නාත්තන්ඩියේ ගරු

මන්ත්‍රීතුමාගෙ කථාව ගැන මම එතුමාට දොස් කියන්නෙ නැහැ. අනික් අයට පහර ගහන්නෙ නැතුව, දේශපාලනඥයෙක් වශයෙන් එතුමාගේ අදහස් අවංකව ඉදිරිපත් කිරීම ගැන මම එතුමාට ප්‍රශංසා කරනව. නමුත් එතුමා කී එක කරුණක් ගැන මම වචනයක් කියන්න කැමතියි. මහජනයාගෙන් අවසරයක් නොගෙන හවුල් ආණ්ඩුවක් පිහිටු වීමට ආණ්ඩුවට බලයක් නැත කියා එතුමා කීව. නමුත් නමුන්නාන්සෙට මතක ඇති 1960 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට පත් වුණේ සමහර වාමාංශික කොටස්වලත් සහයෝගය ඇතිව බව. ඒ නිසා මා කල්පනා කරන විධියට මේ විධියේ සහභාග ආණ්ඩුවක් ඇති කිරීම ප්‍රමාද වුණා වැඩියි. ආණ්ඩුව බලයට පත්වීමත් සමගම, මේ වාමාංශික පක්ෂ සමග එකට එකතු වෙලා වැඩ කළා නම් මීට වඩා හොඳින් මේ රටේ ප්‍රශ්න විසඳන්නට පුළුවන්කම තිබුණ. ඒ නිසා ප්‍රමාද වී හෝ මේ ක්‍රියා මාර්ගය ගැනීම ගැන මගේ ස්තුතිය ගරු අගමැතිනියටත්, සමසමාජ පක්ෂයේ නායකතුමන්ලටත් පුද කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, හවුල් ආණ්ඩුවක් ඇති කරන්නට බලයක් නැත කියන එක්සත් ජාතික පක්ෂයෙන් මම එක ප්‍රශ්නයක් අහන්නට කැමතියි. රාජාසන කථාවට ස්තුති යෝජනාව ඉදිරිපත් කළ දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමත් (ලක්ෂ්මන් ජයකොඩි මයා.) ඒ ගැන සඳහන් කළා. 1942දී ඩී. එස්. සේනානායක අගමැතිතුමාගෙ පක්ෂය බලයට පත් වෙද්දී ලැබුණෙ ආසන 42යි. නමුත් ඒ අවස්ථාවෙදි දෙමළ භාෂාවට පනහට පනහේ අයිතිවාසිකම් ඉල්ලා සටන් කළ පොන්නම්බලම් මහත්මයගෙ ද්‍රවිඩ සංගමයත් ඈදා ගත්තා. තමාගෙ බලය වැඩි කර ගැනීමට තමාගෙ ආණ්ඩුව ශක්තිමත් කර ගැනීමට. ඒ අවස්ථාවෙදි ද්‍රවිඩ සංගමය සමග එකතු වීමට පෙර රටට ගිහින් බලයක් ලබා නොගත්තෙ ඇයි කියා මම එක්සත් ජාතික පක්ෂයෙන් අහන්න කැමතියි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ඒ නිසා තමයි, 1956දී ඒ අය පැරදුණේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்நாயக்க)*
(Mr. P. R. Ratnayake)

1956 දී පරදින්නට ඊට වඩා වෙන හේතු තියෙනව. ගරු කථානායකතුමනි, විවේචනය කරන්න අයිතියක් තිබෙන බව ඇත්තයි. නමුත් මේ විවේචනය කරන අයට යුතුකමක් තියෙනව, ඒ කාලයේදී තමන් කළ දේ ගැනත් ටිකක් සිතා බැලීමට. මේ රාජාසන කථාව පිළිබඳ විවාදයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පහර ගහනවට වඩා තදින් සමසමාජ පක්ෂයට පහර ගැසූ බව තමුන්නාන්සෙට පෙනෙන්න ඇති. සම සමාජ පක්ෂයේ නායකයන්ට පෞද්ගලික වශයෙන් පහර ගැහුව. සමසමාජ පක්ෂයේ නායක ගරු මන්ත්‍රීවරුන්ගෙ දේශපාලන අදහස් මොනවා වුණත් ඒ අය අවුරුදු ගණනක් තිස්සෙ මේ රටේ දේශපාලන සටනක් ගෙන ගිය පිරිසක්. නමුත් විශෙෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්, තවත් සමහර පක්ෂවල ගරු මන්ත්‍රීවරුන් ලංකා සමසමාජ පක්ෂයට පුදුම විධියට පහර ගැහුව. සමසමාජ පක්ෂයේ අය ඒ පැත්තෙ සිටිද්දී කී දේ ගැන මතක් කර මින් විශෙෂයෙන් කොලොන්නේ ගරු මන්ත්‍රීතුමා (මැතිව් මයා.) හෝමාගම ගරු මන්ත්‍රීතුමා (ගාමිණී ජයසූරිය මයා.) ආදී අය නොයෙකුත් විධියට පහර ගැහුව. පසු ගිය රාජාසන කථාව පිළිබඳ විවාදයේදී කී දේ ගැන මතක් කළා. එසේ චෝදනා කරන අතරෙදි එක්සත් ජාතික පක්ෂය කල්පනා කළ යුතුව තිබෙනව, 1956 දී ඒ අයගෙ ආසන ගණන 8 ට බස්වා මහජනයා ඔවුන් බලයෙන් තල්ලු කරන තුරු ඔවුන් කටයුතු කළ ආකාරය ගැන. රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේදී පක්ෂයක් වශයෙන් නොසිටියත් එක්සත් ජාතික පක්ෂයේ නායක වරුයි, මේ රට ආණ්ඩු කළේ. ඒ විධියට ඔවුන් මේ රට ආණ්ඩු කළ කාලයේදී, ඔවුන්ට බලය තිබුණ කාලයේදී, අද මහජනයාට දක්වන අනුකම්පාව දැක්වූවාද කියා මම අහන්න කැමතියි. එදා දුක් විඳින ජනයාට—සාමාන්‍ය ජනයාට—ඔවුන් කිසි අනුකම්පාවක් දැක්වුවෙ නැහැ. අද ඔවුන් විවේචනය කරනව. එදා ඇති වූ ජාතික ප්‍රශ්නවලදී අද කල්පනා කරන විධියට කල්පනා කර කටයුතු කළා නම් අද මේ විධියට විවේචනය කරන්න යුතුකමක් තිබුණ. නමුත් අද ඒ අය තුළ මේ රටේ මහජනයා කෙරෙහි තිබෙන අනුකම්පාව එදා නැති වීම අපේ අවාසනාවක්ය කියා මම කල්පනා කරනව. පැරදුණායින් පස්සෙවත් ඒ ගැන තව දුරටත් කල්පනා කරන්න වටිනව. ඡන්දය ගැනීමේ අදහස පමණක් පෙරදැරි කරගෙන කටයුතු කරන්නෙ නැතිව අවංක ලෙස කල්පනා කරනව නම් අපි බොහොම සන්තෝෂ වෙනව. සමාජවාදි සැලැස්මක් තමයි ඉදිරිපත් කර තිබෙන්නෙ. ඒ නිසා තමයි කියන්නෙ අවංක ලෙස කල්පනා කරනව නම් ඒ ගැන සොයා බලන්න පුළුවන් ක්‍රම කීපයක් තිබෙනවය කියල. අප කියන්නෙ ඇත්තද කියා සොයා බලන්න ඕනෑ අවංක හැඟීමකින් යුතුවයි. එහෙම නොකර විවේචන කිරීම සාධාරණ නැහැ.

එක්සත් ජාතික පක්ෂයෙ උදවිය 1956 වන තුරු බලයෙ රැඳිල හිටිය. ඒ කාලෙ ඔය කියන එක ප්‍රශ්නයක් ගැනවත් මේ ඇත්තො සලකා බැලුවෙ නැහැ. සලකා බැලුව බවට ලකුණක්වත් ඇත්තෙ නැහැ. ඒ නිසා වෙන්න ඕනෑ නේද, දැන් කියන්නෙ එතුමන්ලා දැන් අලුත්ම මිනිසුන් හැටියට ඉන්නවය කියල? ඒ කියමනත් විශ්වාස කරන්න පුළුවන්කමක් තියෙනවද? එහෙම නම් පසුගිය අවුරුද්දකදී නැවතත් වරක් තුන් මාසයකට තාවකාලික බලයක් ලැබී සිටි කාලෙ කොහොමද වැඩ කළ යුතුව තිබුණේ? ඒ වුණත් වැඩ කළේ කොයි විධියටද? ඒ කාලෙ ක්‍රියා කළ හැටි අපට මතකයි. අලුත් මාර්ගයකට පැමිණ ඉන්නවය කියන නමුත් ඒ කියමන සැබෑවක් නම් ඔය තුන් මාසෙ ඇතුළතදී වුණත් ඒ බව පැහැදිලිව පෙනෙන විධියට ක්‍රියා කරන්න ඉඩක් තිබුනෙ නැද්ද? සමාජවාදි ගමනක ඒ පක්ෂයත් යෙදෙන්න බලාපොරොත්තු වන බවක් තමයි දැන් කියන්නෙ. ඒ වුණත් අපට මතකයි තාවකාලික වශයෙන් කෙටි කාලයක බලයක් ලැබුණු අවස්ථාවෙ සමුපකාර තොග වෙළඳ ආයතනය වෙත පැවරී තිබුණු යම් යම් වැඩ පිළිවෙළවල් පෞද්ගලික වෙළෙන්දන්ට දෙන්න වැඩ කළ ආකාරය. එයිනුත් පැහැදිලි ලෙස පෙනී යනව ඔය පරණ ජාතියට ගිහිල්ල නම් මේ රටේ ජනතාව මුළා කරන්න බැරි බව. ඒ බව පෙනී ගිය නිසා අලුත් මුහුණු වරක් ඉදිරිපත් කර වෙනස් අන්දමකට ජනතාව මුළා කිරීමට දැන් වැඩ කරගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යනව මිස අවංක ලෙසත් සමාජවාදි ලෙසත් ක්‍රියා කිරීමට හෝ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කර දීම පිණිස හෝ ක්‍රියා නො කරන බවයි පෙනෙන්නෙ. ධනවාදි ප්‍රති පත්ති අනුගමනය කරන කවර ආණ්ඩුව කට වුණත් ලෝකයේ කවර රටකවත් පුළු වන් වුණාද සමාජවාදය සමාජවාදය කිය මින් කථා කළ පමණින් සමාජවාදය අනුව වැඩ කරගෙන යන්න? එවැනි තැන් කියන්න අමාරුයි. යම් යම් අවස්ථාවලදී කටයුතු කර තිබෙනවා පමණයි. අද එක් සත් ජාතික පක්ෂයත් කරන්නෙ එවැන් නක්මයි. කැලේ මාරු වුණාට කොටියගෙ පිල් මාරු වෙන්නෙ නැහැ කියල කතාවක් තියෙනව. ඒ වගේම කොයි තරම් දුරට වෙනසක් වෙලා තියෙනවය කියල පෙන් වන්න උත්සාහ කළත්, සමාජවාදය අනුව වෙනසක් එක්සත් ජාතික පක්ෂයට ඇති වෙලා තිබෙන බවක් පෙන්වන්න පුළුවන් කමක් නැහ.

අපට විරුද්ධව දැන් නොයෙක් විධියෙ චෝදනා ඉදිරිපත් කරනව. ප්‍රධාන වශ යෙන් කරන චෝදනාව තමයි, අප ආගම් නැති කරන්න උත්සාහ කරනවය කියන එක. මෙවැනි චෝදනා ගැන කල්පනා කර බලන්න ඕනෑ. දකුණු කොළඹ පළමු වන ගරු මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) තරම් පොත්පත් කියවන්න පුළුවන්කමක් අපට නැහැ. ඒ වුණත් සුළු වශයෙන්වත් අපිත් පොත්පත් කියවනව. ඒවායිනුත් අපට සෑහෙන තරම් කරුණු ඉදිරිපත් කරන්න පුළුවනි. එතු මන්ලා කොයි තරම් දුරට බොරුවෙන් රට මුළා කරන්න උත්සාහ කරනවද කියන කාරණය පෙන්වා දෙන්න සාධක ඕනෑ තරම් ඉදිරිපත් කරන්න පුළුවනි. 1947 සිට අද දක්වා දැනටමත් අවුරුදු පහළොව කටත් වැඩි කාලයක් ගතවෙලා තියෙනව. ඔය කාලය ඇතුළත එක්සත් ජාතික පක්ෂය මහජනයා මුළා කිරීමට පත්‍ර මාර්ග යෙන් කොයි තරම් දුරට වැඩ පිළිවෙළක් ගෙන ගොස් තිබෙනවද යන්න පෙන් වන්න පුළුවනි. එක්සත් ජාතික පක්ෂ යේ සතිපතා ප්‍රවෘත්ති පත්‍රය වන "සියරට" මගිනුත්—බේරේ ගෙදර වැනි ආයතන වලින් පිට වන පත්තර බොහොමයක්ම ධනපති පත්තර හැටියටයි ගණන් ගන්නෙ—නම වෙනස් වුණත් වෙනත් බොහෝ පත්‍ර මගිනුත් එදා සිට මහජනයා මුළා කිරීමට බොහෝ දුරට වැඩ කරගෙන යනව. 1947 දී සමසමාජ ගින්නෙන් බුද්ධ ශාසනය බේරා ගන්න ලෙස මහජනයා ගෙන් ඉල්ලා සිටින දැන්වීම් මුද්‍රණය කර ප්‍රචාරය කළ හැටි අපට මතකයි. 1951 දී එක්සත් ජතික පක්ෂයෙන් අස්වී ගොස් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවනු ලැබූ අවස්ථාවේ බණ්ඩාරනායක අගමැතිතුමා රට පාවා දෙන්න උත්සාහ කරනවය යනාදී වශයෙන් පත්‍රවල පළ කළ හැටිත් අපට මතකයි. මාක්ස්වාදී කොටස් සමග එකතුවෙලා බණ්ඩාරනායක අගමැතිතුමා ජාතිය විනාශ කරන්න උත්සාහ කරනවය, රට විකුණන්න ක්‍රියා කරනවය, යනාදි වශ යෙන් එදා කළ ප්‍රකාශ අමතක වීමට තරම් කාලයක් තවම ගතවෙලා නැහැ. 1956 දී එවකට විප්ලවවාදි සමසමාජ පක්ෂයේ නායකයා වශයෙන් ක්‍රියා කළ වර්තමාන අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමා සමග එකතු වී රටට නායකත්වය දීම සඳහා මහ ජන එක්සත් පෙරමුණ වශයෙන් මහා මැතිවරණයකට ඉදිරිපත් වූ අවස්ථාවේ මීටත් වඩා දැඩි, මීටත් වඩා දරුණු වැඩ පිළිවෙළක් මේ උදවිය ගෙන ගිය බව කාටත් අමතක වෙලා නැහැ. කොයි හැටි වෙතත්, 1956 දී මාක්ස්වාදීන්ගෙන් විශ්වාසය සහ සහයෝගය ලබාගෙන වැඩ කරගෙන ගියා. එහෙත් එක්සත් ජාතික පක්ෂය අනතුරු දක්වීම් වශයෙන් කොයි තරම් දේ ප්‍රචාරය කර හැරියත් මේ තාක් ආගම නැති කරන දේවල් එකක්වත් ඇති වුණාය කියන්න මට නම් බැහැ.

1956න් පස්සෙ මේ රටේ ඉතිරිව තිබුණු යුද කඳවුරුත් ත්‍රිකුණාමල වරායත්, කටු නායකත් ආපසු නිදහස් කරවා ගැනීම නිසා මේ රට අංග සම්පූර්ණ නිදහසක් ඇති රටක් කර ගැනීමට දිවංගත අගමැති තුමා වැඩ කළ බව ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. විශාල පිරිවෙන් දෙකක් විශ්ව විද්‍යාල තත්ත්වයට උසස් කිරීම ඉතා වැදගත් සිද්ධියක්. ඒ විධියටයි ක්‍රියා කළේ. 1960 ජූලි මාසයේ මහ මැතිවරණ යක් ඇති වූ අවස්ථාවේ පත්තරකාරයොත් එක්සත් ජාතික පක්ෂයත් මොන විධියේ ප්‍රචාරයක් ගෙන ගියාද කියා තමුන්නාන් සෙල දන්නවා ඇති. රට පාවා දෙන්න යනවා, රට බෙදන්න යනවා, දෙමළුන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

රට දෙන්න යනවා, ජාතිය ඉවරයි, මැතිනියට නීතියක් නෑ, ඔය ආදී වශයෙන් නොයෙකුත් ප්‍රචාරයන් ගෙන ගියා. එක්සත් ජාතික පක්ෂයේ නායකයින් පොත් අර අරගෙන ගිහිනුත් පෙන්නුවා, මැතිනියට එන්න නීතියක් නෑ, ඉඩ දෙන්නෙ නෑ, කියා.

රුසියාව ආදී රටවල ලියා තිබෙන පොත් පත් ගැන අපේ ගොවි ජනතාව දන්නෙ නැහැ. තරමක් දුරටවත් දේශපාලනය අපේ රටේ ප්‍රචාරය වුණේ 1947න් පසුවයි. මෙතෙක් කල්ම මේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිගාමී කොටස් මේ රටේ බොරු ව්‍යාපාර අරගෙන ගිය බව පෙන්වන්න පුළුවන්. ආගම ගැන සඳහන් කරන විට මොකක්ද කියන්නෙ? බුද්ධ ජයන්තියට මුදල් වෙන් කළාලු. නමුත් මුදල් වියදම් කරන මාර්ගයක් පෙන්නුවේ නැහැ. ඡන්දයකට මුහුණ දෙන්නට තිබෙන නිසා එසේ කළත් යම්කිසි විධියකින් ඡන්දයෙන් දිනුවා නම් මුදල් වියදම් කරන හැටි බලන්න තිබුණා. ඔවුන්ට බලය තිබුණු කාලයේ ශත 10ක් 15ක් වියදම් කර ඉරිදා පාසැලකට එක පොතක් අරගෙන දුන්නද? අරන් දුන්නෙ නැහැ. එදා කටයුතු කළේ එහෙමයි. නමුත් අද මහජනයා ඉදිරියට ඇවිත් නොයෙක් චෝදනා කරනවා. අද ඔවුන් බණ්ඩාරනායක ප්‍රතිපත්ති ගැන කථා කරනවා. අද ඒ ප්‍රතිපත්ති වර්ණනා කරනවා. ඒකයි ඊළඟ පුදුමය. එතුමා කරන්න ගිය හැම දේකටම අකුල් හෙළුවා. අවුරුදු 18ට වැඩි අයට ඡන්ද බලය දීම වැනි සමාජවාදී වැඩවලදී ඒවාට විරුද්ධව වැඩ කළා. අද අනික් පැත්තට වර්ණනා කරනවා. ඊළඟ පුදුමය නම්, අපට බණ්ඩාරනායක ප්‍රතිපත්ති කියා දෙන්නට එන්නේ එක්සත් ජාතික පක්ෂය. නමුත් කාලයක් තිස්සෙ ඒවාට සම්බන්ධව වැඩ කිරීම නිසා ඒ ගැන ඔවුන්ට වඩා දැනීමක් අපට තිබෙනවා.

බණ්ඩාරනායක අගමැතිතුමාගෙ මැද පිළිවෙත පාවා දුන්නාය කියා අද කියනවා. දිවංගත අගමැතිතුමාගෙ කථා මාත් අහලා තිබෙනව. එතුමාගෙ අදහස් දැනගෙන තිබෙනවා. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය සමාජවාදයයි. මැද මාවත කියා එතුමා සඳහන් කළේ සමාජවාදය කරා යන මාර්ගය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමයකට පමණයි. ඒ මගින් රට දියුණු කිරීමටයි. රට දියුණු කරන්නට පුළුවන් ඒ මාර්ගයෙන් පමණක්ය කියන එකයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය. සමාජවාදය ක්‍රියාත්මක කරන ක්‍රියා මාර්ගයක් හැටියට මැද මාවත තෝරා ගෙන ඒ අනුවයි එතුමා ගමන් කළේ. ඒ නිසා අද එතුමාගෙ ප්‍රතිපත්තිවලට කිසිම හානියක් කර නැහැ. එතුමා ජීවතුන් අතර සිටියා නම් මීටත් කලින් මේ පියවර ගෙන ක්‍රියාත්මක කරනවාට කිසිම සැකයක් නැහැ. ඒ නිසා ඒ තර්කවලින් මේ රටේ මහජනතාව මුළා කරන්න පුළුවන්කමක් නැහැ.

පාර්ලිමේන්තුව කල්තැබූ අවස්ථාවේ කථාවක් තිබුණා තවත් ඡන්දයක් තියන්නෙ නැත කියා. මෙතෙක් කල් කී බොරු වගේම ඒකත් බොරු වුණා. නමුත් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) වැනි පක්ෂ නායකයින් යම් යම් ප්‍රකාශ කළ නිසා ඒ ප්‍රචාර තහවුරු කර ගන්න බැරි වුණා. පාර්ලිමේන්තුව ගිය දෙවැනිදා රැස්වූ නිසා ඔවුන්ගේ ඒ බොරුවත් එළි වුණා.

දැන් තවත් බොරුවක් ප්‍රචාරය කරනවා. වචන පහක් කථා කර ගන්න බැරුව රැස්වීමකට ගොස් ආවාම පත්තරයේ විශාල වාර්තාවක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ අයගේ කථා වාර්තා කරන්න වෙනම කොටසක් සිටිනවා. පත්තරයේ තිබෙන්නේ කථා කළ දේවල් නොවෙයි. හොඳ දිග වාර්තාවක් පත්තරයේ තිබෙනවා. එන මහ මැතිවරණය නැති කරන්න යනවාය කියා තවතත් ප්‍රචාරයක් ඇති කර තිබෙනවා.

දැන් ජීවිත පරිත්‍යාගයෙන් වැඩ කරන්න යනවාලු. දැන් විප්ලවකාරී තත්ත්වය කටත් බැහැලලු. දැන් උත්සාහ කරන්නේ මැතිවරණය කල් දැමීමට ආණ්ඩුව අදහස් කරනවාය කියා රටේ ප්‍රචාරයක් ගෙනයන්නයි. මැතිවරණයකට අපි කිසිම බයක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අනික් වාමාංශික පක්ෂත් සංවිධානය වී එක්සත් වුවොත් අපට ජය ලැබෙන බව ඔප්පු වී තිබෙනවා. අපට මතකයි, 1956 දී මැතිවරණයට කලින් එක්සත් ජාතික පක්ෂය කී දේ. එම පක්ෂය මහාමේරු පර්වතය වාගේය,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොතලාවල මහත්මයාගේ බමරෑ වැල්ලේ ගැහුවත් කැරකෙනවාය කියමින් ශාස්ත්‍රකාරයිනුත් පත්‍රකාරයිනුත් පෙට්‍රල් කොම්පැනිකාරයනුත් තවත් කොම්පැනිකාරයනුත් එකතු කරගෙන එදා ගෙන ගිය ව්‍යාපාරය අපට මතකයි. ලක්ෂ 30ක අරමුදලක් තිබුනාලු. එදා ආසන 68 ක් ඉල්ලා රටට ගියා. මොකක්ද වුණේ? ආසන 8 යි, ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ.

ඊට පසුව 1960 මාර්තු මාසයේ තාවකාලික ආණ්ඩුවක් පිහිටුවා බොහොම හයියෙන් කෑගැහුවා. රට පාවා දෙන පින්තූර ගැහුවා. නමුත් මහජනයාගේ අවසාන තීරණය කුමක්ද? මේ රටේ ගොවි කම්කරු ජනතාව රටේ බලය පැවරිය යුත්තේ කාටද කියා තීරණය කර අවසානයි. මහජනයා එදිනෙදා ප්‍රශ්න පිළිබඳව උද්ඝෝෂණය කරන බව ඇත්තයි. නමුත් රටේ ආණ්ඩු බලය පැවරීමේ ප්‍රශ්නය ඉදිරිපත් වූ විට ලංකා ධනපතීන් තබා ඇමරිකන් ධනපති කඳවුර ආවත් ඔවුන් පරාජය වන බව ඉතිහාසයෙන් ඔප්පු වී ඇති දෙයක්. මේ රටේ වාමාංශික අදහස් ඇති උදවිය එකතු වූ හැම අවස්ථාවකදීම එක්සත් ජාතික පක්ෂය පරාජය වුණා.

ඉතින් අපි මොකටද, මැතිවරණයක් ගැන බය වන්නේ? තව අවුරුද්දකට මැතිවරණය කල් දමනවාට වඩා හොඳයි. මහජනයා ඉදිරියට ගොස් තවත් අවුරුදු පහකටම බලය ලබාගැනීම. ඒ නිසා රට මුලා කරන දේවල් මහජනයාට නොකියා ප්‍රශ්නය ඉදිරිපත් වූ විට කටයුතු කිරීම හොඳ බව මම එක්සත් ජාතික පක්ෂයට කියන්න කැමතියි.

මේ රාජාසන කථාව පිළිබඳව ගරු මන්ත්‍රීවරු නොයෙක් දේ කියා තිබෙනවා. සමසමාජ පක්ෂයට නොයෙක් විධියේ ඇණුම් බැණුම් එල්ල කළා. ලෝකයේ ඇති හැම දෙයක්ම කරනවායයි රාජාසන කථාවේ සඳහන් කර නැහැ. ඉන් අපි එක්තරා වැඩ පිළිවෙලක් ඉදිරිපත් කර තිබෙනවා. එය ක්‍රියාත්මක වන විට නොයෙක් ප්‍රශ්න විසඳෙනවා ඇති. ජීවන වියදම බස්සවන්නේ මෙන්න මෙහෙමය කියා වච්චෝරුවක් මේ රාජාසන කථාවේ සඳහන් කර නැති බව ඇත්තයි. නමුත් මෙහි සඳහන් කර ඇති දේ කෙරෙන විට ජීවන වියදම අඩු වීමට කරුණු සැලසෙනවා ඇති. මේ රට මුහුණපා ඇති ප්‍රශ්න පිළිබඳව සෑහෙන අවබෝධයක් ඇතිව මේ රජය කටයුතු කරනවා ඇති.

රටේ මේ තත්ත්වය ඇති වීමට හේතු වශයෙන් නොයෙක් කරුණු දක්වා තිබෙනවා. මේ රටට 1948 දී දේශපාලන නිදහස ලැබුණා. එලෙස නිදහස ලැබුණු ලෝකයේ අනික් රටවල් තමන්ට වුවමනා කරන දේ නිෂ්පාදනය කිරීමට සැලැස්ම සාදා ඒ අනුව වැඩ කළා. නමුත් අවාසනාවකට මෙන් නිදහස ලබාගත් වෙනත් රටවල මෙන් අපේ රටේ කටයුතු කෙරුණේ නැහැ. අපේ රටේ තත්ත්වය වෙනස් කිරීමට එදා සිටි ආණ්ඩු කිසිම උත්සාහයක් ගත්තේ නැහැ. අධිරාජ්‍යවාදීන්ට වුවමනා විධියට දිගටම කටයුතු කළා. අධිරාජ්‍යවාදී රටවල නිපදවන භාණ්ඩ මෙරටට ගෙන්වා විකිණීම සඳහා ඔවුන් සමග එක්සත් ජාතික පක්ෂය ගිවිසුම් ඇතිව කටයුතු කළා මිස වෙනත් සැලැස්මක් ඇති කිරීමට උත්සාහයක් ගත්තේ නැහැ. හැබැයි ලෝකයේ අනික් රටවල සිදු වූ වෙනත් දේ නිසා අපේ නිෂ්පාදනයන්ට සෑහෙන මිලක් ලැබුණු නිසා අපට එයින් කරදරයක් ඇති වුනේ නැහැ. කොරියාවේ ඇති වූ යුද්ධය නිසා අපේ රබර්වලට සෑහෙන මිලක් ලැබුණා. අනික් අතින් එදා මේ තරම් ජනගහණයක් සිටියේ නැහැ. එදා රටේ සල්ලි තිබුණේ එක්සත් ජාතික පක්ෂයේ දක්ෂකමක් නිසා නොවෙයි. කොරියන් යුද්ධය නිසා අපේ රබර්වලට අධික මිලක් ලැබුණු නිසයි. ඒ සල්ලිවලින් මොකක්ද කළේ? මේ රටේ ජනතාවට අවශ්‍ය දේවල් මේ රටේම නිෂ්පාදනය කිරීමට උත්සාහ කළේ නැහැ. ඒ සල්ලි යොදවා පිටරට සමාගම් මගින් බඩු ගෙන්නුවා. ඒ සමාගම්වල කොටස් පවා ගත්තා. එපමණක් නොවෙයි, ඒ සමාගම් සමග ඡන්ද අරමුදල් එහෙම සාදා ගෙන හිටිය. මේ හේතු නිසා අපේ රටේ සුලු වශයෙන් වත් යම් කර්මාන්තයක් තිබුණා නම් එයත් විනාශ වී ගියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

ගරු කථානායකතුමනි, අපේ ගම්බද ප්‍රදේශවල සුලු වශයෙන් අල වගාව තිබුණා. නමුත් අනවශ්‍ය පරිදි ඕනෑවට වඩා අර්තාපල් පිටරටින් ගෙන්වීම නිසා එවැනි වගාවන් විනාශ වී ගියා. අපේ ගමක කෙනෙක් කවදාවත් සුලු තුවාලයක් වුණාට, දොස්තර බෙහෙත් දමන්නෙ නැහැ. ගමේ සුලු වෙද මහත්මයෙක් ළඟට ගියාම ඒකට බෙහෙත් හරිගස්සා දෙනව. නමුත් අද තත්ත්වය ඊට වඩා වෙනස්. අද සුලු තුවාලයකට වුවත් අවශ්‍ය බේත් වර්ගත් තවත් නොයෙක් නොයෙක් බේත් වර්ගත් පිටරටවලින් ගෙන්වනව. මේ නිසා දවසින් දවස විදේශීය රටවලින් ගෙන්වන අවශ්‍ය දේවලටත් අනවශ්‍ය දේවලටත් වැඩි වැඩියෙන් මුදල් වියදම් කරන්ට අපට සිඩ වුණා. හැම කෙනෙක් ම විදේශීය රටවලින් ගෙන්වන බඩු පාවිච්චි කරන්ට පුරුදු කළා. මා කලින් සඳහන් කළ හේතු නිසා හදිසියේ ලැබුණු ඒ මුදල්, වෙනත් නිදහස ලැබූ රටවල මෙන් තමන්ගේ රටේ සංවර්ධනයට යෙදුවෙ නැහැ. ඒ මුදල් පිටරටවලින් බඩු ගෙන්වීමටම වැය කළා. මනුෂ්‍යයෙක් බූරුවා ගසා දිනුවාම ඒ සල්ලිවල අගයක් නැහැ; අඩි ගහල සල්ලි නිකම් ඉරලත් වීසි කරනව. ඒ විධියට අර ලැබුණු මුදල් එක්සත් ජාතික පක්ෂය රටේ සංවර්ධනයට යෙදුවෙ නැහැ. ඒවායින් කොටසක් එංගලන්තයට ණයට දුන්න. අනික් ඒවායෙ බඩු ගෙන්නුව. අන්න ඒ තත්ත්වය නිසාත්, ක්‍රමයෙන් වැඩි වන ජනගහණය නිසාත්, ලෝකයේ තිබෙන වෙළඳ මිළ අනුව අපේ රටේ ද්‍රව්‍යවල මිළ අඩුවීම නිසාත් දැන් අපට අමාරු තත්ත්වයකට මුහුණ පාන්ට සිද්ධ වී තිබෙනවා. මේ තත්ත්වයෙන් අප බේරෙන්නෙ කොහොමද යන ප්‍රශ්නයයි වඩාත් කල්පනා කළ යුතුව තිබෙන වැදගත්ම ප්‍රශ්නය. ඒ අමාරු තත්ත්වයෙන් බේරෙන්ට නම් කළ යුතුව තිබෙන එකම දේ ලංකාවට අවශ්‍ය දේවල් ලංකාවේම නිෂ්පාදනය කිරීමයි. ලංකාවේ නිෂ්පාදන ශක්තිය දියුණු කිරීමයි. ඒ වාගේම ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට අපේ ගොවි කම්කරු ජනතාවගේ සහාය රටේ දියුණුවට යෙදවීමයි අපට කරන්ට තිබෙන්නෙ. රාජාසන කථාවේ මේ එකින් එක විස්තර කර නොතිබුණත් ඒ අදහස් ක්‍රියාත්මක කරන්ට වුවමනා නීති රීති රෙගුලාසි සම්පාදනය කර යථා කාලයේදී මේ ගරු සභාව ඉදිරියේ තබන බව සඳහන් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, කම්කරු ජනතාවගේ සහාය ලබා ගැනීම පිළිබඳව නොයෙක් විධියට කථා කළා. ඒ වාගේම රටේ ජනතාවගේ ශ්‍රමය රටේ දියුණුවට යොදා ගන්ට ඕනෑය යන්නත් කථාවට පමණක් සීමා වී තිබුණා. කථාවට පමණක් සීමා වී තිබුණු ඒ අදහස් ක්‍රියාත්මක කරන බව රාජාසන කථාවේ සඳහන් වී තිබෙන බව කියන්ට සන්තෝෂයි. කම්කරු සංවිධානවල අදහස්, දැනීම, පළපුරුද්ද මේ රටේ සංවර්ධන කටයුතුවලට යොදවා ගැනීමට බලතල සහිත කම්කරු උපදේශක මණ්ඩල පිහිටුවනවාය කියා මෙහි සඳහන් වෙනව. ගරු මන්ත්‍රීවරයෙක් චෝදනා කළා මෙය වෘත්තීය සමිති නැති කරන්ට ඇති කරන ව්‍යාපාරයක්ය කියා. නමුත් මෙය ඒ විධියේ අදහසක් නොවෙයි. මා දීර්ඝ වශයෙන් ඒ සම්බන්ධයෙන් කථා කරන්නෙ නැහැ. ගරු ගමනාගමන ඇමතිතුමා ඒ අදහස් ක්‍රියාත්මක කිරීම සඳහා පණතක් සකස් කිරීමට අවශ්‍ය ලියවිලි ලැස්ති කර ගිය සතියේ ලංකාවේ සියලුම වෘත්තීය සමිති නායකයන් කැඳවා ඒ අයට භාර දුන්නා. අපි සාමාන්‍ය වශයෙන් ඉදිරිපත් කළ අදහස් වාගේම ඒ වෘත්තීය සමිතිවලද අදහස් විමසා බලා අවශ්‍ය සංශෝධන කිරීමෙන් පසු, නැවතත් ඒ වාර්තාව සකස් කර පණතක් වශයෙන් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර යථා කාලයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනවා. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමටයි ගරු ඇමතිතුමා වෘත්තීය සමිති නායකයින්ගෙ අදහස් දැන ගත්තෙ.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்நாயக்க)*
(Mr. P. R. Ratnayake)

ඊට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය නම් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාර්ලිමේන්තුවට ඒවා ඉදිරිපත් කරනවා ඇති. දැනට රාජාසන කථාව අඩංගු කඩදාසියේ තිබෙන වචන ගෙන විවේචනය කරමින් කම්කරුවන්ට මේ රජයෙන් කිසිම ප්‍රයෝජනයක් නැතැයි ඔප්පු කරන්ට සමහර ගරු මන්ත්‍රීවරුන් උත්සාහ කළත්, වැඩ කරගෙන යැමේදී උන්නැහේලාට පැහැදිලි වෙයි, කොයි තරම් දුරට ඒ කටයුතු සාර්ථක කිරීමට ආණ්ඩුව ක්‍රියා මාර්ග ගන්නවාද කියා. අපේ රටේ පැන නැගී තිබෙන ප්‍රශ්නවලට මුහුණ පා ඒවා විසඳාගන්ට පුළුවන් වැඩ පිළිවෙළවල් කීපයක් ගැන පමණයි, මෙහි සඳහන් කර තිබෙන්නෙ.

ජීවන වියදම බස්වනවාය කියා මේකෙ ඇතුළත් කළ තරමින් ජීවන වියදම බහින්නෙ නැහැ. එහෙම වෙනවා නම් මේ අනික් කරුණු ලිව්ව වගේ පැත්තකින් ඒකත් ලියන්න පුළුවන්කම තිබුණා. ජීවන වියදම් බැස්වීම වචන වලින් පමණක් කරන්ට පුළුවන් දෙයක් නොවෙයි. කාටත් අඩු වියදමකින් ජීවත්වීමට මාර්ගයක් ඇති කරන්ට යම්කිසි වැඩ පිළිවෙලක් මේ රාජාසන කථාවෙන් ඉදිරිපත් කර තිබෙනව. මේ රටට අත්‍යවශ්‍ය බඩු පිටරටින් ගෙන්වීම සම්බන්ධයෙන් හා පිටරටවලට බඩු යැවීම සම්බන්ධයෙන් රාජාසන කථාවේ සඳහන් වී තිබෙන කොටස ජීවන වියදම බැස්වීමට ඉතා වැදගත් වේයයි මා කල්පනා කරනවා. සමහරවිට ඒ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී තරමක අමාරුකම් ඇතිවන්ට ඉඩ තිබෙනව. ඒක පුදුමයක් නොවෙයි. මෙතෙක් කල් යම් සමාජවාදී වැඩ පිළිවෙළක් ඇති කළාද, ඒ සෑම අවස්ථාවකදීම වගේ නොයෙක් අවහිරකම්වලට මුහුණ පාන්ට සිදු වුණා. පිටරටින් බඩු මෙරටට ගෙන්වීම හා මේ රටින් පිටරටට බඩු යැවීමත් ක්‍රමයෙන් රජය සතු කිරීමේදී,—දැනට සමහර ප්‍රතිගාමී කොටස් ප්‍රකාශ කරන අන්දමට ඡන්දය ගැන කෙසේ වෙතත්—අපට තරමක විප්ලවකාරී වැඩ පිළිවෙළක් ගෙන යන්ට සිදු වෙයි. විශෙෂයෙන්ම ධනපති ක්‍රමය රඳා පවතින්නේ පිටරටින් මෙරටට බඩු ගෙන්වීමත්, මේ රටින් බඩු පිටරට යැවීමත් මතයි. එම නිසා බඩු ගෙන්වීම හා පිටරට යැවීම මහජන සන්තක කිරීමෙන් මේ රටේ ධනපති පන්තියට සැහෙන පහරක් වදින බවට කිසි සැකයක් නැහැ. මෙරට භාණ්ඩ නිෂ්පාදනයට ආධාරයක් වශයෙන් බඩු ගෙන්වීම සීමා කළ විට සිදු වන්නෙ කුමක්ද? බඩු හිඟය මග හැරීමට තිබෙන අනික් ක්‍රමය නම් එක්සත් ජාතික පක්‍ෂය කියන විධියට කිසිම සීමාවක් නැතිව ඕනෑ තරම් පිටරටින් මෙරටට බඩු ගෙන්වන්ට ඉඩ දීමයි. ඒ කියන්නෙ, මුද්දරප්පලම් ඇපල් පමණක් නොව වෙනත් ඕනෑම ජාතියක් කිසිම සීමාවක් නැතුව පිටරටින් මෙරටට ගෙන්වන්නට වෙළෙන්දන්ට ඉඩ දීමයි, ජීවන වියදම අඩු කරන්ට අනුගමනය කළ ප්‍රතිපත්තිය. එහෙත් මේ රටේ සංවර්ධන කටයුතු ගැන අවබෝධයක් ඇති කාටවත් ඒ ක්‍රමයට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ, රට කොතරම් ධනවත් වුනත්, මුදල් නැති අවස්ථාවක නොවෙයි, අපට වුවමනා ප්‍රමාණයටත් වඩා භාණ්ඩාගාරයේ මුදල් පිරී ඉතිරී තිබෙන විටකවත් ඊට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. එමෙන්ම කිසිම යුතුකමක් නැහැ, අතීතයේ කළ අන්දමට බඩු පිටරටින් ගෙන්වන්න ඉඩ දීමට. අපට දැනට තිබෙන අමාරුකම්වලින් එකක් තමයි, ලැබෙන බඩු ටිකවත් හරියාකාර බෙදා හැරීමට ක්‍රමයක් නැතිකම. දේශීය නිෂ්පාදනවලට ආධාර දීමක් වශයෙන් පිටරටින් ගෙන්වන බඩු සීමා කරන්න සිද්ධ වෙනව. අනික් කාරණය මුදල් නැතිකම නිසාත් එසේ කිරීමට සිදු වෙනවා.

ද්‍රව්‍ය ගෙන්වීම සීමා කර තිබෙන විට ඇති වන තත්ත්වය කුමක්ද? ලංකාවට රෙදි යාර ලක්‍ෂයක් අවශ්‍යයයි සිතමු. පිටරටින් ගෙන්වන්නෙ 75,000 නම්, 25,000 ක හිඟයක් තිබෙනව. එවැනි තත්ත්වයක් තිබෙන විට ඒ ලැබෙන 75,000 වත් හරියාකාර බෙදා හරින්ට අපට ක්‍රමයක් නැති නිසා කළුකඩ ව්‍යාපාරයට ඉඩ ලැබෙනව. බොහොම ලෙහෙසියෙන් ඕක කරන්නට පුළුවනි. එම නිසා අවශ්‍ය වී තිබෙන්නෙ, තිබෙන බඩු ටික හරියාකාර බෙදා හැරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

සඳහා ක්‍රමයක් සකස් කිරීම පමණයි. මෙ රටට ගෙන්වන බඩුවලින් සෑහෙන කොටසක් සමුපකාර තොග වෙළඳ ආයතනය මගින් ගෙන්වනව. නමුත් සමහර අවස්ථාවලදී පෞද්ගලික වෙළඳුන් ගෙන්වන ද්‍රව්‍යවල මිළ නියම කිරීමට ඇති අපහසුකම් නිසා ඒවා අධික මිළට විකුණනු ලබනව. පෞද්ගලික වෙළඳුන් විසින් ගෙන්වනු ලබන ද්‍රව්‍යවල මිළ නියම කරන්නෙ ආණ්ඩුවෙන් හෝ මහජන නියෝජිතයන් විසින් නොවෙයි, තමන්ට වුවමනා විධියට සමහර බඩුවල මිල නියම කරන්නෙ. ඔවුන් විසින්මයි. මෙවැනි තත්ත්වයක් ඇතිවීමට ඉඩ තබනව නම්, කවදාවත් ජීවන වියදම පහත හෙළීමට පුළුවන් කමක් නැහැ. එම නිසා තමයි, මේ රටට අවශ්‍ය බඩු මොනවා ද කියා සොයා බලා, ඒ බඩු සියල්ලක්ම සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් මෙරටට ගෙන්වා, යම්කිසි ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් යටතේ බෙදා හැරීමට ආණ්ඩුව කල්පනා කර ඇති බව රාජාසන කථාවෙහි අඩංගු කර ඇත්තේ.

නාත්තන්ඩියේ ගරු මන්ත්‍රීතුමා (ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්) සඳහන් කළා, රෙදි යාර හතරක් ලබා ගෙන මොනවා කරන්නටද කියා. ඇත්ත වශයෙන් මේ පිළිබඳව ප්‍රවෘත්ති පත්‍රවලත් නොයෙකුත් අන්දමේ ප්‍රකාශයන් පළ වුණා. නමුත් ඒ ප්‍රවෘත්ති පත්‍ර කාරයන්වත්, එක්සත් ජාතික පක්ෂය වත් රටේ උද්ගත වී ඇති ප්‍රශ්න විසඳන්නේ කොයි ආකාරයෙන්ද කියා පැහැදිලි කර දී නැහැ. මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර පසු ගිය දවස්වල ආණ්ඩුවට විරුඬව නොයෙකුත් අන්දමේ ප්‍රචාරයන් ගෙන ගියා මිස ආණ්ඩුවට අපහාස වන අන්දමේ ප්‍රවෘත්ති පළ කළා මිස, ප්‍රශ්න විසඳීම සඳහා සහයෝගයක් දුන්නේ නැහැ. ගරු කථානායකතුමනි, සමුපකාර තොග වෙළඳ ආයතනය රෙදි යාරය රුපියල් 1.50ට විකුණනවා නම්, එම රෙදි යාරයම පෞද්ගලික ලෙළෙන්දා රුපියල් 5ට විකුණනවා නම්, සමුපකාර තොග වෙළඳ ආයතනයට ජනයා ඇදෙන එක—එකී පෝලිම් සෑදෙන එක—පුදුමයක් නොවෙයි, ඒ වාගේම සමහරුන්ට පෝලිමේ සිටීමෙන් දවසකට රුපියල් 10ක් පමණ සොයා ගන්නට පුළුවන් නම්, මේ පෝලිම් දික් ගැස්සෙන එකත් පුදුමයක් නොවන්නට පුළුවනි. කෙසේ වෙතත් ගරු කථානායකතුමනි, රට මුහුණ පා ඇති අවස්ථාව අනුව කල්පනා කර බලා, සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් එක සලාක පොතකට රෙදි යාර හතර ගණනේ බෙදා හැරීමට වැඩ පිළිවෙළක් සකස් කර තිබුණා. නමුත් මේ රෙදි ප්‍රමාණය කොහෙත්ම ප්‍රමාණවත් වෙනවාය, සෑහෙනවාය කියා මා කියන්නෙ නැහැ. අවස්ථාවේ හැටියට ප්‍රශ්නය තරමක් දුරට වත් විසඳන්නටයි එබඳු වැඩ පිළිවෙලක් අනුගමනය කළේ. යම් ලෙසකින් එබඳු සලාක ක්‍රමයක් යටතේ රෙදි බෙදා නොහැරියා නම් සාධාරණ අන්දමට මහජනතාව අතර රෙදි බෙදා හැරීමට ඉඩ ලැබෙන්නෙ නැහැ. මම ඉතාමත් සන්තෝෂ වෙනවා—වෙන පළාත් ගැන මා කියන්නට දන්නෙ නැහැ—අපේ ගම්බද පළාත්වල පවුල්වලට නම් මේ රෙදි ප්‍රමාණයෙන් තම අවශ්‍යතාවන් සෑහෙන තරමකින් පිරිමසා ගැනීමට හැකි වුණා. එසේ නමුත්, ඉදිරියටත් රෙදි යාර හතරක් පමණක් දෙන්නටයයි මා කියන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මෙරටට ගෙන්වන රෙදි, සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් හෝ වේවා, පෞද්ගලික වෙළඳුන්ගේ මාර්ගයෙන් හෝ වේවා සලාක ක්‍රමය යටතේ එක් අයකුට යාර හතරක් නොවෙයි දහයක් පහළොවක් වුණත් නියමිත මිලක් අනුව බෙදා හැරීමේ ක්‍රමයක් සකස් කරනු ලැබුවහොත් ජීවන වියදම පහත බැසීමට මෙන්ම පෝලිම් නැති කිරීමටත් පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. මාවනැල්ල ප්‍රදේශය ගැන කියනවා නම්, පෞද්ගලික කඩ දෙසීයක් පමණ තිබෙන මෙම ප්‍රදේශයේ සමුපකාර තොග වෙළඳ ආයතන ඇත්තේ එකක් පමණක් හෙයින්, අනික් සෑම තැනකටම වඩා එහි බඩු මිල අඩු නිසා, පෝලිම් ඇති වීම පුදුමයකට කාරණයක් නොවෙයි. ඒ වාගේම, ද්‍රව්‍යවල මිල නියම කිරීමේදී සෑම තැනකම එකම මිලකට ද්‍රව්‍ය ලබාගැනීමට පහසුකම් සැලසීම වැදගත් කරුණක්. දුර පළාත්වලට ද්‍රව්‍ය ගෙන යාමේදී ගමන් ගාස්තු ආදිය සඳහා වැය වන මුදල වෙනුවෙන් ද්‍රව්‍යවල මිලෙහි සුළු සුළු වෙනස් කම් ඇති කරන්නට පුළුවනි. එහෙත් එම ප්‍රදේශයේ ද්‍රව්‍ය විකිණීම සඳහා නියමිත මිලක් ඇති කරන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, කූපන් ක්‍රමයට විරුද්ධව පත්‍රයක පළ කරන ලද ලියවිල්ලක් මම දුටුවා. ලංකාදීප පත්‍රයේ වගතුග තීරයෙ වැනි තීරවල කුලියට පත්‍රවලට ලිපි ලියන්නන් විසින් නොයෙකුත් අන්දමේ ලියකියවිලි ලියනව. ඒ අය ආණ්ඩුව අනුගමනය කරන යම් යම් වැඩ පිළිවෙලවල් ඉතාමත් අසාධාරණ අන්දමට විවේචනය කරනව. නමුත් මා ලොකු දේශපාලනඥයෙක් නොවුණත් අත්දැකීම්වලින් මට කියන්නට පුළුවනි, බඩු හිඟයක් පවතිනවා නම් සලාක ක්‍රමයක් නැතුව මිල පාලනයක් ඇති කරන්නට බැරි බව. කොයි විධියෙන් පාලන ක්‍රම ඇති කළත් හාල් සලාකය බෙදා දෙන්නා වාගේ සලාක ක්‍රමයට ද්‍රව්‍ය බෙදා දෙන්නෙ නැතුව සාධාරණ අන්දමට බෙදා හැරීම අපහසු බව අත්දැකීම්වලින් ඔප්පු වී තිබෙනව. ඒ විධියට බඩු බෙදා හැරීමේ වරද මොකක්ද ? අපේ රටේ ජාතික ධනය ඉතිරි කර ගන්න ඕනෑ නම්. අපේ රටේ භාණ්ඩ නිෂ්පාදනය කරන්නට ඕනෑ නම් නිෂ්පාදනය කරන භාණ්ඩ සාධාරණ පරිදි බෙදා හරින්නට ඕනෑ නම්, සලාක ක්‍රමය ප්‍රයෝජනයට ගැනීමේ වරද මොකක්ද ? සලාක ක්‍රමය අනුගමනය නොකර මේ රටේ සාමාන්‍ය ජනතාවගේ අමාරුකම්වලින් ඔවුන්ට නිදහසක් ලබා දෙන්නේ කොහොමද ? පිටරටින් ඕනෑ තරම් බඩු ගෙන්වීමට කිසිම පුළුවන්කමක් නැහැ. අපට සල්ලි තිබුණත් ඕනෑ තරම් පිටරටින් බඩු ගෙන්වන්නට බැහැ. එසේ ගෙන්වනවා නම් ඒක වැරදි වැඩ පිළිවෙලක්. රට සංවර්ධනය කරන්නට වුවමනා නම්, පිටරටින් බඩු ගෙන්වීම් සීමා කළ යුතුයි. අපට මේ රටේ සංවර්ධනයක් වුවමනා නැත්නම් මුදල් පියවා ගනිමින් මේ රටේ බඩු පිටරට යැවීමටත් පිටරටින් බඩු මේ රටට ගෙන්වීමටත් පුළුවනි. නමුත් එයින් වැඩක් නැහැ.

ගරු කථානායකතුමනි, මේ රටේ සාමාන්‍ය ජනතාව අද සෑහෙන තරම් අමාරුකම් ඇතිව ජීවත් වන බව අප කවුරුනුත් දන්නවා. ඇත්තෙන්ම මේ රටේ සාමාන්‍ය ජනතාවට දන් සෑහෙන තරම් පීඩාවක් ඇති වී තිබෙනවා නම් එසේ ඇති වී තිබෙන්නේ මේ රටේ ධනපති පන්තිය ගෙන යන කූට ව්‍යාපාර නිසයි. මේ ආණ්ඩුව මගින් මේ දක්වා ඇති කල සමාජවාදී වැඩ පිළිවෙළවල් නිසා පිදුණු ධනපති පන්තිය, වරප්‍රසාද ලබා ගෙන සිටි ධනපති පන්තිය, කළුකඩකාරයන් හා තොග වෙළෙන්දන් සමග එකතු වී මේ රටේ ජනතාවට පුළුවන් තරම් අවහිර කිරීමේ කටයුතුවල යෙදී සිටින බව රහසක් නොවෙයි. ඔවුන් ඒ විධියට කටයුතු කරගෙන යන්නේ මේ රටේ මහජනතාව නොමගයවා නැවත වරක් බලයට පැමිණීමේ බලාපොරොත්තු වෙනුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

පාර්ලිමේන්තු ලේකම්තුමාට තව තියෙන්නේ මිනිත්තු දෙකයි.

**පී. ආර්. රත්නායක මයා.**
*(திரு. பீ. ஆர். ரத்ணயக்க)*
(Mr. P. R. Ratnayake)

ඔව්, ඉක්මනට කථාව අවසන් කරනවා.

මේ රටේ ප්‍රතිගාමී කොටස්වල අහිතවත් වැඩ පිළිවෙළ නිසා යම් යම් කටයුතුවලින් අප බලාපොරොත්තු වන තරම් සේවයක් සිදු නොවන අවස්ථාත් තිබෙනවා. මේ රට සංවර්ධනය කිරීමේ කාර්යයෙහිදී වෙනත් රටවලට වගේ අපටත් යම් යම් දුෂ්කරතාවලට මුහුණ පාන්නට සිදු වෙන බව ඇත්තයි. අප මේ රට සංවර්ධනය කරන්නට යන විට අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ ජනතාව ගසා කෑ ද්‍රෝහී පන්තිය ඒ සංවර්ධන කඩාකප්පල් කිරීමට නොයෙකුත් උපක්‍රම යොදනවා. ඔවුන් ඒ සියල්ලක්ම කරන්නේ නැවත මේ රටේ පාලන බලය අල්ලා ගැනීමේ අරමුණ පෙරදැරි කර ගෙනයි. අප කරන වැඩවල නරක පෙන්වීමට ඔවුන් පුළුවන් තරම් උත්සාහ දරණවා. ඒ සඳහා බොහෝ ප්‍රචාරක වැඩවල යෙදෙනවා. මෙවැනි අවස්ථාවක තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ලංකා සමසමාජ පක්ෂයත් එකතු වී සභාග රජයක් පිහිටුවා ගත්තේ. අපේ සංවර්ධන කටයුතු වඩාත් හොඳින් කරගෙන යෑමටයි, මේ සභාග රජය පිහිටුවා ගත්තේ. ඊළඟ මහා මැතිවරණයට පෙර මේ රටේ ජනතාවට දැනට වඩා පහසුකම් සැලසීමේ බලාපොරොත්තුවෙනුයි, මේ සභාග රජය පිහිටුවා ගත්තේ. වඩා හොඳ සැලැස්මක් ඇතිව වැඩ කිරීම සඳහායි, මේ සභාග


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

රජය පිහිටුවා ගත්තේ. එම නිසා මේ රටේ ධනපති පන්තිය මේ සභාග රජයට විරුද්ධ වීම පුදුමයක් නොවෙයි. රාජාසන කථාවට විරුද්ධ වීම පුදුමයක් නොවෙයි. කඩා කප්පල්කාරී නිලධාරීන් අස් කිරීම ධනපති පන්තියේ සතුටට හේතු වන්නේ නැහැ. බඩු ගෙන්වීම රජයට පවරා ගැනීම ධනපති පන්තියේ සතුටට හේතු වන්නේ නැහැ. තත්ත්වය මෙසේ හෙයින් එක්සත් ජාතික පක්ෂයට, මේ රාජාසන කථාවට පක්ෂව ඡන්දය පාවිච්චි කළ නොහැකි බව ඒ අය කෙලින්ම කියනවා නම් අප ඒ කියමන ස්තුතියෙන් භාර ගන්නට සූදානම් බව මතක් කරන්නට කැමතියි. මේ රාජසන කථාවේ අඩංගු කරුණු ක්‍රියාවට පරිවර්තනය වන විට ගරු බණ්ඩාරනායක මැතිනිය විසින් ගන්නා ලද සමාජවාදී පියවරේ නිවැරදිතාවය හොඳින් පැහැදිලි වෙනවා ඇති. ඒ වගේ ම මේ රාජාසන කථාවේ අඩංගු කරුණු ක්‍රියාත්මක වන විට අපේ රටේ සමාජවාදී ගමන ඉක්මන් වන බව කාටත් පෙනී යනවා ඇතැයි මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

The Sitting is suspended till 2 P.M. On resumption The Hon. Deputy-Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නියෝජ්‍ය කථානායක නැන්පත් ඩී. ඒ. රාජපක්ෂ මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)*
(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජාසන කථාව වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ස්තුති යෝජනාව කොමියුනිස්ට් පක්ෂයේ සංශෝධන, මැද කොළඹ දෙවැනි මන්ත්‍රීතුමා (පී. ජී. බී. කේනමන් මයා.) විසින් ඉදිරිපත් කරන්න යෙදුණා. ඒ නිසා මට තිබෙන කෙටි කාලය ඇතුළතදී දීර්ඝ වශයෙන් විස්තර ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වන්නෙ නැහැ. අවශ්‍යම කරුණු කීපයක් පමණක් සඳහන් කිරීමටයි මම බලාපොරොත්තු වන්නෙ.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව ගැන කල්පනා කරන විට, සමහර කරුණු සම්බන්ධයෙන් ඇමතිවරු පැහැදිලි ලෙස කල්පනා කර ඒ කථාව පිළියෙළ කරන්න යෙදුණාද කියන එක ගැන සැකයක් ඇති කර ගන්නට ඉඩ තිබෙනවා. ඒ මක්නිසාද? අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාවෙන් ඉතාම පැහැදිලි වශයෙන් ප්‍රකාශ වුණේ දූෂණකම් හා අකාර්යක්ෂමතාව නැති කිරීම සඳහා වැඩ කටයුතු රාශියක් කරන බවයි. එහෙත්, අද රජයේ දෙපාර්තමේන්තුවල කෙරෙන වැඩ කටයුතු දෙස බලන විට මූලික වශයෙන් අකාර්යක්ෂමතාව නැති කිරීම හා දූෂණකම් මැඩලීම සම්බන්ධයෙන් නියම විධියේ වගකීමකින් යුත් වැඩ පිළිවෙළක් යෙදී තිබෙනවාද කියන එක ගැන සැක සහිතව කල්පනා කිරීමට අපට සිදු වී තිබෙනව. මම පිළිගන්නවා විශෙෂයෙන් සම සමාජ පක්ෂයෙන් ඇතුල් වුණ ඇමතිවරු දූෂණ නැති කිරීමේ වැඩ පිළිවෙළක් ඇතිව කටයුතු කරන බව. වරාය සංයුක්ත මණ්ඩලය, බස් ජනසතු ව්‍යාපාරය, ආදී තැන්වල දූෂණ නැති කිරීම සඳහා ලොකු ප්‍රයත්නයක් දරණ බවත් ඒ අනුව ප්‍රතිඵල ලැබී තිබෙන බවත් අපට හිතන්න පුළුවන්. නමුත් අකාර්යක්ෂමතාව ගැන මූලික වශයෙන් කල්පනා කළ යුත්තේ එසේ නොවෙයි. මේ රටේ ඊට බාධා ඇති වන විධියෙ කටයුතු සිදු වෙනව. මේ සම්බන්ධයෙන් මොන විධියේ ක්‍රියා මාර්ගයක් යෙදීමට ආණ්ඩුවෙ අළුත් ප්‍රතිපත්තිවලට අනුව අදහස් කරනවද යන්නයි, මූලික ප්‍රශ්නය. මෙරට ඇති භයානක තත්ත්වය නැති කිරීම සඳහා, පැන නැගී ඇති නොයෙකුත් බාධක ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක් යෙදීමේ ලකුණු තවමත් පහළ වී නැති එක ගැනයි, අප කනගාටු විය යුතුව ඇත්තෙ; අධෛර්යයට පත් වී සිටින්නෙ.

රජයේ සංයුක්ත මණ්ඩල ඇතුළු සෑම ආයතනයකම කම්කරු උපදේශක මණ්ඩල පිහිටුවීම ගැන ප්‍රකාශ කර තිබෙනව, මෙම රාජාසන කථාවෙන්. එම ආයතන වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට ප්‍රගතිකාර වන යෝජනා ඉදිරිපත් කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලයද මේ මණ්ඩලවලට ලැබෙන බව කියා තිබෙනව. ඊළඟට කියා තිබෙනව, කාර්මික අංශය ගැනත්. කෘෂිකර්ම කටයුතු දියුණු කිරීම සඳහා කරදිය ඇතුල්වීම වැළැක්වීම ගැනත් විස්තර කර තිබෙනව. උඩ වලවේ වැනි ව්‍යාපාර ගැනත් සඳහන් වෙනව. උඩ වලවේ ව්‍යාපාරය ගැන මෑතදීත් යම් යම් කරුණු ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මහ ජනයාට දැන ගන්න ලැබුණා. මේ ව්‍යාපාරය ස්ථිර වශයෙන් කොන්ත්‍රාත් දීම පිළිබඳ ප්‍රශ්නය තවම නිරාකරණය කර නැහැ.

Designs, specifications එහෙම යොදාගෙන මෙහි කටයුතු කරන්න එක්තරා ඇමෙරිකන් කොම්පැනියකට භාර දී තිබෙනව. එය මෙම ආණ්ඩුව ඇති වන්නට පෙර තිබුණු ආණ්ඩුව මගින් කෙරුණු ක්‍රියාවක්. මෙම සහභාග ආණ්ඩුවට ඒ පිළිබඳ වගකීම පිළිගන්න බැහැ. මේ පිළිබඳව ටෙන්ඩර් ඉදිරිපත් කරන්න අවස්ථාව පැමිණියාම රටවල් කීපයකින් ඒ සඳහා ඉදිරිපත් වුණා. පෙන්වා දුන් සැලැස්ම වලට අනුව ක්‍රියා කරන්න ඇමෙරිකන් කොම්පැනියක් ටෙන්ඩර් එකක් ඉදිරිපත් කළා, රුපියල් කෝටි 6 කුත් ලක්ෂ 20කට. ඒ සමගම චෙකොස්ලොවෙකියානු ආණ්ඩුවත් ටෙන්ඩර් එකක් ඉදිරිපත් කළා. සැලැස්මෙ තියෙන නුවුවමනා වියදම් සම්පූර්ණයෙන්ම වාගෙ වෙනස් කිරීමට පුළුවන් වන විධියෙ යෝජනා පිළිබඳ විස්තරත් ඇතුව ඒ අය බොහොම මහන්සියෙන් එම ටෙන්ඩර් එක ඉදිරිපත් කළා. එහි තක්සේරුව කොපමණ ද? රුපියල් කෝටි 3 කුත් 70 ලක්ෂයයි. ඇමෙරිකන් කොම්පැනියක් කෝටි 6 කුත් ලක්ෂ 20 කට ටෙන්ඩර් එකක් ඉදිරිපත් කළ අතර මේ චෙකොස්ලොවැකියානු ආණ්ඩුව කෝටි 3 කුත් 70 ලක්ෂයකට ටෙන්ඩර් එකක් ඉදිරිපත් කිරීමෙන් කොතරම් වියදමක් අඩු වී තිබෙනවාද? වියදම අඩු වෙනවා විතරක් නොවෙයි, කියන ප්‍රමාණයට වඩා සියයට 15 කුත් වැඩියෙන් ප්‍රතිඵල ලබා දෙන්න ඒ අනුව පුළුවන් වන බව ඔවුන් ප්‍රකාශ කර තිබෙනව. ගඟ හරහ කොන්ක්‍රීට්වලින් විශාල වේල්ලක් බඳින්නෙ නැතිව පස්වලින් පුරවන්නට පුළුවන් වේල්ලක් යෝජනා කරල, අඩු මුදලක් වියදම් කොට විදුලි බලය වැඩියෙන් ලබා ගන්න පුළුවන් පිළිවෙළක් පෙන්වා දී රුපියල් 3,70,00,000 කට එම වැඩය කරන්න පුළුවන් බවට ඒ සමාජවාදී ආණ්ඩුව යෝජනාවක් ඉදිරිපත් කරල තියෙනව. මේ ආණ්ඩුව දූෂණවලට විරුද්ධව කටයුතු කිරීමට—වුවමනා නැති වියදම් අඩු කරගෙන කටයුතු කිරීමට—එඩිතරව පියවරක් ගන්නවා නම්, එසේ කිරීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නම්, අඩුවෙන් වියදම් කොට වැඩියෙන් විදුලි බලය ලබා ගන්න පුළුවන් මෙවැනි යෝජනා ක්‍රමයක් ඉදිරිපත් වූ විට වහාම එය භාරගෙන කටයුතු කරනවා ඇතැයි අපි බලා පොරොත්තු වෙනව.

අධිරාජ්‍යවාදී රටවලින් පෞද්ගලික කොම්පැනියි, ටෙන්ඩර් ඉදිරිපත් කරන්නෙ. අධිරාජ්‍යවාදී රටවල පෞද්ගලික කොම්පැනිවලින් ඉදිරිපත් කරන සැලැස්මවල තිබෙන දුර්වලකම් මෙයින් පැහැදිලි වෙනවය කියා ඒ විශාල කොම්පැනිවල තරුව්කාරයන් බය වෙලා, සමාජවාදී රටවලට විරුද්ධව විශාල ප්‍රචාරයක් ගෙන යනව. ඒ නිසා රුපියල් කෝටි දෙකහමාරක් පමණ අඩුවෙන් කර ගන්න පුළුවන් ඒ යෝජනා ක්‍රමය මේ ආණ්ඩුව තවම භාරගෙන නැහැ. ලංගම ව්‍යාපාරයේ බස් කොන්දෙස්තර කෙනෙක් රුපියල් දෙකක් තුනක් හොරකම් කිරීම අල්ලන්න මහන්සි ගැනීම, වරායේ නැවක බඩු පැටවීම දවසක් දෙකක් වැඩිපුර ප්‍රමාද වීම වැළැක්වීමට උත්සාහ කිරීම හොඳ දේවල්. එවැනි දුර්වලකම්, අදක්ෂතාවන්, දූෂණ නැවැත්වීමට මහන්සි ගන්න අතරම මෙවැනි රුපියල් කෝටි ගණනින් පාඩු වන අකාර්යක්ෂමතාවන්, දුර්වලකම් නැති කිරීමට ක්‍රියා කිරීම ආණ්ඩුවේ මූලික යුතුකමක්. නමුත් මේ වාසිදායක යෝජනා ක්‍රමය භාර ගැනීමට මේ වන තෙක් මේ ආණ්ඩුව ක්‍රියා නොකිරීම, එවැනි අකාර්යක්ෂමතාවන් මග හැරවීමට කටයුතු කිරීමේ ක්‍රියා ශූරත්වයක් මේ කැබිනට් මණ්ඩලයට නැති බවට ලකුණක් හැටියට අපට සලකන්නට සිදු වී තිබෙනව.

අඩු වියදමකින් වැඩි බලයක් ලබා ගන්න පුළුවන් පිළිවෙළට සමාජවාදී රටක විශේෂඥයන්, උඩ වලවේ යෝජනා ක්‍රමය පිළිබඳව ඉදිරිපත් කර තිබෙන එවැනි සැලැස්මක් තිබෙද්දීත්, ඊට උඩහින් ඇති සමනල වැව ව්‍යාපාරයේ සැලැස්ම ක්‍රියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

වේ යෙදවීමට තවත් පෞද්ගලික ඇමෙරි
කන් කොම්පැනියක් සමග ඩොලර් ලක්‍ෂ
තුන හතරක පමණ කොන්ත්‍රාත්තුවක්
අත්සන් කර තිබෙන බව අපි ප්‍රවෘත්තිපත්‍ර
වලින් දක්කා. මේ ආණ්ඩුව දූෂණය සහ
අදක්ෂතාව නැති කිරීමට එඩිතරව කට
යුතු කරන බව ප්‍රකාශ කළත්, උඩ වලවේ
යෝජනා ක්‍රමය පිළිබඳව සමාජවාදී රටකින්
ඉදිරිපත් කරන ලද වාසිදායක සැලැස්මක්
තියෙද්දීත්, ඊට උඩහින් තිබෙන සමනල
වැව ව්‍යාපාරයේ සැලැස්ම ක්‍රියාත්මක කිරී
මට අධිරාජ්‍යවාදී රටක පෞද්ගලික කොම්
පැනියක් යෙදවීමෙන් මේ ආණ්ඩුව තව
මත් දූෂණ කටයුතු සම්බන්ධයෙන් අධි
රාජ්‍යවාදී රටවලට ගැතිව ක්‍රියා කිරීමේ
භයානක ලකුණු පෙනෙන බව කියන්නට
සිදු වී තිබෙනවා. කිසිම බල කඳවුරකට නො
බැඳී මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් ක්‍රියාවේ
යොදවන බව කියමින් සෑම රටවලින් ම
ආධාර ලබා ගැනීමේ ප්‍රතිපත්තියක් මේ
ආණ්ඩුව අනුගමනය කරන බව කියනවා.
සමාජවාදය ගොඩනැංවීමට එවැනි ප්‍රතිපත්
තියක් ක්‍රියාවේ යෙදවීමෙ අවශ්‍යතාව
සහභාග ආණ්ඩුව පිහිටුවීමෙන් පිළිගත්ත.
සමාජවාදී රටවලින් ලැබෙන ආධාර ගැන
වැඩි සැලකිල්ලක් යෙදුවොත්, ඒ ආධාර
වාසි සහිත නම්, අධිරාජ්‍යවාදී රටවලිනුත්
පෞද්ගලික කොම්පැනිවලිනුත් ලැබෙන
ආධාරවලට වඩා ප්‍රයෝජනවත් නම්, අඩු
කාලයකදී අඩු වියදමකින් කර ගන්නත්
ලැබෙන විධියේ යෝජනා ඉදිරිපත් වන
විට, එවැනි ආධාර ලැබීම ගැන කල්පනා
නොකර අනවශ්‍ය භේද ඇති කර ගනිමින්
විදේශීය බලපෑම්වලට භය වී සිටීම දූෂිත
තත්ත්වයක්. ඒ දූෂිත තත්ත්වය තවම
මේ ආණ්ඩුවෙන් තුරන් වී නොගිය බවත්
ඒ තත්ත්වය තුරන් කිරීමට එඩිතරවත්
අවංකවත් ක්‍රියා කිරීමේ වැඩ පිළිවෙළක්
නැති බවත් පෙනෙනවා. අග්‍රාණ්ඩුකාරතුමා
ගේ කථාවේ හැටියට නියම අන්දමට ක්‍රියා
කරනවය කිව්වත් එසේ නොකෙරෙන බව
මේ කාරණයෙන් ඔප්පු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැලස්
මවල තිබෙන දුර්වලකම් ඉතා පැහැදිලිව
ඊයේ පෙරේදා ඔප්පු වුණා. දන් අධික වර්
ෂාව පවතින කාලයයි, එහෙම තිබියදීත්
කැසල්රියේ ජලාශයේ වතුර මදිකම නිසා
ලක්ෂපාන ජල විදුලි ක්‍රමය ක්‍රියාවේ යොද
වන්න බැරි වුණා. ඒ නිසා ග්‍රෑන්ඩ්පාස්හි
තිබෙන යන්ත්‍ර කළුතෙල්වලින් ක්‍රියා කර
විදුලි බලය ලබා ගැනීමට වැඩ පිළිවෙළ
කරන්න සිද්ධ වුණා. අධික වර්ෂාව තිබෙන
කාලයෙත් වතුර මට්ටම පහළ බැස්සානම්
අධික නියඟයක් පවතින අවස්ථාවක
කොයි තරම් දුරට තත්ත්වය දුර්වල විය
හැකිද ? ඒ තත්ත්වය තවත් දුර්වල
වෙන්න ඉඩ තියෙනවා. දනට කිලෝවට්
50,000 ක වැඩ කරනවා. නෝටන් බ්‍රිජ්
භූමියේ තව නොබෝ කලකින් සම්පූර්ණ
කරන්න නියම කරගෙන තිබෙන ස්ටේජ්
2 බී කියන ජල විදුලි බලය ක්‍රියාවේ යො
දන්න යන විට කැසල්රියේ ජලාශයෙන්
යන්ත්‍ර ක්‍රියා කිරීමට යොදනවට වඩා
දෙගුණයක් වතුර යොදන්න ඕනෑ වෙනවා.
එතන කිලෝවොට් 50,000 ක් තිබෙනවා.
නෝටන් බ්‍රිජ්වල අංශ දෙකම ක්‍රියාවේ
යොදන්න නම් ජලාශයෙන් දනට නිකුත්
කරනවට වඩා තවත් ගුණයක් වතුර
නිකුත් කරන්න ඕනෑ. දනට නිකුත්
කරන ප්‍රමාණය අධික වර්ෂාව තිබෙන
කාලේ පවා මදි වන තත්ත්වයකයි
තියෙන්නෙ. මේ දෙක ක්‍රියාත්මක වන විට
සිදු වන්නෙ මොකක්ද ?

ලෝක බැංකුවෙන් සියේට හයේ පොළි
යට මුදල් ගත්තේ වී නමුත් රුපියල්
කෝටි විස්සක් වියදම් කළත්, නෝටන්
බ්‍රිජ්වල තිබෙන ජලාශය කවදාවත් සම්
පූර්ණයෙන් ක්‍රියාවේ නොයෙදෙන තත්ත්
වයකටයි වැටෙන්නෙ. වතුර මදිකම නිසයි
එහෙම වෙන්නෙ. ඊළඟට හදන ජලාශය
කැනඩා ආණ්ඩුවට කොන්ත්‍රාත් දීලයි
තියෙන්නෙ. මස්කෙළි ඔය ව්‍යාපාරය,
තවත් රුපියල් කෝටි විස්සක් පමණ විය
දම් කරන්න යොදා තිබෙනවා. මීට පෙර
සමාජවාදී රටවලින් ආ විශේෂඥයින් මේ
ගැන යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.
ඒක ගණන් ගත්තද ? එකම ප්‍රදේශයේ
පටන් නොගෙන වෙන වෙන ප්‍රදේශවල
පටන් ගන්න කිව්වා. ලංකාවේ එක් ප්‍රදේ
ශයකට වර්ෂාව ලැබෙන කාලෙට තවත්
ප්‍රදේශයක නියඟය පවතිනවා. ඒ නිසා
ඒ තත්ත්වයෙන් ප්‍රයෝජන ගත හැකි
අන්දමට වෙන වෙන ප්‍රදේශවල ජලාශ
යන් ඇති කිරීමෙන් මුළු අවුරුද්ද තුළම
කළුතෙල් පාවිච්චි නොකර ජල විදුලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලයම ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් යොදන්න පුළුවනි. ඒ විධියට කටයුතු කිරීමේ විපාකයක් තමයි කළු තෙල් විශාල ප්‍රමාණයක් යොදවා බලය ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්නට සිදු වීම. මෙය සිදු වූයේ සැලැස්මවල දුර්වලකම නිසාත්, අධිරාජ්‍යවාදී ආණ්ඩුවලින් උපදෙස් ගත් නිසත් බව කියන්න ඕනෑ.

**නියෝජ්‍ය කථානායක තුමා**

*(பிரதிச் சபாநாயகர்)*

(Mr. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමාට කථාකිරීමට තව කාලය තිබෙන්නේ මිනිත්තු 5 යි.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**

*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*

(Dr. S. A. Wickremasinghe)

කර්මාන්ත දියුණු කිරීම සඳහා මේ රටට අමු තෙල් ගෙනැවිත් එය තෙල් පෙරීමේ ආයතනයක් ඇති කිරීමේ වැඩ පිළිවෙළ ගැන කවුරුත් දන්නව. අයිතියෙන් භාගයක් පිට කොම්පැණිවලට තබා ගෙන මේක කරන්නයි යෝජනා කළේ. එහෙත් වෙකෝස්ලෝවාකියානු ආණ්ඩුව ලංකාණ්ඩුවට අවවාදයක් දුන්නා, සම්පූර්ණ අයිතිය ලංකාණ්ඩුව තබා ගෙන අවුරුදු තුනකින් වියදම කපා ගන්නට පුළුවන් වන අන්දමේ වැඩ පිළිවෙළක් සැලැස්විය හැකිය කියා. අපට සම්පූර්ණ අයිතිය ඇතිව තෙල් පෙරණ ආයතනයක් පිහිටුවන්න කියා ඔවුන් යෝජනා කළා. ඒ යෝජනාව තව මත් වාසිදයක අන්දමට, ඒ ක්‍රමයටම ඉදිරිපත් කර තිබෙනව. නමුත් තවම එය බාර ගෙන නැහැ.

විදේශිකයන්ට බාගයක් අයිති නැතිව, ලංකාවට සම්පූර්ණ අයිතිය ඇතිව කොන්ත්‍රාත්තුවක් ගන්නා අන්දමට විදේශීය ඉල්ලුම් පත් කැඳවන්නට ඕනෑය කියා අදහසක් දුන් ඉදිරිපත් වී තිබෙනවා. ඒ අවස්ථාවේදී කොන්ත්‍රාත්කරුවන්ට පුළුවන්කම තිබුණා, ඔවුන්ට දෙකෙන් කොටසක අයිතියක් නැතිව, ලංකාවට වාසි වන අන්දමට සම්පූර්ණ අයිතිය ලංකාවට ඇතිව කරන්නට පුළුවන්ය කියන්න අදහස දෙන්නට. කවුරුවත් එසේ කළේ නැහැ. නමුත් දැන් අපට පෙන්වා දී තිබෙනවා සම්පූර්ණයෙන්ම අයිතිය අපට ඇතිව කරන්නට පුළුවන් මාර්ගය. එසේ පෙන්වා ඇති නමුත් තවම ඒ කොන්ත්‍රාත්තුව අත්සන් කිරීම අධිරාජ්‍යවාදී කණ්ඩායම් වලත් ප්‍රතිගාමී කොටස්වලත් බලපෑම නිසා ක්‍රියාත්මක කරන්නට බැරි වී තිබෙනවා. ඒ නිසා, රටට වාසිදායක තත්ත්වයන්ට බාධා වන අන්දමට තිබෙන අයුතු බලපෑම්වලට විරුද්ධව කටයුතු කිරීමේ අවශ්‍යතාවත්, දූෂණයත් මැඩලීමේ වැඩ පිළිවෙළක අවශ්‍යතාවත් තිබෙන බව මතක් කරන්න කැමතියි.

පසුගිය දිනවල අගමැතිනියගේ විශේෂ ආරාධනාවක් උඩ ලංකාවේ ධීවර කර්මාන්තය ගැන පරීක්ෂා කර ආධාර දිය හැකි ක්‍රම දන්වන්නටය කියා සෝවියට් දේශයේ විශේෂඥයෙක් හා සෝවියට් සමූහාණ්ඩුවේ ඇමතිවරයෙක් ලංකාවට පැමිණ, ලංකාවේ ඇවිද, වාර්තා කියවා බලා, සුමාන ගණනක් මහන්සි වී, ධීවර කර්මාන්තය ගැන කරුණු ඉදිරිපත් කරන්නට කටයුතු කළා. එසේ කළ නමුත්—ඔවුන්ගේ ඒ ආධාරය ඇතිව කටයුතු කිරීම වැළැක්වීමට වැඩ පිළිවෙළක් තිබුණාද නැද්ද මා දන්නේ නැහැ—ඒ යෝජනා මොනවාද කියා දැනගැනීමටවත් අවසථාවක් වගකිවයුතු ඇමතිවරුන් විසින් නොසැලසීම නිසා පෙනෙනවා අයුතු බලපෑමේ තත්ත්වය කොතරම් දරුණු ද කියා. ධීවර කර්මාන්තය දියුණු කර ලංකාවට වුවමනා කරන සම්පූර්ණ මාළු ප්‍රමාණය නිපදවීමට තිබෙන සැලැස්මට බාධා ඇති වී තිබෙනවා. දැනට ලංකාවේ නිපදවන ටොන් 90,000 ටොන් 2,50,000 දක්වා වැඩි කිරීමට යොදා ඇති සැලැස්ම ක්‍රියාවේ යෙදවීමට බාධා පැමිණ තිබෙනවා. මාළු අල්ලන විශාල ජපන් නැව් 85 ක් පමණ ඉන්දියන් සාගරයේ තිබෙනවා. ලංකා ආණ්ඩුවේ මාර්ගයෙන් මේ මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදීමට නැව් සකස් කිරීමට ඒ අය බාධා කරනවා. විශේෂයෙන්ම ලංකාවේ ධනපතීන්, එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධව සිටින අයත් වෙන අයත් මේ ජපන් රටට අයිති බෝට්ටු 85 න් දෙකක අයිතිකාරයෝයි. ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා සැලැස්මක් අනුව වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

පිළිවෙලක් යෙදීමට බාධකයක් වී තිබෙනවා, මේ ජපන් කොම්පැනිකාරයනුත් ලංකා ධනපති කීපදෙනාත්.

සමුපකාර තොග වෙළඳ ආයතනයේ කටයුතු පුළුල් කිරීමට විධිවිධාන යොදන බව ආණ්ඩුකාරතුමාගේ කථාවේ සඳහන් වෙනවා. තොග වෙළඳාම සම්පූර්ණයෙන්ම ස. තො. සේ. ට බාරදෙන්න අදහස් කරනවා. එක කරුණක් ආණ්ඩුව අමතක නොකළ යුතුයි. සමුපකාර තොග වෙළඳ ආය කළ යුතුයි. සමුපකාර තොග වෙළඳ ආයතනය එක්සත් ජාතික පක්ෂය පටන්ගත් ව්‍යාපාරයක්. මේ ව්‍යාපාරය පටන්ගත් දා සිට අද වන තුරුත් සමූපකාර ව්‍යාපාරයක් වශයෙන්වත් තොග වෙළඳ ව්‍යාපාරයක් වශයෙන්වත් නොවෙයි, කටයුතු කරගෙන ගියේ. පෞද්ගලික ධනවතුන් ගෙනයන තොග වෙළඳාම නැති කර දමා රජයට අයත් තොග වෙළඳාමක් ඇති කිරීමේ පරමාර්ථයෙන් පටන්ගත් එකක් නොවෙයි, සමුපකාර තොග වෙළඳ ආයතනය. එදා සිටම එහි තිබුණු දුර්වලකම් අදත් තිබෙනවා. ඒ නිසා තොග වෙළඳාම සම්පූර්ණයෙන්ම ස. තො. සේ. ට පවරා ඒ මගින් ලංකාව පුරා බඩු බෙදා හැරීමට අදහස් කරනවා නම්, දැනට ඇති සමුපකාර සංගම් 70 ත් සමග තොග වෙළඳ ආයතනය සම්බන්ධ කොට කුමන විධියකට එම සේවය ශක්තිමත් කළ යුතුද යන්න ගැන පැහැදිලි ලෙස කල්පනා කොට මෙය කළ යුතුයි.

සමුපකාර තොග වෙළඳ ආයතනය සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ එකක් නොවෙයි. බඩු බෙදාහැරීමේ කටයුතු සමුපකාර සමිති ව්‍යාපාරයට සම්බන්ධකම් ඇති සමුපකාර සංගම් මාර්ගයෙනුත් කෙරෙනවා. මේ දෙකම එකට සම්බන්ධ කර වැඩ කිරීමට කටයුතු සැලැස්වීම අවශ්‍ය බව මම කියන්න කැමතියි.

අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ගම්බද ණය පිළිබඳව සඳහන් කළා. විවිධ සේවා සමුපකාර සමිති මාර්ගයෙන් ණය දීමේ වැඩ පිළිවෙලක් ඇති කිරීම ගැන ඒ මන්ත්‍රීතුමා කිව්වා. ග්‍රාම්‍ය බැංකු පිහිටුවීම සම්බන්ධයෙන් අද මහජන බැංකුවේ විශාල අර්බුදයක්, මත භේදයක්, ඇති වී තිබෙනවා. ඒ ව්‍යාකූල තත්ත්වය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. මම නව මුදල් ඇමතිතුමා ගෙනුත් අනික් ඇමතිවරුන් ගෙනුත් ඉල්ලා සිටිනවා මේ මතභේදයන් පිළිබඳවත් ඊට හේතු වූ කරුණු පිළිබඳවත් පරීක්ෂා කොට බලා ග්‍රාම්‍ය බැංකු පිහිටුවීම සම්බන්ධයෙන් සම්පූර්ණ පැහැදිලි ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස. එවිට ඒ පිළිබඳව අපට සාකච්ඡා කිරීමට අවසථාවක් සැලසෙනවා.

තවත් කරුණක් පිළිබඳව සඳහන් කිරීමට තිබෙනවා. කෘෂිකර්ම හා ආහාර කටයුතු පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් පීරිස් වාර්තාව ක්‍රියාත්මක කරන්නට යන බව දැනගන්නට තිබෙනවා. පීරිස් වාර්තාව ගැන අපේ බලාපොරොත්තුවක් ඇත්තේ නැහැ. ආහාර වගාව ගැනවත්, කෘෂිකර්මය ගැනවත්, ආණ්ඩුවේ ගොවිපොළවල් පිළිබඳවත් කිසිම පළපුරුද්දක් නැති, මූලික වශයෙන් තමන් රජයේ සේවය කළ කාලයේ විශේෂඥයන්ට ගණන් මිම් හැදීමට දක්ෂ සහ හොරකම් අල්ලා ගැනීමට දක්ෂ අය කළ විවේචන ගැන කල්පනා කර බැලීම ඥානවන්ත ක්‍රියාවක්. නමුත් මේවා සංශෝධනය කරන්ට ඒ උදවියගේ යෝජනා භාර ගන්ට යනවා නම්, එයින් ඉතාමත්ම විනාශදායක තත්ත්වයකට මුහුණ පාන්ට සිද්ධ වෙන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්ට ඕනෑ.

Sir, that I think is the biggest condemnation and the best condemnation of this Throne Speech or any Throne Speech. I would also request and answer from the Hon. Minister of Finance whether, after his alliance with this Government, he continues to be a Marxist or whether he is following the middle path policies enunciated by the late Prime Minister. He obviously cannot follow both policies.

I will now, for his edification and for the edification of some of the others who may have forgotten, repeat the opinion of the Hon. Finance Minister now that the word 'reactionary' has been used quite often. I will read to you what he said in the House in the course of the Budget Debate of 1962. This was what he said :

"I ask the Hon. Prime Minister : are we all reactionaries in this House merely because we oppose a cut in the rice ration and because we oppose a reactionary Budget ? Who is Mrs. Sirima Bandaranaike to call us reactionaries ? What are her credentials ? After all, she is a politician only by reason of the fact that she was the wife of Mr. S. W. R. D. Bandaranaike. Apart from that, has she had any past with regard to politics ? Nothing at all ! We have fought for the people of this country and for the progressive movement for the last twenty-five years. To dub us as reactionaries is a gross insult. She can have a meeting if she likes, but she has no right to dub us as reactionaries."—[OFFICIAL REPORT, 23rd August, 1962 ; Vol. 47, co. 3180-81.]

Sir, this word 'reactionary' is a very funny word. All those who are on that side of the Government are not reactionaries. Just because the Hon. Minister of Finance went from this side of the House to the other side, he is not a reactionary, but he was termed a reactionary before he crossed over. In his own words, I ask you, Sir, are we also reactionaries because we oppose this Government which has run this country since 1956. —[*Interruption.*] I have made a promise to myself not to meet any interruptions because my time is limited. In this Throne Speech we have to think of what they have said in the past. The Hon. Minister of Finance has been sceptical of their programme and their progress then. I would read to you once again from his own speech.

නියෝජ්‍ය කථානායක තුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy Speaker)

I am afraid if you go on quoting, you will have no time to speak.

කේ. හේරත් මයා.
(திரு. கே. ஹேரத்)
(Mr. K. Herath)

I will skip over that then and come to the present Throne Speech. We have had American capitalism thrown in from one side of the House and Russian Marxism thrown in from the other side. We have heard what is democracy, what is dictatorship, and what is capitalism. But, Sir, when we think of this Throne Speech, it reminds me of the raging controversy that is existing in America and Russia, today, the controversy of the feminine dress designers and feminine dress conscious people ; that is the topless dress fashions of America and the bottomless dress fashions of Russia. To my mind, this Throne Speech has neither the topless aspect of America nor the bottomless aspect of Russia, but it has an aspect that we see at every petrol shed—of being completely naked and being actually in the state you are born. Sir, that is a description of the Throne Speech. It is completely naked of any benefits that are to accrue to the people of this country.

Sir, let us look at this Throne Speech. I would have accepted the fact that everything cannot be mentioned in a Throne Speech. But the hon. Member for Dehiwala-Mount Lavinia (Dr. Colvin R. de Silva) says : "We do not tell lies". I am

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

reading from the Ceylon "Daily Mirror" of Monday, 13th July, 1964, where he says, "We do not tell lies. No reference was made in the Throne Speech to unemployment because our party did not wish to say lies. We cannot solve that problem in 12 months." I say that this Throne Speech contains no measures to solve any of the problems of this country within this year.

This Government boasts that it is entirely dependant on the support of the peasantry of this country. What measures or what programme have they proposed to assist the peasantry of this country? Have they any rehabilitation scheme for the rural masses of this country? Have they any sort of health scheme, employment programme or an old age pension scheme, which they even promised in the Throne Speech of 1962?

I now come to this very grave question of the housing shortage both in Colombo and in the rural areas. The housing shortage in Colombo can be overcome to a certain extent by acquiring the golf links in Colombo. These golf links serve very few people of this country. Let them acquire these golf links where they can have workers' towns. If this Government has not the finances, let them advertise abroad for firms which are prepared to invest money. Only let them give a guarantee that their money would be safe. Let the workers of this country, the white-collar workers and the manual workers of this country have a housing scheme where ultimately every worker can own a house after making the necessary payment over a number of years. Let them consider that aspect.

නියෝජ්‍ය කථානායක තුමා
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

The hon. Member has only five minutes more.

කේ. හේරත් මයා.
*(திரு. கே. ஹேரத்)*
(Mr. K. Herath)

Then there is the question of rural housing schemes. Rural housing schemes have not been thought of. You have not even considered that question in your Throne Speech, and that means that you are not able to solve the rural housing shortage. Why do you not take the local bodies into your trust and organize rural housing schemes through them? I would, Sir, in all sincerity ask this Government to implement rural housing schemes and rid the country of the shanty problem and the problem of housing in rural areas.

Sir, it is difficult for one to speak of so many shortcomings in this Throne Speech in fifteen or twenty minutes. However, I shall do my best and keep to the allotted time.

Then we come to the question of unemployment. The Government cannot solve the problem of unemployment. Why does it not tell the country so? Please tell the S. S. C. youth who are unemployed that you cannot solve this problem. Please tell the peasants about whom you boast you represent that you cannot solve the problem of under-employment in this country.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

We can!

කේ. හේරත් මයා.
*(திரு. கே. ஹேரத்)*
(Mr. K. Herath)

One of your own party men, a leading light, has said that the problem of unemployment cannot be solved. That is why it is not mentioned in the Throne Speech.

Why do you not consider the problems of the rural masses? You boast that you represent them. Why do you not look into their needs?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. හේරත් මයා.]

Why do you not go into this question of the alienation of Crown land? The present system of alienation, I am sorry to say, appears to be that the middle-class colonists are given preference over the villagers of the area. I would request the backbenchers of the Government to see to it that the villagers of the area get land before anyone else.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

We are doing just that.

**කේ. හේරත් මයා.**

*(திரு. கே. ஹேரத்)*

(Mr. K. Herath)

What I am saying is that before land in any area is—[*Interruption*].

**යූ. බී. වීරසේකර මයා.** (යටිනුවර)

*(திரு. யூ. பி. வீரசேக்கரா—யட்டிநுவர)*

(Mr. U. B. Weerasekara—Yatinuwara)

What did Mr. D. S. Senanayake do under the Waste Land Ordinance ?

**නියෝජ්‍ය කථානායක තුමා**

*(பிரதிச் சபாநாயகர்)*

(Mr. Deputy Speaker)

Order, please !

**කේ. හේරත් මයා.**

*(திரு. கே. ஹேரத்)*

(Mr. K. Herath)

Mr. Deputy Speaker, I hope that you will not count the time taken on these interruptions against me. I have taken no part in them.

I would appeal to the hon. Members of the Government to see that the land hunger of the peasants is satisfied before the middle-class are given land. There are a number of middle-class allotments coming up in my electorate, and I have fought tooth and nail to see that the needs of the peasants are satisfied first. I would appeal to the Hon. Minister of Lands to see that the land hunger of the people of the area is met first before he thinks of planting outsiders as middle-class colonists.

Then, Sir, the Throne Speech of 1962 states :

> " My Government proposes, at an early date, to consider a comprehensive reform of excise policy and procedure, including measures to combat the menace of the illicit distillation of deleterious alcoholic drinks. "

I would like to ask whether the Government has forgotten that promise. I would like to know whether the Government is in favour of the distillation of *kasippu* ? Does it not know that the crime rate of the country has increased on account of *kasippu* ?

In conclusion, I would like to remind hon. Members of the Government who were not here at that time, of the words of their late leader when he crossed over to the Opposition. He said, " First things first. " That is what I, too, would say to the hon. Members of the Government : " First things first. " The first things are food, shelter and clothing for the people of this country.

අ. භා. 3.47

**යූ. පී. වයි. ජිනදාස මයා.** (කුන්ඩසාලෙ)

*(திரு. யூ. பீ. வை. ஜினதாஸ—குண்டசாலே)*

(Mr. U. P. Y. Jinadasa—Kundasale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 5 වැනි පාර්ලිමේන්තුවේ 5 වැනි රාජාසන කථාව ගැන දැන් දවස් කීපයක්ම සාකච්ඡා කොට තිබෙනවා. මේ විවාදයේදී කථා කළ ගරු මන්ත්‍රීවරුන් මේ රාජාසන කථාව පිළිබඳව තම තමන්ගේ පෞද්ගලික අදහස් ඉදිරිපත් කළා වාගේම තම තමන්ගේ පෞද්ගලික චරිතය ගැනත් කරුණු ප්‍රකාශ කළා. කෙසේ වෙතත් සභාග ආණ්ඩුව පිහිටුවූවාට පසුව ඉදිරියට ඇති වර්ෂය තුල ඉතා මත් වැදගත් කටයුතු රාශියක් කරන බව මේ රාජාසන කථාවෙහි සඳහන් කර තිබීම මගේ බලවත් සන්තෝෂයට කාරණයක් බව මතක් කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් වැඩි වශයෙන්ම කාලය ගත කෙළේ මේ රටේ ප්‍රශ්න ගැන සඳහන් කිරීමට නොව සභාග ආණ්ඩුවක් පිහිටුවීම ගැන තම බිය පළ කිරීමටයි. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මේ සභාග රජය ගැන බොහොම කලබල වන බව පෙනී යනවා. ඔවුන් තුළ බියක් චකිතයක් තිබෙන නිසා තමයි, මේ ආණ්ඩුවට විරුඬව විප්ලවයක් කරන බව පවා ප්‍රකාශ කර තිබෙන්නේ. හැබැයි, යම් හෙයකින් එක්සත් ජාතික පක්ෂය විප්ලවයක් කරන්නට ලෑස්ති වුණොත් මේ රටේ ජනතාව ඊට සුදුසු පරිදි පිළිතුරු දෙන බවට නිසැක බව මා මතක් කරන්නට කැමතියි. එක්සත් ජාතික පක්ෂය මේ දවස්වල පළාත් පාලන මැතිවරණවලදී නම් හොඳ විප්ලව වගයක් කරගෙන යන බව පේන්නට තියෙනවා. එක්සත් ජාතික පක්ෂය පළාත් පාලන මැතිවරණවලදී කොතරම් නරක අන්දමින් ක්‍රියා කළාද කිවහොත්, මා නියෝජනය කරන කොට්ඨාශයේ මිනී මැරුමක් පවා ඇති කළා. දැන් ඒ පිළිබඳව කටයුතු කිරීම උසාවියට භාර කොට තිබෙන නිසා මා ඒ ගැන වැඩි යමක් කියන්නට කැමති නැහැ. ඒ නඩුවේ සාක්ෂිකාරයකු වශයෙන් උසාවියේ පෙනී සිටින්නට මටත් සිදු වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය අරක්කු, කසිප්පු බෙදා දෙමින් පළාත් පාලන මැතිවරණ කරගෙන ගියත් තමන්ට බලය ලැබී තිබෙන පළාත් පාලන ආයතනවලට කර තිබෙන සේවයක් ගැන නම් වැඩිපුර යමක් දැනගන්න නැහැ. කොළඹ නගර සභාවෙහි එක්සත් ජාතික පක්ෂයේ පාලනයක් තිබුණත් කොළඹ නගර වාසීන්ට ඒ නිසා සිදු වී තිබෙන විශේෂ යහපත කුමක්ද? කොළඹ නගරයට කර තිබෙන විශේෂ සේවය කුමක්ද? ඒ වගේම එක්සත් ජාතික පක්ෂයේ පාලනය යටතේ ගම්බද ප්‍රදේශවල තිබෙන පළාත් පාලන ආයතනවලිනුත් ඒ ප්‍රදේශවල ජනතාවට සිදු වන විශේෂ සේවයක් ගැන නම් කිසිවක් අපට දැන ගන්නට නැහැ. පළාත් පාලන මැතිවරණවලදී එක්සත් ජාතික පක්ෂය මහජනයා රවටන්නට සමත් වුණාට මින් ඉදිරියට නම් මේ රටේ පාලන බලයක් කවරදාකවත් එක්සත් ජාතික පක්ෂයට ලැබෙයයි මා නම් කිසිසේත් විශ්වාස කරන්නේ නැහැ.

එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ආගම ගැන කථා කරනවා. නමුත් ආගම ගැන මහ ලොකුවට කථා කරන එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් බොහොම දෙනකු ආගම අදහන්න දන්නෙත් නැති බව කිව යුතුයි. ඔවුන් බුද්ධාගම ගැන කථා කරනවා. නමුත් බුද්ධාගම අදහන්නේ නැහැ. බුදු හාමුදුරුවන්ට මල් පූජා කරන ගාථාවවත් ඔවුන් දන්නවාදැයි මට නම් සැකයි. සිංහල භාෂාව ගැනත් ඔවුන් අනුගමනය කරන ප්‍රතිපත්තිය ඒකයි. සිංහල භාෂාවට තැන දෙනවාය කියන එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් එකම සංශෝධනයක්වත් සිංහල භාෂාවෙන් ඉදිරිපත් කර නැහැ. ඒ අනුව අපට පෙනී යන්නේ කථාවෙන් එකක් කියන ගමන් ක්‍රියාවෙන් වෙන එකක් කරන බවයි. ඇත්තෙන්ම ජාතික විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීවරුන් පමණයි, සිංහල භාෂාවෙන් සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ ගැන අප ඒ ජාතික විමුක්ති පෙරමුණට ප්‍රශංසා කළයුතුව තිබෙනවා. සිංහලට තැනක් දෙනවාය කියමින් සිංහල භාෂාවෙන් සංශෝධනයක් ඉදිරිපත් කරන්නට බැරි, ඒ වගේම සිංහලෙන් කථා කරන්නට ඉදිරිපත් නොවන එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අප වැනි ගම්බද පෙදෙස්වලින් පැමිණ සිටින මහජන නියෝජිතයන්ට තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්නේ කොහොමද? මේ විධියට තමයි, එක්සත් ජාතික පක්ෂයේ සියලුම වැඩ. එකක් කියනවා; වෙන එකක් කරනවා. අපට මෙහිදී බොරු කරනවා වගේම රටටත් බොරු කරන්නටයි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් ලෑස්ති වන්නේ. ඔවුන් හැම විටම කරන්නේ රැවටිල්ලක්. [බාධා කිරීමක්] ඊළඟ මැතිවරණයේදී වැඩි වුණොත් එක්සත් ජාතික පක්ෂයට ආසන 25 ක් විතර ලැබේවි [බාධා කිරීමක්] කෙසේ වුවත් සභාග ආණ්ඩුව ඇති කළායින් පසුව එක්සත් ජාතික පක්ෂයේ උදවිය බොහොම බිය වී සිටිනවා. මේ ආණ්ඩුව කොමියුනිස්ට් වෙන්නට හදනවායයි කිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යූ. පී. වයි. ජිනදාස මයා.]

නවා. මේ රටේ දැන් අවුරුදු 30ක් පමණ කාලයක් තිස්සේ කොමියුනිස්ට් ධර්මය තිබෙනවා. මාත් දේශපාලනයට ඇදුණේ කොමියුනිස්ට් ධර්මය නිසාය කියලත් කියන්නට පුළුවනි. අධිරාජ්‍යවාදී ධනවත් රදළ උදවිය විසින් පාගා යට කරගෙන වහලුන් වශයෙන් සිටි අපේ ගම්වල සාමාන්‍ය මිනිසුන්ට නැගී සිටීමේ අවස්ථාවක් ලබා දීම ගැන කොමියුනිස්ට්වරුන්ට කෘතඥ වෙන්න ඕනෑ. මම ඒ අයට ආශීර්වාද කරනවා නොවෙයි. නමුත් අවස්ථාව ලැබුණේ ඒ අය නිසයි.

අද ආණ්ඩුවේ කාර්යාලවල තවමත් එක්සත් ජාතික පක්ෂයට ගැති කම් කරන නිලධාරීන් සියයට 75ක් පමණ ඉන්නවා. නමුත් මේ අලුත් වැඩ පිළිවෙල අනුව ඒ නිලධාරි මහත්වරුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගෙන යන ක්‍රියා මාර්ගයට ඔවුන්ගේ සහයෝගය දේවිය කියා අපි විශ්වාස කරනව. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති පාවා දී නැහැ. ඕනෑම කෙනෙක් අපේ ප්‍රතිපත්ති පිළිගෙන රජය ගෙන යාම සඳහා අප සමග එක් වෙනවා නම් සෑම අවස්ථාවේදීම ඒ සඳහා අපේ සහයෝගය දෙන බව අපි සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමතියි.

පළාත් පාලන ඡන්ද විමසීම්වලදී ලැබුණ ජය ගැන එක්සත් ජාතික පක්ෂය බොහෝම උදම් අනනවා. නමුත් ඒ පළාත් පාලන ආයතනවල—ගම්කාර්‍ය සභා සහ අනිකුත් පළාත් පාලන ආයතනවල—බලය තමුන්නාන්සේලාට ලැබුණේ කොහොමද? යම්කිසි පළාත් පාලන ඡන්ද කොට්ඨාශයක සිටින ඡන්ද දායක සංඛ්‍යාව 500ක් නම් එයින් 200ක් පමණ එක්සත් ජාතික පාක්ෂිකයන් ඉන්නවා යයි සිතමු. එතකොට ඡන්දය දිනා ගැනීම සඳහා තවත් ඡන්ද සියයක් පමණ මුදල් දී ගන්නවා. මේ නොබෝදා ඒ ප්‍රදේශයේ පැවති එක් ගම් කාර්‍ය සභා ඡන්ද විමසීමකදී එක් ඡන්දයට රුපියල් 2000ක් පමණ වියදම් කර තිබෙනවා. ඒවා දූෂණ නොවෙයිද? 1956ට කලින් ඔය විධියේ දූෂණ පුරුදු කෙළේ කවුද? බොරු පොරොන්දු දුන්නෙ කවුද? වේදිකාවට නැගී අරක දෙන් නම්, මේක දෙන්නම් අනික දෙන්නම් කියා බොරු පොරොන්දු දී දැන් අනිකුත් පක්ෂවලට දොස් කියනවා. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලාගේ ධනය සම්පූර්ණයෙන්ම රාජ සන්තක කරන්න ඕනෑ. ගරු මුදල් ඇමතිතුමා මෙහි නොසිටීම ගැන මා කනගාටු වෙනවා. ධනපතීන් ළඟ රුපියල් 5,000කට වැඩියෙන් තිබෙන සියලුම ධනය අරගෙන ඒවා මහජනතාවට දෙන්න ඕනෑ. ඔය කරුණු අනුව බලන විට තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිවලට අප කිසිසේත්ම එකඟ වන්නෙ නැහැ. ඒ ගම්වල තමුන්නාන්සේලාගෙ සගයන් කරන වැඩ කටයුතු ගැන බලන්න ඕනෑ. කළු කඩ කාරයන්ගෙන් සියයට 90 දෙනෙක්ම කවුද? බඩු මිල පහත ඇමීම සම්බන්ධයෙන් රාජාසන කථාවේ සඳහන් වී තිබෙනව. ඒ පිළිබඳව ක්‍රියා කිරීමේදී කඩවල සේවය කරන සේවකයන්ට පමණක් නොවෙයි, ඒවායේ අයිතිකාර මුදලාලිටත් දඩ ගසා එයිනුත් නවතින්නෙ නැතිව හිරේට යවන්න ඕනෑ. විශෙෂයෙන්ම බඩු හංගන උදවියට ලක්ෂයක් දඩ ගැසුවත් මදි. ඔවුන් හිරේට යවන්න ඕනෑ. අඩු වශයෙන් මුදලාලි අවුරුදු දෙකකටවත් සේවකයා අවුරුද්දකටවත් හිරේ යවන්න ඕනෑ.

ඊළඟට රාජාසන කථාවේ සඳහන් වෙනවා, අකාර්‍යක්ෂම නිලධාරීන් සියලු දෙනාම විශ්‍රාම ගැන්වීම ගැන. පසුගිය අවුරුදු 5 ඇතුළතදී මට අසන්න ලැබුණ හොඳම කථාව එකයි. අද මොනම කාර්‍යාලයකට ගියත් නිලධාරීන්ගේ සහයෝගයක් ලැබෙන්නෙ නැහැ. වැඩක් කර ගැනීමට ගිය විට, එක්කො නිලධාරියා නැහැ, නැත්නම් පයිල් එක නැහැ. එහෙමත් නැත්නම් උත්තර දෙන්න කෙනෙක් නැහැ. මනුෂ්‍යයෙක් වශයෙන් ගෙදරකට ගියාම වුණත් සාමාන්‍ය සැලකිල්ලක් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවේ කාර්‍යාලයකට ගියාම සාමාන්‍ය මනුෂ්‍යයෙක් හැටියට—මන්ත්‍රීවරයෙකු හැටියට ඕනෑ නැහැ—සාමාන්‍ය මනුෂ්‍යයෙකු හැටියට යම් කිසි සැලකිල්ලක් දක්වන්න ඕනෑ. නිලධාරීන්ගෙන් සියයට 75 දෙනෙකුගෙන් පමණ එවැනි සේවයක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා ඔවුන් එළවා දමා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී රජයකට උචිත වන අන්දමේ නිලධාරීන් යොදවා ගැනීමට මේ රාජාසන කථාවෙන් යෝජනා කර තිබීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා.

මහජන බැංකු සම්බන්ධයෙන් ඇති තවත් කාරණාවක් ගැන මම බොහොම සන්තෝෂ වෙනව. අවිස්සාවේල්ලෙ ගරු

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කර තිබුණා. මාස තුනකට කලින් පළමුවැනි ග්‍රාමීය බැංකුව ආරම්භ කෙළේ මගේ කොට්ඨාශයේයි. මගේ බලවත් උනන්දුවෙන් සහ ඕනෑකමින් ඒ බැංකුව ආරම්භ කිරීමේ අවස්ථාව සැලසුණු අතර, දැනට එය ඉතාමත්ම සාර්ථක අන්දමින් කටයුතු කර ගෙන යනවා. නමුත් මට දැන ගන්නට ලැබුණා ඒ බැංකු ක්‍රමයට විරුද්ධව—ඒ ක්‍රමය සුදුසු නැත කියා—මහජන බැංකුවේ කළමනාකාර සොලමන්ස් මහත්මයා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවය, මුදල් ඇමතිතුමා ඒ ගැන කලබල වී සිටිනවය කියා. මහජන බැංකුවලින් ණය ලැබෙන්නෙ නගරවල සිටින පොහොසත් උදවියට, ධනවත් වෙළඳුන්ට හා ආණ්ඩුවේ උසස් සේවකයන්ට පමණයි. ග්‍රාමීය බැංකු පිහිටුවීමෙන් බුලත් කාරයට පවා රුපියල් දෙසියය බැගින් ණය දීගෙන එනවා. ඒ අය ඒ ණය හරියට ආපසු ගෙවාගෙන එනවා. ගොවීන්ට, සුළු වෙළෙන්දන්ට, තේ කඩ කාරයන් ආදීන්ට රුපියල් දාහක් දක්වා ණය දෙනවා. ණය දෙන වැඩිම සීමාව රුපියල් දාහට නියම කර තිබෙනවා. රුපියල් 500ට වඩා ණය දෙන්න එපාය කියා සොලමන්ස් උන්නැහේ කියා සිටිය. නමුත් රුපියල් දාහක් ණය දීමට සුබසිංහ මහත්මයා තීරණය කළා. ඒ බැංකුවෙන් මේ මාස 3ට ලක්ෂය දක්වා ණය දී තිබෙනවා. ඒ ණය නියම අන්දමට ආපසු ලැබෙනවා. ඒ බැංකුව සතුටුදායක අන්දමට වැඩ කරන නිසා ඒ පිළිබඳව වාර්තාවක් ලබා ගෙන ලංකාවේ හැම තැන්වලම මේ විධියේ බැංකු පිහිටුවන ලෙස මම ඉල්ලා සිටිනවා. සමුපකාර ක්‍රමය අනුවයි, සමුපකාර ප්‍රතිපත්ති අනුවයි, ඒ බැංකු පිහිටුවා තිබෙන්නෙ.

මහජන බැංකුවෙන් ණයක් ගන්න ගියාම පගාව දෙන්න සිදු වන බව මට දැන ගන්න ලැබී තිබෙනවා. රුපියල් 5,000 ක ණයක් ගන්නට රුපියල් 500 ක පගාවක් දෙන්න ඕනෑලු. රුපියල් 2,000 ක ණයක් ගන්න රුපියල් 200 ක පගාවක් දෙන්න ඕනෑලු. අපේ කොට්ඨාශයේ නම් විශාල ප්‍රදේශයකින් තෝරා ගත් 9 දෙනකුගෙන් යුත් කාරක සභාවක් තියෙනවා. ප්‍රදේශයේ හැම පුද්ගලයකුගෙම චරිතය ගැන, හැම පුද්ගලයකුම කරන රක්ෂාව ගැන, මේ කාරක සභාව දන්නවා. මේ කාරක සභාවෙ පළමු වරට සභාපති හැටියට කටයුතු කරන්නෙ මමයි. ඒ කාරක සභාවෙ සභාපති හැටියට කටයුතු කිරීම මට ලොකු අමාරුවක් වෙලා තියෙනවා. සමහර විට මට ලබන වාරයේ ඡන්දයත් නැති වන්නට පුළුවන්. නමුත් මේ බැංකු ක්‍රමය ගැන ලොකු ප්‍රසාදයක් රටේ තියෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සෙගෙ ආසනයෙන් එවැනි බැංකුවක් පිහිටුවා ගන්නව නම් ඉතාම ප්‍රයෝජනවත්. එක ආසනයකට එක බැංකුව බැගින් පිහිටුවනව නම් ඉතාම හොඳයි.

මහජන බැංකුවේ ආදි කතෘ වූ අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමාට (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) මම කෘතඥ වෙනවා. ඒ බැංකු ක්‍රමය වඩා පළල් අන්දමට ක්‍රියාවෙ යොදවාගෙන යන ගරු ඉලංගරත්න ඇමතිතුමාටත් එය දියුණු කළ සුබසිංහ මහත්මයාටත් අපි ස්තුතිවන්ත වෙනවා.

සතොසේ ගැනත් වචනයක් දෙකක් කියන්න ඕනෑ. අපේ ආසනවලත් සතොසේ ශාඛා තියෙනවා. මුළු රට පුරාම සතොසේ ගැන ලොකු අප්‍රසාදයක් ඇති වී තිබෙනවා. සතොසේ ගැන අප්‍රසාදය පළ වන ලිපි ප්‍රවෘත්ති පත්‍රවලත් පළ වෙනවා. සතොසේ වැඩ සතුටුදායකය කියන්න පුළුවන්කමක් නැහැ. සමුපකාර සංගම්වල වැඩත් සතුටුදායක නැහැ. සමුපකාර සංගම් 110 ක් පමණ ලංකාවෙ තිබෙනවා. එයින් කීපයක හැර අනික් සෑම එකකම බලයට පත් වී සිටින්නෙ අපේ විරුද්ධකාර එක්සත් ජාතික පක්ෂයේ උදවියයි. ඒ අය ඒ සංගම්වල බලයට පත් වී බඩු හරියාකාර බෙදා නොදී නොයෙක් දූෂණවල යෙදෙමින් මහජනයා නොමග යවනවා. සමුපකාර සංගම් සතොසේට පවරාගෙන තොග බඩු වෙළඳාම පවරා දීමට අදහස් කරන බව පත්‍රයේ දැක්ක. ඒ ගැන ඒ සංගම්වල ඉන්න සේවකයන් සතුටු වන්න පුළුවන්; නමුත් ඒ වැඩ පිළිවෙළ ගැන ගම්බද ජනතාව සතුටු නැති බව මට කියන්න පුළුවන්.

ගිය අවුරුද්දෙ රාජාසන කථාවේ සඳහන් වුණා, මගේ කොට්ඨාශයේ ග්‍රාමීය කර්මාන්ත මධ්‍යස්ථානයක් ආරම්භ කරන බව. අද ඉතාමත් සතුටුදායක අන්දමින් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජිනදාස මයා.]

මධ්‍යස්ථානයේ කටයුතු කරගෙන යනව. මම ඒ ගැන ඉතාමත් සන්තෝස වෙනව. ඒ අතර මේ අවුරුද්දේ රාජාසන කථාවෙ සඳහන් වී තිබෙනව, කොකෝ වගාවට රජයේ ආධාර දෙන බව. මගේ කොට්ඨාශයේ පමණ විශාල ලෙස, වෙන කිසිම මැතිවරණ කොට්ඨාශයක කොකෝ වගාව කෙරෙනවය කියා මම සිතන්නෙ නැහැ. මාතලේ, නුවර, වැනි ආසනවල කොකෝ වගාව කෙරෙනව ඇති; නමුත් බොහෝ තැන්වල කොකෝ වගාව දැන් සම්පූර්ණයෙන්ම නැති වේගන යනව. කොකෝවලින් ලංකාවට ලැබුණු ආදායම බොහො සෙයින් අඩු වේගන යනව. අවුරුදු 25 කට පමණ ප්‍රථම ලංකාවේ අවුරුද්දකට කොකෝ හොණ්ඩර ලක්ෂයක් පමණ නිපදවා තිබෙනව. නමුත් ඒ ගණන 60,000 ට, 40,000 ට ආදි වශයෙන් බැහැල තියෙනව. මේ අවුරුද්දේ කොකෝ හොණ්ඩර 25,000 ක්වත් නිපදවන්න පුළුවන් වේද කියන්න බැහැ. වතු හිමියන්ගේත් අපේත් බලවත් ඉල්ලීම නිසා පරණ කොකෝ වගා ඉවත් කර අළුතෙන් කොකෝ වගාව ඇති කිරීමට මුදලින් ආධාර දීමට යන බව මේ වර රාජාසන කථාවෙන් ප්‍රකාශ වීම ගැන මම ඉතාමත් සන්තෝස වෙනව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමාට වෙන් කළ කාලය දැන් අවසානයි.

**ජිනදාස මයා.**
*(திரு. ஜினதாஸ)*
(Mr. Jinadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව බොහොම ටික වෙලාවයි ගන්නෙ. මගේ කථාව තව විනාඩියකින් අවසන් කරන්නම්. කොකෝවා ගැන උනන්දුව ක්‍රමක්‍රමයෙන් වැඩි වේගන එනව. අද මේ රටේ චොකලට් සෑදීමේ කර්මාන්තශාලා විශාල සංඛ්‍යාවක් හදාගෙන යනව. මා නියෝජනය කරන ඡන්දදායක කොට්ඨාශයෙත් චොකලට් හදන කර්මාන්ත ශාලාවක් හදාගෙන යනව. ඒ කටයුත්ත එක්තරා කොම්පැනියක් මගිනුයි කෙරෙන්නෙ. රුපියල් විසි ලක්ෂයක් පමණ ඒ වෙනුවෙන් වැය කරන්න කොම්පැනිය බලාපොරොත්තු වෙනව. එතන ඇතැම් දේවල් අශෝභන අන්දමට කරගෙන යන බවට ආරංචි ලැබෙනව. සේවකයන් ගැනීමේදී ආගම අනුවත් බලපෑම් ඇති වෙනවලු. රක්ෂාවල් ලබා ගැනීමට එන උදවිය කතෝලිකද නැත්නම් මොන ආගමට අයිතිද යනුවෙනුත්, මොන ජාතියට අයිතිද යනුවෙනුත්, ප්‍රශ්න මතු කරනවලු. ඒ ගැනත් මතක් කරන්න ඕනෑ. ඒ ගැනත් ගරු ඇමතිතුමන්ලා යම්කිසි පරීක්ෂණයක් පවත්වනව නම් සුදුසු බව මතක් කරමින් මගේ වචන සවල්පය අවසන් කරනව.

අ. භා. 4.4

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.** (නිවිතිගල)
*(திரு. ஸ்டான்லி மொல்லிகொட—நிவிதிகல)*
(Mr. Stanley Molligoda—Nivitigala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පස්වැනි පාර්ලිමේන්තුවේ අන්තිම රාජාසන කථා විවාදයට මා සහභාගි වන්නේ ඉතාමත් සන්තෝෂයෙනුයි. විශේෂයෙන්ම දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාණන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ප්‍රතිපත්ති අන්තිම අකුරටම පිළිපදින මහජන මන්ත්‍රීවරයෙකු හැටියට මේ රාජාසන කථාවේ අඩංගු සමහර කරුණු ගැන පමණක් කථා කරන්නට මා මේ අවස්ථාවේ අදහස් කරන්නේ ඒ සඳහා අපට දී තිබෙන කාලය ඉතාමත් සීමාසහිත නිසයි.

1956 වර්ෂයේදී සකල ලෝකයාම මවිත කරවමින් ලෝක ඉතිහාසයේ පළමුවැනි වරට මහජනයාගේ නිදහස් ඡන්දයෙන් ප්‍රජාතන්ත්‍රවාදිවූත් සමාජවාදිවූත් ආණ්ඩුවක් ලංකාවේ පිහිටුවීමට ඉඩක් ලැබුණේ දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාණන්ට පමණයි. එතුමාට එදා ඒ විධියට මේ රටේ ආණ්ඩුවක් පිහිටුවීම සඳහා මහජනයගෙ සහයෝගය ලැබුණේ එතුමා අනුගමනය කළ ප්‍රතිපත්තිවල ඇති වැදගත්කම මේ රටේ එවකට හිටපු බහුතර මහජනතාව පිළිගත් නිසයි. එහෙත් ලෝකයේ අනිකුත් රටවල අවුරුදු ගණනාවක් තිස්සේ කැකෝගසා, ලේ වගුරුවා විප්ලව ඇති කරමින් සමාජවාදයක් හැටියට හුවා දක්වමින් ඇත්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වශයෙන්ම රුසියාව, චීනය, හංගේරියාව ආදි රටවල ඒකාධිපති භාවයක් ඇති කළේ වී නමුත් අපේ අසහාය නායකයාණන් වූ දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා මේ රටේ මහජනයාගේ සිය කැමැත්තෙන් දෙන ලද නිදහස් ඡන්දයේ බලයෙන්ම මේ රටේ සමාජවාදි ආණ්ඩුවක් ඇති කළ බව සඳහන් කරන්න පුළුවනි. අන්න ඒ නිසයි දිවංගත අගමැතිතුමාගේ ශ්‍රී නාමය මේ රටේ ඉතිහාසයේ රන් අකුරින් ලිය වෙන්නෙ. ලෝකයේ රටවල් ගණනාවක් තිබෙනව. එයින් රාශියක්ම සමාජවාදි ක්‍රමය අනුගමනය කරන රටවල්. එහෙත් එයින් එක රටකවත් ප්‍රජාතන්ත්‍රවාදීව, මහජනයගෙ නිදහස් ඡන්දයෙන්, ප්‍රජා තන්ත්‍රවාදි ආණ්ඩු ක්‍රමයක් බිහි කරන්න ඔවුන්ට බැරි වුණා. ලෝකයේ වෙනත් රටවල එවැනි තත්ත්වයක් පවතිද්දී දිවං ගත ගරු අගමැතිතුමා ඉදිරිපත් කළ ඒ මැදි පිළිවෙත මේ රටේ බහුතර මහජනතාව පිළිගත් නිසා සකල ලෝකයා මවිත කරව මින් එතුමා ඒක කළා. ඒ වගේම 1960 ජූලි මාසේ පැවැත්වුණු ඒ නිදහස් මහා මැතිවරණයෙදි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 75ක් ලැබුණේ දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ දෙශපාලන මැද පිළිවෙත හෙවත් මැද මාවත ඔස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගමන් කළ නිසයි. බණ්ඩාරනායක ප්‍රති පත්ති අත්හැර දමා, එදා 1960 ජූලි මැතිවරණයෙදි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මහජනයා ඉදිරියට ගියා නම් එම පක්ෂයට ආසන දහයක්වත් ලබා ගත හැකිව තිබුණාය කියා මා නම් හිතන්නෙ නැහැ. එම නිසා තවමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අනුගමනය කරන්නෙ බණ්ඩාරනායක අගමැතිතුමාණන්ගෙ එම ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි වැඩ පිළිවෙල අන්තර්ගත මැද පිළිවෙතම නම් ඒ ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනව. අප ප්‍රජාතන්ත්‍රවාදය රැකිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රාජාසන කථාවේ අඩංගු කර තිබෙන කරුණක් පිළිබඳව මගේ තරමක බියක් තිබෙන බව කියන්න අදහස් කරනවා. මේ රාජාසන කථාවේ මෙසේ සඳහන් කර තිබෙනවා :

"රාජ්‍ය භාෂා පනත හා සාධාරණ දෙමළ භාෂා පනත සිංහල හා දෙමළ දෙවර්ගයාට වඩාත් පිළි ගත හැකි වන පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රෙගුලාසි සම්පාදනය කරනවා ඇත."

1956 දී ඇතිවූ ඒ මහා මැතිවරණයේදී දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාර නායක අගමැතිතුමා මහජන එක්සත් පෙරමුණේ නායකයා හැටියට එදා මේ රටේ ජනතාවට දුන් එකම පොරොන්දුව සිංහල පමණක් රජයේ භාෂාව කරන බවයි. එතුමා ඇති කළ එකම පොරොන්දුව ඒකයි. අපි දන්නවා, ඊට පසුව එතුමා ෆෙඩරල් පක්ෂයේ නායක චෙල්වනායගම් මහතාත් සමග යම් ගිවිසුමක් ඇති කර ගත්තා. එහෙත්, මේ රටේ සිංහල මහ ජනතාවගේ ඉල්ලීම පරිදි ඒ ගිවිසුම ඒ දිවංගත අගමැති තුමා විසින්ම ඉරා දැම්මා. එම නිසා මා අදහස් කරන්නේ දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා එදා 1956 දී මේ රටේ මහජනතාවට දුන් පොරොන්දුව අපි ක්‍රියාත්මක කළ යුතු බවයි. ඊට හේතුව මෙහි මේ විධියට දක්වා තිබෙනවා.

"මේ රට ප්‍රගතිය කරා යන ගමන 1956 දී දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන්, සමාජවාදී පදනමක් මත ආරම්භ කරන ලදී. සාමාන්‍ය ජනතාවගේ මෙම සමාජයීය, සංස්කෘතික, දේශපාලනමය හා ආර්ථික ජයග්‍රහණය තවත් ඉදිරියට ගෙනයෑම හා වැඩ කරන ජනතාවගේ..............."

ඔය විධියට දිගටම තිබෙනවා. එම නිසා සිංහල පමණක් රජයේ භාෂාව කළේ 1956 මහ මැතිවරණයෙන් ඇති වූ ඒ ජයග්‍රහණය පිටයි. 1956 මේ රටේ මහ ජනතාව ඇති කළ ඒ ජයග්‍රහණය තහවුරු කිරීමට බලාපො රොත්තු වනවා නම් සිංහල පනත අඩපණ කිරීම අපට කොහෙත්ම කරන්න පුළුවන් දෙයක් නොවෙයි. එතුමාගේ පොරොන්දුව පැය 24න් සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීමයි. ඒ වගේම එතුමා එය කළා. එම නිසා මේ රාජාසන කථාවේ තිබෙන "සාධාරණ දෙමළ භාෂා පණත" කියන දේ මොකක්ද කියා මට තේරෙන්නේ නැහැ. දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාර නායක මහතා එය පිළිගත්තේ නැහැ. චෙල්වනායගම්-බණ්ඩාරනායක ගිවිසුම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොල් ලිගොඩ මයා.]
එතුමා අතින්ම එතුමා ඉරා දැම්මේ මේ රටේ සිංහල මහජනතාවගේ ඉල්ලීම උඩයි. එම නිසා සාධාරණ දෙමළ භාෂා පනත කියන එකට මගේ යම්කිසි බියක් තිබෙන බව මා ප්‍රකාශ කරන්න කැමතියි.

ඊළඟට ඉතාමත්ම වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ සිටින දස ලක්ෂයක් පමණ වූ ඉන්දියානු ජාතිකයින්ගේ ප්‍රශ්නය ගැන 1944 සිටම ලංකාවත් ඉන්දියාවත් අතර යම් යම් සාකච්ඡා කතා බහ ආදිය ඇති වුණා. අගමැතිවරුන් කීප දෙනෙක් හිටියා. රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේදීත් සාකච්ඡා තිබුණා. අගමැති වරුන් හතර පස් දෙනෙක්ම සිටියා. ඉන්දියානු රජයත් සමග ඔවුන් සාකච්ඡා කළා. එහෙත් මේ ප්‍රශ්නය තවම විසඳුනේ නැහැ. මේ රාජාසන කථාවේ ඒ ගැන කියන්නේ මෙහෙමයි:

"ලංකාවේ පුරවැසි පණත් අනුව දැනට පුරවැසි බවක් නොමැති ඉන්දියානුන්ගෙන් පැවතෙන්නන්ගේ පුරවැසිභාවය විසඳීම සඳහා ලංකාණ්ඩුව අතර සාකච්ඡා දැනටමත් ආරම්භ කර ඇති අතර දැනට තිබෙන ප්‍රශ්නය විසඳීමට ඇති බාධකයක් ඉවත් කරලීමට මාගේ ආණ්ඩුව අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි පොඩි පැටලිල්ලක් තිබෙන බවයි මට නම් පෙනෙන්නේ. "අපේ පුරවැසි පණත් අනුව" යයි කියා තිබෙනවා. ඉන්දියානුවන් පිළිබඳව අපේ රටේ යම් පුරවැසි පනතක් තිබෙනවා නම් එය 1949 දී සම්මත වූ ඉන්දියානු සහ පකිස්තානු පුරවැසි පණතයි. ඒ පුරවැසි පණත අනුව එක්තරා සංඛ්‍යාවක් ඉන්දියානුවන්ගෙන් පැවැත එන්නන් මේ රටේ පුරවැසියන් හැටියට ලියාපදිංචි කළ යුතුයි. දැන් එය කර හමාරයි. ඒ අනුව එක් ලක්ෂ තිස්තුන් දහසක් ඉන්දියානුවන්ගෙන් පැවැත එන්නන් මේ රටේ පුරවැසියන් හැටියට ලියාපදිංචි කර ඉවරයි. ඒ ගණන නම් ටිකක් වැඩියි. එහෙත් ඔවුන් බාරගැනීමට අපි සූදානම්. අපි 1,33,000ක් මේ රටේ පුරවැසි පණත් අනුව ලියාපදිංචි කළා නම් මේ රජයට තිබෙන්නේ අනික් සියලු දෙනාම ඉන්දියානු පුරවැසියන් හැටියට ගණන් ගැනීමටයි.

1944 සිට ඉන්දීය රජයත් සමග අපි මේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. අවුරුදු 20ක පමණ දීර්ඝ කාලයක් අපි සාකච්ඡා පවත්වා තිබෙනවා. එහෙත් තවමත් කිසිම සම්මුයතික් ඇති වී නැහැ. මම නම් විශ්වාස කරන්නේ නැහැ, අනාගතයේදීත් මේ පිළිබඳව ඉන්දියානු ආණ්ඩුවත් සමග සාකච්ඡා කිරීමෙන් යම් සම්මුතියක් ඇති කර ගැනීමට පුළුවන් වේය කියා.

මේ රජයේ අදහස අපේ පුරවැසි පණත් අනුව මේ ප්‍රශ්නය විසඳීමට නම්, මම කියන්න කැමතියි, මේ ප්‍රශ්නය අපි විසඳා හමාර බව. අපේ පුරවැසි පණත් අනුව 1,33,000ක් අපි ලියාපදිංචි කර තිබෙනවා. ඉන්දියානු සහ පකිස්තානු පුරවැසි පණත අනුව තවත් ඉන්දියානුවන් මෙරට පුරවැසියන් හැටියට ලියාපදිංචි කිරීමට අපට පුළුවන්කමක් ඇත්තේ නැහැ. තවත් ලියාපදිංචි කරනවා නම් අපට තිබෙන්නේ එම පණත සංශෝධනය කිරීමටයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිරිමාවෝ බණ්ඩාරනායක රජය ඉන්දියානු සහ පකිස්තානු පණත සංශෝධනය කරනවා නම් මම ආණ්ඩු පක්ෂයෙන් අස් වෙනවා පමණක් නොව, ඊට විරුද්ධව අන්තිම හුස්ම දක්වාම සටන් කිරීමට මම මේ මන්ත්‍රී මණ්ඩලයේදී දිව්රා පොරොන්දු වෙනවා.

අවුරුදු ගණනක් තිස්සේ අපි ඉන්දියානු ආණ්ඩුවත් සමග මේ පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. එසේ නම් ඇයි අපට කියන්න බැරි, අපි 1,33,000ක් පිළිගෙන තිබෙනවාය කියා. එතකොට ඉතිරි අයට කරන්නේ මොකක්දැයි අහවි. ඊට පිළිතුර මෙයයි: අසවල් දිනයේ සිට—කියමු, 1965 ජනවාරි 1 වන දා සිට කියා—මේ රටේ සියලුම රක්ෂා—පෞද්ගලික අංශයට අයත් සෑම ආයතනයකත්, වතුවලත්, රජයේ අංශයේත් රක්ෂා—හිමි වන්නේ ලාංකිකයන්ට පමණක්ය, මේ රටේ පුරවැසියන්ට පමණක්ය, කියා පණතක් මේ මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කරන්නට පුළුවනි. මේ මන්ත්‍රී මණ්ඩලය එම පණත සම්මත කළොත් ප්‍රශ්නය ඉබේටම විසඳෙනවා.

ඉන්දියානුවන් මේ රටේ සිටින්නේ අපට තිබෙන ආදරයක් නිසා නොවෙයි. ඔවුන්ට ඉන්දියාවේ තිබෙන රක්ෂාවලට වඩා හොඳ රක්ෂා මෙහි තිබෙන නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකාවේ පුරවැසි පණත් අනුව මේ ප්‍රශ්නය විසඳනවා නම් ඉන්දියාවත් සමග නවත් මේ පිළිබඳව සාකච්ඡා කරන්නේ මොනවටද? බාජ්පායි-ඞී. එස්. සේනානායක සාකච්ඡා ආරම්භ කළේ 1941 වර්ෂයේදීයි. දැනට අවුරුදු 23 කට පෙරයි. මේ ප්‍රශ්නය විසඳන්ට පුලුවන් එකම ක්‍රමය සහ එකම මාර්ගය නම්, මේ රටේ ඕනෑම පෞද්ගලික ආයතනයක වේවා, රජයේ ආයතනයක වේවා රක්ෂා දෙන්නේ මේ රටේ පුරවැසියන්ට පමණය කියා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පණතක් ඉදිරිපත් කිරීමයි. එසේ කළාම මේ ඉන්දියානුවන් ඉබේම යාවි. මේ ප්‍රශ්නය ඉතාම බැරෑරුම් ප්‍රශ්නයක්. විශේෂයෙන්ම මේ ප්‍රශ්නයේ තිබෙන බරෑරුම්කම තේරෙන්නෙ වතුකරයෙන් පැමිණ සිටින අපටයි. අප නියෝජනය කරන කොට්ඨාශවල මහජනතාව රක්ෂා නැතිව දුක් විඳිනව. නමුත් මේ රටේ පුරවැසිකම් නැති අයට වතුවල රක්ෂා ඇතුළු හැම සම්පතක්ම තියෙනව. ඔවුන්ට අයිතිවාසිකම් තියෙනව; ඉන්න හිටින්න තැන් තියෙනව; ඒ වාගේම අසනීපයක් වුණාම බෙහෙත් ගන්න බෙහෙත් ශාලා තියෙනව. නමුත් අර ගමේ කම්කරුවාට ඒ අයිතිවාසිකම් එකක්වත් නැහැ. ඔහුට ලැබෙන්නෙ දිනපතා පඩියක් පමණයි. සමහර දවස්වල රක්ෂාව නැත්නම් නිකම් ඉන්න ඕනෑ. මේ රටේ සිංහල ගොවි කම්කරු ජනතාව හැමදාම ඉන්දියානු කංකානම්ලාගේ වහලුන් වශයෙන් සිටිය යුතුද කියා මා ප්‍රශ්න කරනව. ඒ නිසා මා කියූ අන්දමේ පනතක් වහාම ඉදිරිපත් කරන්ට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කම්කරු ඇමතිතුමා දැන් නැහැ. එතුමා අපට පොරොන්දුවක් දුන්නා මේ රටේ ගම්වලින් පැමිණෙන වතු කම්කරුවන්ට ඉන්දියානු වතු කම්කරුවන්ට තිබෙන සෑම අයිතිවාසිකමක්ම දීමට නීති ගේනවාය කියා. නමුත් තවම එතුමා ඒ නීති ඉදිරිපත් කළේ නැහැ. ඒ සම්බන්ධයෙන් තවම එතුමා කිසිවක් කර නැහැ. රටක් තිබෙන, ජාතියක් තිබෙන, මේ රටේ පාරම්පරික පුරවැසියන්ට වඩා පිටරටින් පැමිණි අයට අයිතිවාසිකම් දීම මිනිස් ගතියක් නොවෙයි. ඒක මෘග ගතියක්; මෘගයින්වත් නොකරන දෙයක්. තමන්ගේ දරුවාට, මේ රටේ පාරම්පරික පුරවැසියන්ට ඒ අයිතිවාසිකම් ඇත්තෙම නැහැ. නමුත් අර ඉන්දියානු කම්කරුවන්ට ඊට වඩා අයිතිවාසිකම් දී තිබෙනවා.

අල්ලස් දූෂණ චෝදනා ගැන කියන විට තල්ගොඩපිටිය අල්ලස් කොමිසමෙන් වරදකරුවන් බවට ඔප්පුවූ අයට තවම රජය විසින් දඬුවම් කර නැති බව මා මතක් කරන්ට සතුටුයි. ඒ අයට දඬුවම් දීම සඳහා ඉක්මණින්ම රජය විසින් පණතක් ඉදිරිපත් කරනවා ඇත කියා සම්පූර්ණ වශයෙන් මා බලාපොරොත්තු වෙනව.

අවසාන වශයෙන් මේ රාජාසන කථාවේ සඳහන් වූ එක් කරුණක් ගැන මා ඉතාමත් සන්තෝෂ වුණා.

"පොදු රාජ්‍ය මණ්ඩල සම්බන්ධතාවයේ වැදගත්කම මාගේ ආණ්ඩුව පෙරසේම පිළිගනියි. ළඟදී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය අගමැතිවරුන්ගේ රැස්වීමට මාගේ අගමැතිනිය සහභාගි වෙනවා ඇත."

ඇත්තෙන්ම පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් තරම් අපට පක්ෂපාත රටවල් තිබෙනවාය කියා මා සිතන්නෙ නැහැ. ඒ නිසා පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් සමග අපි වෙළහෙළඳාම් වැඩි වැඩියෙන් කළ යුතුයි. පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල යම් යම් අවුල් ඇති වුණාම, පොදු රාජ්‍ය මණ්ඩලයෙන්ම ඒවා නිරවුල් කිරීමේ වැඩ පිළිවෙළක් අපේ ගරු අගමැතිනිය පොදු රාජ්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙන බව මා ගිය සතියේ පුවත්පත් වලින් දැක්කා. ඒ පිළිබඳව මා ගරු අගමැතිනියට ප්‍රශංසා කරනවා.

ඉන්දියානු ප්‍රශ්නය නම් වහාම විසඳිය යුතුයි. එසේ නොකළොත් වැඩි කලක් යන්ට පෙර වතුකරයේ සිටින අපේ සිංහල මහජනතාව මිටියාවත්වලට තල්ලු වී ගොස් කළු සහ මහවැලි ගංගාවලට අසුවී අවසානයේ මහ මුහුදට ගසා ගෙන යන්න පුලුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ටී. ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
(මීගමුව)
(திரு. ரி. குவெண்டின் பெர்ணண்டோ—நீர்கொழும்பு)
(Mr. T. Quentin Fernando—Negombo)

I would like in the fiirst instance to make reference to a fascinating observation that has been made towards the last part of the first paragraph of the Throne Speech.

It reads :

"I have broadened the base of My Government by the formation of a Coalition Government on the 11th of June, 1964. This step has evoked widespread and universal acceptance and enthusiasm of the wide mass of the people."

I cannot understand how the Government came to the conclusion to make that observation.

It has been argued that in other countries coalitions of various parties have taken place. But I would like to say that this coalition between the Sri Lanka Freedom Party and the Lanka Samaja Party is on a different plane altogether. The policies of these two parties are diametrically opposed to each other. I would like to quote what the late Prime Minister Mr. S. W. R. D. Bandaranaike had said in two speeches, one at the Town Council of Pussellawa and the other at Ibbanawewa. I would like to repeat those words because I feel that one more repetition would be better for the masses to know what he had said and what it means. This was what he said :

"Marxist parties have no place in this country. They can only hope to capture power by revolution and maintain a form of dictatorship as they have done in certain foreign countries.

Marxism is an alien philosophy which is not suitable for this country. That is why the L. S. S. P. and the C. P. despite their long political existence here have not been able to win the support of the people."

This is an announcement by your late Prime Minister Mr. Bandaranaike. If the present Prime Minister goes back on that announcement it does not mean that she is following the footsteps of her late husband. Marxism which has been condemned by the late Prime Minister has been accepted by the present Prime Minister as something which is necessary to carry on this Government. I would like to ask the present Prime Minister : Is there no intelligentzia amongst you, the Members of the Government Party, to carry on this Government for one more year ?

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්
(නලූර්)
(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)
(Dr. E. M. V. Naganathan—Nallur)

There is no intelligentzia at all.

ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
(திரு. குவெண்டின் பெர்ணண்டோ)
(Mr. Quentin Fernando)

If there is no intelligentzia is it justifiable for the present Prime Minister to form a coalition with a party which had been abandoned by her late husband ? How is it compatible for two parties which have two different policies to work together ?

The other day my Friend the hon. First Member for Colombo South (Mr. J. R. Jayewadene) asked a question whether the new Members of the L. S. S P in the Government are Marxists or not ? I remember having seen the Hon. Minister of Communications nodding his head and saying that they are not going to give up their Marxist policies in the present Government. If that is so, I ask you again, is it compatible for two different parties with different policies to carry on as a democratic government ?

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

Unlike poles attract !

ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
(திரு. குவெண்டின் பெர்ணண்டோ)
(Mr. Quentin Fernando)

That is the simple question I would like to ask. No, Sir. The Hon. Prime Minister did not form this Coalition for any other reason than this. She

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

knew that the present Government will not be able to go very far. She was afraid that her Government would be defeated on the Floor of this House if any important matter were debated, because there was only a meagre majority for the Government in the House. She, therefore, enlisted a party which had not been wanted by the late Prime Minister, Mr. S. W. R. D. Bandaranaike to gain more strength.

There was an addition of ten L. S. S. P. Members to the Government Party. She is now secure in her seat and is able to continue for another year. That is the truth. But I repeat that that is no justification whatsoever to form a Coalition of these two parties which have different views and policies.

There was talk of extending the life of this Parliament and not holding a General Election next year. According to the Constitution, elections must be held once every five years. They must, therefore, hold elections by July next year. It is rather amusing to find that there are two different schools of thought with regard to this matter on the Government side. One school holds the view that elections must be held next year in accordance with the provisions of the Constitution. The Hon. Minister of Food (Mr. F. R. Dias Bandaranaike) does not want to go against the Constitution. He says: " You must have elections next year ". Then the hon. Member for Kurunegala says that elections must be postponed. For how many years, he does not say. He says that elections must be postponed : for what purpose we do not know. Here you are, two hon. Members on that side holding two different views on an important issue. How can you reconcile one with the other ?

As to why I say that Marxists cannot carry on a government with a democratic party, I will give you another illustration. To Marxists religion is opium ; but in the Throne Speech it is said :

" In continuation of My Government's policy, while ensuring for Buddhism its proper place in the country as the religion of the majority, complete freedom of worship will be guaranteed to all religions and no injustice will be done to anybody on grounds of religion and worship. "

Is it possible for the present Government to undertake this ? The Marxists say that there should be no religion whatsoever. The S. L. F. P. Government want to propagate Buddhism and ensure that there is no injustice to other religions. Two different views—and you expect a Coalition Government to carry on ! How can they carry on with diametrically opposed policies ? You say that this Coalition Government has been approved by the masses in the country. How did you come to that conclusion ? —I am asking you. Did you consult the people of this country ? Did you get a mandate from the people of this country to form a Coalition ?

In 1956 you had a Government formed by Mr. Bandaranaike into which he took persons from the Leftists' side to form the Cabinet. Wihin $3\frac{1}{2}$ years he sent away two of those Leftist Ministers. Now, you still think that this is a just conclusion that your Government has arrived at. To use legal parlance, this is an *ex parte* decision of your own without consulting anybody. The others have gone in defence. This is an *ex parte* conclusion of yours.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

Judgment by default !

ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
(திரு. குவெண்டின் பெர்ணண்டோ)
(Mr. Quentin Fernando)

Then the cat is out of the bag. Your policy is to carry on a democratic policy without injuring anybody else. Your policy is not to alter the Government from green to red. What does this Speech indicate ?

Mrs. Goonewardene, in a speech made in Negombo, stated that before long this country will be red. The

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.]

mouth speaketh of what the party has in view. It would be red before long, not green. So that you can see the intentions of the Leftist Party in getting into a democratic Government.

On the question of finances, you have been wasting Rs. 1,194.4 million in external finances. It has dwindled down to Rs. 273.2 million in April this year. What has happened to the money and what is the consequence of it ?

You banned the importation of goods. Before the 1956 elections, people had money and people had plenty of opportunities to purchase any goods they wanted. Now we have got to live in sack cloth. There is not even a span cloth to be bought unless you pay heavily for it.

You have no money to import goods from foreign countries. What is the local situation ? The prices of goods are spiralling up hour by hour, day by day. The value of the rupee has come down to 25 cents now. It may soon come down to 15 cents. What would be the plight of the poor peasants and the masses of the country when it comes down to such a low figure ? We are experiencing difficulties now. We will experience more difficulties before the last year of this Government is out. People may die of starvation.

I thank you, Sir, for having given me this opportunity of expressing my views.

අ. භා. 4.38

**පී. බී. බාලසූරිය මයා.** (ගලිගමුව)

*(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)*

(Mr. P. B. Balasuriya—Galigomuwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වර රාජාසන කථාව පිළිබඳ විරුද්ධ පාර්ශ්වයෙ හැඟීම නම් එය අසාර්ථක වූ එකක්ය යන්නයි. මගේ කල්පනාව නම්, අවුරුදු ගණනාවක්ම ඉදිරිපත් කළ රාජාසන කථා අතුරින් ඉතාම උසස් රාජාසන කථාවක් හැටියට මෙය හැඳින්විය හැකි බවයි.

විරුද්ධ පාර්ශ්වයෙන් පළමුකොට කථාව ආරම්භ කළ දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) රාජාසන කථාව ගැන වැඩිපුර කිසිවක් කීවෙ නැහැ. එතුමා රාජාසන කථාව ගැන වැඩි විස්තරයක් නොකර, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමග සමාජවාදි පක්ෂ එක්සත් වීම ගැනයි, වැඩි වශයෙන් විස්තර කරන්නට උත්සාහ දැරුවෙ. එක්සත් ජාතික පක්ෂයෙ මෙම හැඟීම ඇති වී තිබෙන්නෙ අන් කිසිවක් නිසා නොවෙයි. ඒ අයගෙ යටි හිතේ බල පවත්වන හැඟීම නම්, මෙම එක්සත් වීම නිසා නැවත කවදාවත් ඒ අයට මේ රටේ බලයට පත් වන්නට ලැබෙන්නෙ නැත යන්නයි. අපි දන්නව අපේ පසුගිය යටගියාව ; අපේ ඉතිහාසය. 1956 දි අපේ එක්සත් වීමෙන් එක්සත් ජාතික පක්ෂයට මරු පහරක් වැදුණා. නමුත් 1960 මාර්තුවෙදි යළිත් එක්සත් ජාතික පක්ෂය තරමක් දුරට හිස එසෙව්ව. එසේ වුණේ එදා වාමාංශික පක්ෂ එක්සත් වුණේ නැති නිසයි. නමුත් නැවතත් එම පක්ෂ එක්සත් වීමෙ ප්‍රතිවිපාක වශයෙන් යළිත් වරක් එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් වුණා. අපට මෙයින් පැහැදිලි වන්නෙ, අපි යම් දිනක එක් වෙමු නම්, එකට බැඳෙමු නම්, අන්න ඒ අවසථාවේදී එක්සත් ජාතික පක්ෂයෙ විනාශය ඇති වන බවයි. එම නිසා මාක්ස්වාදීන් සමග ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත්වැල් බැඳ ගැනීම, එක්සත් ජාතික පක්ෂයට ලොකුම කැක්කුමක් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමාජවාදයේ බොහෝ දුරකට ගමන් කර නැත කියා කිසිවකුට කියන්න පුළුවන්කමක් නැහැ. කවුරු මොනව කීවත්, සමාජවාදි වූ ඇතැම් දේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවෙන් කෙරී තිබෙනව. ඒ එකක් එකක් පාසා විස්තර කරන්නට දැන් පුළුවන්කමක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ප්‍රතිපත්තිය ප්‍රජාතන්ත්‍රවාදීව සමාජවාදය කරා ගමන් කිරීමය කියා මා කෙටියෙන් කියන්න කැමතියි. එය දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගෙ කාලයෙදි ප්‍රකාශ කර තිබෙනව. ගමන් කරන මාර්ගය කොහොම වුණත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යන ගමනෙ අන්තිම කෙළෙවර සමාජවාදයයි. මාක්ස්වාදීන් කෙළින්ම සමාජවාදය කරා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගමන් කරන විට අපි ටිකක් ප්‍රජාතන්ත්‍රවාදීව, වැඩි දෙනාගෙ කැමැත්ත අනුව, එම කටයුතු කරගෙන යනව. එයයි, අපේ ප්‍රකාශයෙ තියෙන්නෙ. මාර්ගය කෙසේ වෙතත් ප්‍රතිපත්තිය එක නම්, එවැනි පක්ෂ දෙකකට එක් වන්න බැරිකමක් නැහැ. එක මාර්ගයක් දික් වෙන්න පුළුවනි; එක මාර්ගයක් කෙටි වෙන්න පුළුවනි. කෙසේ වෙතත්, අපි දෙකොටසම ගමන් කරන්නෙ සමාජවාදය කරා නම් අප දෙකොටසට කොහොමත් එක් වන්න බැරිකමක් නැහැ.

එක්සත් ජාතික පක්ෂය මේ රටේ ධනවාදී පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂය මේ රටේ රදලවාදී පක්ෂයයි. මෙම ධනවාදී, රදලවාදී පක්ෂය පරාජය කිරීම පිණිස තවත් විධියකින් කියනවා නම්, මෙම ප්‍රබල හතුරා පරාජය කිරීම පිණිස, ප්‍රථමයෙන්ම කළ යුත්තෙ අපේ පක්ෂ එකට එකතු වීමයි. මේ ප්‍රබල සතුරා පරාජය කරන්නට නම් අනික් පක්ෂ එකට එකතු වන්න ඕනැ. නැති නම් කිසි කලෙක එම සතුරා පරාජය කරන්න බැහැ. එම නිසා මේ එකතු වීම සැම අතින්ම සුදුසුයි. ඊට කිසි වරදක් කියන්න බැහැ. අපේ මේ එක් වීම නිසා කළුකඩකාරයන් අද ටිකක් භය වී සිටිනව. බඩු සඟවාගෙන සිටි උදවිය ටිකක් භය වී සිටිනව. මේ රාජාසන කථාව විවාද වෙද්දී හංගාගෙන තිබූ බඩු සියල්ලම එළියට ඇවිත් තිබෙනව. කළුකඩකාරයන් හයින් ත්‍රස්තව වෙවුලමින් සිටිනව, අපට මොනවද වෙන්න යන්නෙ කියා. පසුගිය කාලයෙ මේ රටේ සුදු රෙදි තිබුණෙ නැහැ. එහෙත් දැන් සුදු රෙදි පදික වේදිකා මතට ගලාගෙන ඇවිත් තිබෙනව. එයින් පෙනී යන්නේ මේ එක්වීම නිසා එක්සත් ජාති පක්ෂයට පන්දම් ඇල්ලූ, එක්සත් ජාතික පක්ෂයට අනුරූපව ක්‍රියා කළ, කූට වෙළඳුන් ටික දෙනා සැඟ වූ බඩු එළියට දී වෙළඳාම් කරගෙන යන බවයි. අද සුළු වෙළෙඳුන් ඉතා සන්තෝෂයෙන් කියනව, මේ එක්වීම නිසා නේද, සැඟ වී තිබුණු බඩු අඳුරෙන් එළියට ගන්ට පුළුවන් වුණේ කියා. මේ එක්වීම හොඳ නැත කියන්නෙ එක්සත් ජාතික පක්ෂයේ පරාජය ඒකාන්ත බව දන්න නිසයි. ඒ අය ඊට භයේ හඬා වැලපුනාට අපට කරන්ට දෙයක් නැහැ. එක්වී වැඩ කරන්ට අපට තිබෙන්නෙ අවුරුද්දයි. ඊට පසුව පාර්ලිමේන්තුව විසිරී යැවෙනව. මේ වර්ෂය තුළ පක්ෂ එක්වීමෙන් අපට කරන්ට පුළුවන්කම තිබෙන්නෙ වැඩ පිළිවෙලේ අත්තිවාරම දමන්න පමණයි. ඒ අත්තිවාරම දැමීමෙන් පසු, ඒ අත්තිවාරම උඩ ගොඩ නැගෙන්නේ ඉතා ශක්තිමත් අලංකාර ගොඩනැගිල්ලක්ය යන හැඟීම අපට රටට දෙන්ට පුළුවන් වෙනවා ඇති. එහි ප්‍රතිඵලයක් වශයෙන් අප ලබන වර්ෂයේ බලයට එනවාට කිසිම සැකයක් නැහැ.

සමාජවාදීන් සමග ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්වීම නිසා අපේ ආගම නැසෙනවා යයි එක්සත් ජාතික පක්ෂය අඬනව. මොන විධියෙන් ආගම නැති වෙනවා දැයි මා දන්නෙ නැහැ. මාක්ස්වාදය ආගමට විරුද්ධ බවක් ම නම් පෙනෙන්ට නැහැ. ආගම ගැන කිසිම හසරක් නොදන්න, ආගම කවදාවත් නො අදහන, ඡන්ද ව්‍යාපාරයකදී පමණක් අත් දෙක ඔසවා පන්සිල් ගන්න සමහර දේශපාලන බෞද්ධයන් නම් කියනවා, ආගම නැතිවෙන්ට යනවාය කියා. මට එකක් කියන්ට පුළුවනි. පරලෝකය පෙන්න පෙන්න, සවර්ග සම්පත්තිය පෙන්න පෙන්න, සක්‍ර සම්පත්තිය පෙන්න පෙන්න, දිව්‍යාංගනාවන් පෙන්ව පෙන්ව, සිටීමට නොවෙයි ආගමය කියන්නෙ. අපට වුවමනා කරන්නෙ මේ ආත්මයේ මිනිසුන් හැටියට හොඳහැටි කා බී ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමටයි. පරලොව සවර්ග සම්පත් ගැන කථා කරනවාට වඩා මේ ලෝකයේ යස ඉසුරු ලබා ගන්න පුළුවන්කම තිබෙන්න ඕනැ. ඒ නිසා පරලොව ගැන කල්පනා කරනවාට වඩා, පරලොව ගැන කථා කරනවාට වඩා, මේ ලොව ගැන කල්පනා කළ යුතුයි, කථා කළ යුතුයි. ඒකයි, මගේ හැඟීම. එක්සත් ජාතික පක්ෂයේ අනුගාමිකයන් නම් අනික් අයට පරලොව ගැන කථා කරමින් මේ ලොව සම්පත් තර කර ගන්න බවට සැකයක් නැහැ. ඒ උදවියට මේ හවුල්වීමෙන් පහර වදිනව. ඒ නිසයි, ආගම නැසෙනවා යයි කියන්නෙ. වෙන කාරණයක් නිසා නොවෙයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

එහෙනම් මොකද ආගමික ආරක්ෂා කරන වාය කියන්නෙ.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

අපි නසනවාය කියන්නෙ නැහැ. ඔය පක්ෂයේ උදවියයි එහෙම කියන්නෙ. මේ ලෝකයෙ කොයි දේ වුණත්, ඔය පක්ෂයෙ උදවිය අපේ දුප්පත් පන්තියේ උදවියට පෙන්වන්න යන්නෙ පරලොව සම්පත් ගැනයි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

කවුද ?

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

එක්සත් ජාතික පක්ෂය. අපේ දකුණු කොළඹ ගරු පළමුවෙනි මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) 1943 ජූනි මාසෙ 22 වැනිදා රාජ්‍ය මන්ත්‍රණ සභාවට මෙන්න මේ විධියේ යෝජනාවක් ගෙනා බව මට මතකයි: සෑහෙන කාලයකදී සිංහලය ලංකාවේ රාජ්‍ය භාෂාව කිරීම පිණිස සභාව මෙසේ යෝජනා කරයි:

1. සෑම පාසැලකම ඉගැන්වීමේ මාධ්‍යය සිංහල විය යුතුයි.

2. සෑම ප්‍රසිද්ධ විභාගයකටම සිංහලය අනිවාර්ය විෂයයක් කළ යුතුයි.

3. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කටයුතු සිංහලෙන් කිරීමට හැකිවන සේ නීතිරීති පැනවිය යුතුයි.

4. වෙනත් භාෂාවලින් තිබෙන වැදගත් පොත් පත් සිංහලයට පෙරලීම සඳහා කොමිෂන් සභාවක් පත් කළ යුතුයි.

5. ඉංග්‍රීසියෙන් කෙරෙන කටයුතු සිංහලයට හැර වීමට අවශ්‍ය සෑම පියවරක්ම ගැනීම සඳහා කොමිසමක් පත් කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට අවුරුදු 21 කට ප්‍රථම මෙබඳු යෝජනා ඉදිරිපත් කළ ඒ මන්ත්‍රීතුමා අද ඒ ගැන කොයි තරම් දුරට ක්‍රියා කර තිබෙනවාද කියා මම අහන්නට කැමතියි. අඩු වශයෙන් මේ සභාවේදීවත් එතුමා ආදර්ශයක් දුන්නාද කියා මම අහනවා. එදා අවුරුදු 21 කට ඉස්සර තමා ඉදිරිපත් කළ යෝජනාවලට විරුද්ධවයි අදත් මේ ගරු සභාවේ එතුමා ක්‍රියා කරන්නෙ.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

අයවැය ලේඛන කථාව කරන්නෙ සිංහලෙන්. එකක් සිංහලෙන් එකක් ඉංග්‍රීසියෙන්.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

දෙකක් බැහැ. උඩ කොටස එක විධියක්. පල්ලයහ කොටස තවත් විධියක්. ඔන්න ඕකයි තමුන්නාන්සෙලගෙ ප්‍රතිපත්තිය. එක්සත් ජාතික පක්ෂයේ භාෂා ප්‍රතිපත්තිය තමැති ගසේ පිළිල හැදී, මුල් කුණුවී ගිය අවස්ථාවේදී ඊට උනු වතුර වත් කිරීමට උත්සාහ කිරීමක් ලෙස එතුමාගේ කථාව පෙන්නා දෙන්නට පුළුවනි. එම නිසා, රටවාසීන් හැටියට අපට කියන්නට තිබෙන්නෙ එක්සත් ජාතික පක්ෂයේ භාෂා ප්‍රතිපත්තියෙන් මේ රටේ ජනතාව අනාථ කරන බවයි; ලක්ෂ සංඛ්‍යාත දරුවන්ට සම්පූර්ණයෙන්ම පහර ගසන බවයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් උදවිය නොයෙක් නොයෙක් තැන්වල කීවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තුළ අල්ලස් දූෂණ සිදු වුණාය කියා. නමුත් මට කනගාටුයි කියන්නට, එක්සත් ජාතික පක්ෂය මේ රටේ තිබෙන තුරු අල්ලස් පමණක් නොවෙයි හැම අන්දමකම දූෂණ ක්‍රියා ඇති වීම වළක්වන්නට බැරි බව.

**කේ. හේරත් මයා.**
*(திரு. கே. ஹேரத்)*
(Mr. K. Herath)

කවුද අනුවුණේ ?

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

පසුගිය දවස්වල ගම්සභා මැතිවරණ පැවැත්වුණු අවස්ථාවේදී ප්‍රජාතන්ත්‍රවාදය උසස් ලෙස වර්ණනා කරන එක්සත් ජාතික පක්ෂයේ මහත්වරුන් ඡන්දය ලබා ගැනීම සඳහා මිනිසුන්ට අල්ලස් දුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නේ නැද්ද? රුපියල් 10, 25 පමණක් නොවෙයි ඇතැම් අයට රුපියල් සිය ගණන් දුන්නා ඡන්දය ලබා ගන්නට. එහෙම නම් තවත් අල්ලස් දූෂණ ගැන ඒ අය කථා කරන්නෙ කොහොමද? එපමණක් නොවෙයි. ඒ අන්දමට ඡන්දය ලබා ගත්තා පමණක් නොවෙයි, රථවාහන පාවිච්චි කිරීම තහනම් කර තිබෙද්දීත් රථවාහන යෙදුවා; අරක්කු කසිප්පු වැපුරුවා. එම නිසා මේ පුද්ගලයන්ට ඉඩකඩ ලැබුනොත් මේ රට දූෂණ කටයුතුවලින් දූෂිත කරන වාට කිසිම සැකයක් නැහැ. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ මේ දූෂණ ක්‍රියා නැති කරන තුරු මේ රටින් සහමුලින්ම දූෂණ ක්‍රියා ඉවත් කරන්නට පුළුවන් කමක් නැහැ.

**කේ. හේරත් මයා.**
*(திரு. கே. ஹேரத்)*
(Mr. K. Herath)
ඒක හින්ද තමයි තමුන්නාන්සෙලගෙ මන්ත්‍රීවරුන් පිහියෙනුත් අනින්නෙ?

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)
කොහොමද තමුන්නාන්සෙ දන්නෙ?

**කේ. හේරත් මයා.**
*(திரு. கே. ஹேரத்)*
(Mr. K. Herath)
තමුන්නාන්සෙ පත්‍රයවත් බැලුවෙ නැද්ද?

**කේ. එච්. ජී. ඇල්බට් මයා.** (බෙන්තර ඇල්පිටිය)
*(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற-எல்பிட்டிய)*
(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)
පත්‍රකාරයො තමුන්නාන්සෙලගෙ පරම්පරාවෙන් පැවත එන උදවියනෙ.

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)
දකුණු පළාතෙ මන්ත්‍රීවරයකු වශයෙන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයාට වඩා මම ඒකෙ ඇත්ත නැත්ත දන්නවා. කාරණා දැනගෙන කථා කරනවා නම් හොඳයි.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩුප්පිඩ්ඩි කොට්ඨාශයේ ගරු මන්ත්‍රීතුමා (එම්. සිවසිතම්පරම් මයා.) ප්‍රකාශ කළා මේ සිංහල ගුරුවරුන් දෙදහසක් උතුරට යැව්වොත් කිසිම සැකයක් නැතුව ජාතිවාදය නැවතත් පැන නැගිලා දෙපක්ෂය අතර අරගල ඇතිවන්නට පුළුවන්ය කියා. බාලාංශයේ පටන් විශ්ව විද්‍යාල ප්‍රවේශය දක්වා දෙමළ භාෂාවෙන් අධ්‍යාපනය ලබන්නවත්, ඒ වගේම බාලාංශයේ පටන් විශ්ව විද්‍යාල ප්‍රවේශය දක්වා සිංහල භාෂාවෙන් අධ්‍යාපනය ලබන්නටත් අද මේ රටේ දරුවන්ට පුළුවන්කම තිබෙනවා. නමුත් මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල විය යුතුයයි පිළිගෙන තිබෙන නිසා මේ රටේ රජයේ රැකී රක්ෂා ලබා ගැනීමේදී දෙමළ ශිෂ්‍යයන් තරමක් දුරට සිංහල භාෂාව ඉගෙන ගත යුතුයි. එහෙම නැත්නම් තරමක කරදරයක් ඇති වෙනවා. තත්ත්වය මෙසේ නම්, සිංහල රාජ්‍ය භාෂාව වීම ගැන විරුද්ධවීමේ සාධාරණයක් තිබෙනවායයි කියන්නට පුළුවන්ද? ඉංග්‍රීසිය රාජ්‍ය භාෂාව වශයෙන් තිබියදී සිංහල ධනපති පන්තියේ අය මෙන්ම, දෙමළ ධනපති පන්තියේ අයත් එය ආදරයෙන් පිළිගෙන කටයුතු කරගෙන ගියා. එහෙම නම්, සිංහලය රාජ්‍ය භාෂාව වී තිබෙන මේ කාලයේ දෙමළ ජනයා සුළු වශයෙන් සිංහල ඉගෙන ගැනීමෙහි වරද කුමක්ද? මෙතැන තිබෙන ජාති භේදය කුමක්ද? රජයේ තනතුරු ලබා ගැනීම සඳහා දෙමළ ජනයා සුළු වශයෙන් සිංහල ඉගෙන ගැනීමෙහි වරදක් තිබෙනවායයි අපට නම් කියන්න බැහැ. ඇත්තෙන්ම සිංහල භාෂාව ඉගෙන ගන්නට දෙමළ ජනයා ලැස්තියි. සමහරුන් ඉතාමත් හොඳට සිංහල ඉගෙන ගෙන තිබෙනවා. නමුත් ෆෙඩරල් පක්ෂයේ නායකයන් ටික දෙනකු ඊට විරුද්ධයි. ඒ අනුව පෙනී යන්නේ මේ පිළිබඳව සට්ටනයක් තිබෙන්නේ දේශපාලකයන් කීප දෙනකු අතර මිස සාමාන්‍ය ජනතාව අතර නොවන බවයි. දෙමළ සිංහල භේදය නැති වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 4.55

**කේ. එච්. ජී. ඇල්බට් මයා.** (බෙන්තර-ඇල්පිටිය)

*(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற எல்பிட்டிய)*

(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරිමා බණ්ඩාරනායක රජයේ සිව් වසක පාලනයෙන් පසුව දැන් මේ රටේ සභාග ආණ්ඩුවක් ඇති වී තිබෙනවා. මේ රටේ සමාජවාදීන් මේ රට සමාජවාදය දෙසට ගමන් කරවීමට මෙතෙක් කල් මහත් වෑයමක් දැරුවා. රජය සමාජවාදීන්ගේ අතට පත් කිරීම පිණිස ඕනෑකමකින් වැඩ කළ අය යම් තරමකට සෑහී සිටින මේ කාලයේදී, මේ රාජාසන කථාව පිළිබඳව වචන කීපයක් කථා කිරීම මගේත් යුතුකමක් හැටියට සලකනවා. මේ රටේ ප්‍රගතිශීලී කොටස් ගැන මහජනයා හොඳින් දන්නවා. ප්‍රගතිශීලීන් කවුද ප්‍රතිගාමීන් කවුදැයි සමහරුන් විසින් ප්‍රශ්න කරන්නට යෙදුණා. වචන හරඹවල යෙදෙමින් අසවල් අසවල් අය ප්‍රගතිශීලීන් යයිද, අසවල් අසවල් අය ප්‍රතිගාමීන් යයිද කියන්නට වුවමනාවක් නැත්තේ මහජනයා ඒ ගැන හොඳ වැටහීමකින් සිටින නිසයි. නොයෙකුත් වචන පාවිච්චි කරමින් මේ රටේ මහජනයා නොමඟ හරවන්නට සමහරුන් උත්සාහ කළත් මෙතෙක් කල් මහජනයා නොරැවටුණා වාගේම මින් ඉදිරියටත් නොරැවටෙන බව මතක් කරන්නට කැමතියි. ප්‍රගතිශීලීන්ගේ එකතුව නොරුස්සන බොහෝ දෙනා ඒ විධියේ එකතුවක් වෙනවා නම් එය වැළැක්වීමට පසුගිය දවස්වල බොහෝ මහන්සි වූ බව කවුරුනුත් දන්නවා. විශේෂයෙන්ම පුවත් පත් අයිතිකාරයන්, ප්‍රගතිශීලීන්ගේ එකතුව වැළැක්වීමට විශාල ව්‍යාපාරයක් ගෙන ගියා. නමුත් ඔවුන්ගේ උත්සාහය සාර්ථක වුණේ නැහැ. ප්‍රගතිශීලීන්ගේ එකතුව කඩකප්පල් කිරීමට ඔවුන්ට බැරි වුණා. මේ ප්‍රගතිශීලීන්ගේ එකතුවට විරුද්ධව කටයුතු කරනවා නම් රුපියල් පණස් දාහක් දෙන්නට කැමති බවත්, එසේ නම් ඒ ගැන සාකච්ඡා කිරීම පිණිස පැමිණේයයි බලාපොරොත්තු වන බවත් සඳහන් වූ ලිපියක් පසුගිය දවස්වල මට ලැබුණා. මට එක්තරා ස්ථානයකට පැමිණෙන ලෙස කැඳවීමක් කර තිබුණා. ඒ වාගේම තවත් පත්‍රයකින් ටෙලිපෝන් කර එක්තරා පුද්ගලයෙක් කිව්වා, මේ අවස්ථාවෙදි තමුන්නාන්සෙ භාෂා ප්‍රශ්නයත් ආගමික ප්‍රශ්නයත් ඉස්මතු කර ඊට විරුද්ධව නැගී සිටිනවා නම් මේ රටේ ජාතික වීරයෙක් වශයෙන් නැඟිටින්න පුළුවන්ය කියා. ඒ විධියේ තත්ත්වයක් ඇති කර නොයෙක් අන්දමේ පච ප්‍රචාරය කරමින් මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර කඩාකප්පල්කාරී කටයුතු කරගෙන යනවා. අපේ පක්ෂය ඇතුළත සමගිය නැති වන පරිදි, එක එක් කෙනා ඈන කොටා ගැනීමටත් ඈන බැණ ගැනීමටත් ඉඩ ඇති වන පරිදි අසුවලා විරුද්ධය, අසුවලා පක්ෂය, යනාදී වශයෙන් පක්ෂවලට බෙදා කඩාකප්පල් කිරීම සඳහා ප්‍රචාර ගෙන ගියේ මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර බව තමුන්නාන්සෙ දන්නවා ඇති. ඒ පත්‍රකාරයන් කළ ප්‍රචාර මොනවාද යන බව මහජනතාව හොඳින්ම දන්නවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් ප්‍රගතිශීලී පක්ෂවලත් එක් වීම ගැන කිසිම ප්‍රබල පක්ෂයක් විරුද්ධය කියා මා සිතන්නෙ නැහැ. මා හිතන්නෙ මේ රටේ පත්‍රකාරයන් යම් කිසි අන්දමක බොරුවක් ගොතා ඒ බොරුව ඉස්මතු කර කර මේ රටේ මහජනතාවටත් මහජනතාව වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරුන්ටත් පෙන්වීමට ඔවුන් උත්සාහ කළ බවයි. ඒ නිසා දැන්වත් මම කියන්න කැමතියි, ඒ ප්‍රවෘත්ති පත්‍ර විසින් ගෙන යනු ලබන පච ප්‍රචාරය නවත්වා රට ජාතිය ගොඩ නැංවීමට උත්සාහයක් කරමින් ගෙන යන මේ ව්‍යාපාරයට සම්පූර්ණ සහයෝගය දෙන්නය කියා, ජාතික කැක්කුමක් ඇති කෙනකු හැටියට මම ඔවුන්ගෙන් මේ ඉල්ලීම කරනවා.

ඒ වාගේම නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවෙදි මා තවත් කරුණක් මතක් කරන්න කැමතියි. මේ රට සමාජවාදය කරා ගමන් කරනවා යයි සැමදාම කියමින් සිටින එක්තරා කොටසක්, විශෙෂයෙන් ලංකා සමසමාජ පක්ෂයත්, ලංකා කොමියුනිස්ට් පක්ෂයත් ඒ වාගේ ම මහජන එක්සත් පෙරමුණත්, ආදී බල වේගයන් මේ රටේ විශාල අන්දමේ පෙරළියක් ඇති කළා. අපි දන්න හැටියට 1931 සිට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ දක්වාම ඔය පක්ෂ තමන්ගේ ජීවිත පවා ඔට්ටුවට තබා තමන්ගේ ජීවිත ගැන කිසිත් සැලකිල්ලක් නොදක්වා, මේ රට සමාජවාදය කරා ගෙන යන්න ඕනෑය කියන හැඟීම පිට ඉතාම ප්‍රබල අන්දමින් කටයුතු කරගෙන ගියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සම සමාජ පක්ෂයත් එකතු වී මේ රටේ සමාජවාදී ගමනේ ඉදිරි පියවර තැබීමට බලාපොරොත්තු වන මේ අවස්ථාවේදී මම අහන්න කැමතියි, ඉතාමත් ප්‍රබල ලෙස කටයුතු කරමින් සමාජවාදය කරා රට ගමන් කරනවාය කියන ඒ පක්ෂ ඒ ගමන අත්හැර දමා අමුඩ ගසාගෙන පැත්තකට වී බලා සිටිනවාද, එසේ නැත්නම් මහජනතාවගේත් රටේත් ශුභසිද්ධිය සඳහා අප සමග එකතු වී ඉදිරියට ගමන් කරනවාද, කියා සමාජවාදී ගමන යාම සඳහා නියම හැඟීමකින් ගසා ගත් අමුඩය කඩා දමා පැත්තකට වී බලා සිටියොත් මේ රටේ මහ ජනතාවට සිදු වන්නෙ කුමක්ද කියා මම අහන්න කැමතියි. ඕනෑම වේලාවක රජයට ඇතුළු වී ඔවුන්ගේ සහයෝගය රජයට දීමට හැකි වන පරිදි රජයේ දොරටු සම්පූර්ණයෙන්ම විවෘත කර තිබෙන බව මම ඒ පක්ෂවලට කියා සිටින්න කැමතියි. මේ රට සමාජවාදය කරා ගෙන යාම සඳහා, මේ රටේ අනාගත පරපුරේ අභිවෘද්ධිය සඳහා වෙහෙසක් දැරූ යම් කිසි කොටසක් සිටිනවාද, අද ඒ කොටසට යම් පමණ කැක්කුමක් ඇති වී තිබෙනවා, සමාජවාදී පක්ෂවල සහයෝගය නොලැබුණොත් මේ ගමන කඩාකප්පල් වේවිය කියා.

අ.භා. 5.2

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. දැන් ගරු කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

ගරු කථානායකතුමනි, මා කියමින් සිටියේ සමාජවාදය කරා මේ රට වේගයෙන් ගමන් කරවීම පිණිස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම සමාජ පක්ෂයත් සමඟ අත්වැල් බැඳගෙන ගමන් කරන අවස්ථාවේදී කාල යක සිට සමාජවාදය කරා යනවාය කියන අනික් සමාජවාදී පක්ෂ ඒ ගමන යාම සඳහා ගසාගත් අමුඩයත් සමග පැත්තකට වී බලා සිටිනවාද, එසේ නැත්නම් සමාජවාදී කණ්ඩායමතපී සමග අත්වැල් බැඳගෙන ඉදිරියට යනවාද කියන ප්‍රශ්නය මේ රටේ ජනතාව වෙනුවෙන් නියම විධියට ඔවුන් විසින් විසඳිය යුතු බවයි.

ඊ ළඟට තවත් වැදගත් කාරණයක් තිබෙනවා. බණ්ඩාරනායක ප්‍රතිපත්ති අකුරටම පිළිපදින අය ඉන්නවා. බණ්ඩාරනායක අගමැතිතුමා සිටි කාලයේදී බණ්ඩාරනායක ප්‍රතිපත්ති ඉතාම පහත් අන්දමින් විවේචනය කළ එහෙම නැත්නම් ඊටත් පසු කාලයේදී—ඒකියන්නෙ 1960 මාර්තු සමයේදී—බණ්ඩාරනායක ප්‍රතිපත්ති කියන ඒවා ඉතාම පහත් අන්දමින් අඳුන්වා දුන් සමහරු, බණ්ඩාරනායක ප්‍රතිපත්ති නැති වෙනවාය කියා අද කිඹුල් කඳුළු හෙළනවා. මේ එකතුව නිසා බණ්ඩාරනායක ප්‍රතිපත්ති නැති වෙනවය කියා යමෙක් කිඹුල් කඳුළු හෙළනවා නම්, ඒ කඳුළු මේ රටේ ජනතාව හොඳින් හඳුනන බව මම කියන්න කැමතියි. ඒ අයට බණ්ඩාරනායක ප්‍රතිපත්තිය ඇති වුණත් එකයි, බණ්ඩාරනායක ප්‍රතිපත්තිය නැති වුණත් එකයි. ඇත්තෙන්ම ඔවුන්ට වුවමනා කර තිබෙන්නෙ මේ රටේ බණ්ඩාරනායක ප්‍රතිපත්තිය විනාශ කර දැමීමටයි. නමුත් ඔවුන් කියනව, මේ සමාජවාදී හවුලෙන් බණ්ඩාරනායක ප්‍රතිපත්ති නැති වෙනවය කියා. ඔවුන් එය අවංක හැඟීමකින් යුතුව කියනවායයි මම සිතන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම ඔවුන්ට ලජ්ජාවක් තියෙනව නම්, මේ හවුල නිසා බණ්ඩාරනායක ප්‍රතිපත්ති කැඩෙනවා නේද, බණ්ඩාරනායක ප්‍රතිපත්ති විනාශ වෙනවා නේද, කියා මහජනයා ඉදිරියේ ප්‍රකාශ ඔවුන් නොකර බව මම කියන්න කැමතියි.

ගරු කථානායකතුමනි, සමාජවාදය කරා මේ රට ගමන් කරවිය යුතුය යන හැඟීම ඇති වුණේ 1956 දියි. 1956 දී වුවමනා කර තිබුණේ මේ රටේ රදල ධනපති පන්තියට යට වී සිටි සාමාන්‍ය ජනතාවට තැනක් ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

දීමයි—ඔවුන්ට හිස ඔසවන්නට පුළුවන් කම ලබා දීමයි. ඒ කාර්‍යය ඉටු කිරීමයි, එදා බණ්ඩාරනායක අගමැතිතුමා බණ්ඩාරනායක ප්‍රතිපත්තිය වශයෙන් ඉදිරිපත් කළේ. අපි අද ඒ ප්‍රතිපත්ති වඩා පැහැපත් කර ඊට වඩා උසස් අන්දමට, ඊට වඩා පැහැදිලි අන්දමට මේ රටේ අනාගත යහපතට හේතු වන අන්දමට ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ හවුල නිසා බණ්ඩාරනායක ප්‍රතිපත්ති නැති වෙනවය කියා යම් කෙනෙක්, අද බණ්ඩාරනායක ප්‍රතිපත්ති අනුගමනය කරන අයට පහර ගසන්නට ඉදිරිපත් වෙනවා නම් ඔවුන්ට මේ පිළිතුර සෑහෙනවය කියා මම අදහස් කරනව.

ගරු කථානායකතුමනි, අප වඩා සලකන්නේ මේ රටේ මහජනතාව ගැන බව ප්‍රකාශ කරන්න ඕනෑ. සමහර ගරු මන්ත්‍රීවරු භාෂා ප්‍රශ්නය ගැන කථා කළා; ඉන්දියානු ප්‍රශ්නය ගැන කථා කළා. මේ ප්‍රශ්න දෙක ගැන අපට අවුරුදු ගණන් වුණත් කථා කරන්න පුළුවනි. මේ ප්‍රශ්න ගැන සඳහන් කිරීමේදී මා විශේෂයෙන් කියන්නට කැමතියි, රුහුණෙන් ආ රුහුණු පුත්තු කවදත් මේ දෙක ගැන සිය දිවි පුදන්නට සූදානම් වී සිටි බව. නමුත් මේ අවසථාවේදී මා එකක් කියන්නට කැමතියි. අපි, අපේ ජාතිය ගැන, භාෂාව ගැන, ආගම ගැන විශාල කැක්කුමකින් ඉන්න උදවිය. ඒ අතරම මේ රටේ අනාගතය පිළිබඳවත් අප තුළ විශාල කැක්කුමක් තියෙනව. ජාතික සමගිය පිළිබඳවත් අපේ විශාල කැක්කුමක් තියෙනව. අපේ භාෂා ප්‍රශ්නය විසඳා අවසාන තත්ත්වයකයි, අද පවතින්නෙ. භාෂා ප්‍රශ්නය ගැන තව දුරටත් අත ගහන්නට වුවමනා නැති බවයි, මගේ අදහස. ජාතික ප්‍රශ්නය පිළිබඳව මා යමක් කියන්නට දන්නෙ නැහැ. නිවිතිගල ගරු මන්ත්‍රීතුමා කීව වගේ, මේ රටේ තිබෙන ඉන්දියානු ප්‍රශ්නය විශාල එකක්. ඒ ප්‍රශ්නය ඔය කියන හැටියටම විසඳන්නට පුළුවන් නම් ලොකු දේශපාලනඥයන්ට ඔය ගැන ඒ තරම් කථා කරන්න දෙයක් නැත කියා මම හිතනව. නමුත් මේ ගරු සභාවේදී කියන විධියටම, මහ ජනයා ඉදිරියට ගොස් බෙරිහන් දෙන විධියටම මේ ප්‍රශ්න විසඳන්නට පුළුවන්ද, ඔය කියන අදහස් ක්‍රියාත්මක කරන්නට පුළුවන්ද, කියා ජාති හිතෛෂීන් වශයෙන්, මේ රටේ අනාගතය ගැන සලකන අය වශයෙන්, අප කල්පනා කරන්නට ඕනෑ. පූරවැසි භාවය ලබා නොමැති ඉන්දියානුන් සියලු දෙනාම මුහුදට දමන්න ඕනෑය. ඔවුන් සියලු දෙනාටම වෙඩි තියන්න ඕනෑය, ඔවුන් සියලු දෙනාම ඉන්දියාවට පටවන්න ඕනෑය කියා අපට කියන්න පුළුවනි. නමුත් කොහොමද පටවන්නෙ. කොහොමද ගෙන යන්නෙ, කියන ප්‍රශ්න පිළිබඳවත් අප කල්පනා කර බලන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඔවුන්ගේ ප්‍රධාන රටත් සමග සාකච්ඡා කර ඒ සාකච්ඡා මාර්ගයෙන් සාමකාමීවයි, මේ ප්‍රශ්නය විසඳිය යුත්තෙ. අපේ ගරු අගමැතිනියගේ නායකත්වය පිළිබඳව කිසි ප්‍රශ්නයක් නැහැ. අපේ විරුද්ධවාදීන් පවා පිළිගන්නව, එක්සත් ජාතික පක්ෂයේ අපේ මහා විරුද්ධවාදීන් පවා පිළිගන්නව, මේ රටේ පහළ වූ නායකයන් අතර ඉතාමත් කීර්තියක් ඇති ශ්‍රෙෂ්ඨ නායිකාවක හැටියට අපේ ගරු අගමැතිනිය සැලකෙන බව. කවුරුත් අවිවාදයෙන් පිළිගන්න අපේ ඒ ශ්‍රෙෂ්ඨ නායිකාව වූ අගමැතිණිය මේ රටේ ජනතාව සම්පූර්ණ සෑහීමකට පත් වන අයුරින් මේ ප්‍රශ්නය විසඳන බව අපට විශ්වාසයි. මෙතෙක් කල් මේ රටේ පාරම්පරිකව ආරක්ෂා කරගෙන ආ බුද්ධ ශාසනයට දත් පහර වදින්න ඉඩ තිබෙනවය කියා ඇතැම් ගරු මන්ත්‍රීවරුන් මේ ගරු සභා ගර්භයෙදි අනතුරු හැඟවීම් කළ ආකාරය මා අහගෙන හිටිය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග හවුල් ආණ්ඩුවක් පිහිටුවීම සඳහා අප විසින් වැද්ද ගෙන සිටින්නෙ මේ රටේම ඉපදී, මේ රටේම හැදී වැඩී, මේ රටේ පොදු මහ ජනතාව සමග ඉතා කිට්ටු ආශ්‍රයක් ඇතිව අති දීර්ඝ කාලයක් ජීවත් වුණු, ඒ නිසා මේ රටේ සංස්කෘතිය ගැන මනා දැනුමක් ඇති, රටවාසීන් වෙනුවෙන් කැක්කුමක් ඇතිව සිටි දේශපාලනඥයන් පිරිසක් බව ආඩම්බරයෙන් කියන්න කැමතියි. එහෙම නැතිව ජාතිය නැති කරන්න ඕනෑය කියන, සිරිත් විරිත් නැති කරන්න ඕනෑය කියන, භාෂාව විනාශ කර දමන්න ඕනෑය කියන අය සමග නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කවදාවත් හවුල් වන්නෙ නැති බව කියන්න ඕනෑ. මේ අවසථාවේ හැටියට මේ කාරණය තව දුරටත් පැහැදිලි කරදීම අවශ්‍යය කියා මා කල්පනා කරනව. මාක්ස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාදි ප්‍රතිපත්ති ගැන කථා කරන විට මේ රටේ වැසියන් පමණක් නොව මුළු ලෝක යේම සිටින සියලු දෙනාම පාහේ අවිවාද යෙන් පිළිගන්න ඉහළම මාක්ස්වාදියා කෘෂෙප් වෙන්න ඇත කියා මා හිතනවා. ඔහු රුසියාවෙ නායකත්වය දරණ නිසයි එසේ මා කල්පනා කළේ. එවැනි ප්‍රසිද්ධි යක් ඇති කෘෂෙප් අපේ අගමැතිනියගෙ කැබිනට් මණ්ඩලයට ගනු ලැබුවත් අපේ අගමැතිනිය සිටින තුරු නම් කිසිම අන්දම කින් අපේ රටට හෝ ජාතියට හෝ භාෂා වට හෝ ආගමට හෝ හානියක් කරන්න ඉඩක් අපේ අගමැතිනිය දෙන්නෙ නැති බව විශ්වාසයි. ඇගේ නායකත්වය පිළි බඳව ප්‍රශ්නයක් මේ රටේ ඇති නොවන බවත් මට විශ්වාසයි. විප්ලවය ගැන වැඩි වැඩියෙන් කථා කරන ගරු මන්ත්‍රීවරුන් සමාජවාදි ගමන විප්ලවයෙන් යන්න ඕනෑය කියනවා නම්, ඒ ගමනෙදි මේ රටේ ජාතියටත්, සංස්කෘතියටත්, භාෂාවටත්, ආගමටත් විරුද්ධව කැරලි ගහන්න ඕනෑ ය කියනවා නම්, එයින් ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. එවැන්නන් ජනතාව සමග කොයි තරම් කිට්ටු සම්බන්ධයක් ඇති ව සිටියත්, ජාතික සිරිත් විරිත්, ආගම, භාෂාව, සංස්කෘතිය ආදිය නැති කර විප් ලවයෙන් පාලන බලය අල්ලන්න ගියොත් නම්, තමන් සමග ඉන්න කම්කරුවන් පවා තමන්ට විරුද්ධව නැගී සිටින බව මතක් කර දෙන්න කැමතියි.

සභාග ආණ්ඩුව ඇති වීමත් සමගම මේ රටේ ජනතාව අතරේ විශාල උද්ඝෝෂණ යක් ඇති වී තිබෙන බව පෙනෙව. එයින් අපේ කැබිනට් මණ්ඩලයෙ ගරු ඇමති තුමන්ලා නිසි ප්‍රයෝජනය ගත යුතුව තිබෙනව. ඒ උද්යෝගයෙන් නියම ප්‍රයෝ ජනය අරන් මේ රටේ ජාතියේ අනාගතය තහවුරු වන අන්දමට ඉතාම ශ්‍රේෂ්ඨ ලෙස ශක්තිමත් අඩිතාලමක් දමා සාමාන්‍ය ජනතාවගෙ බලාපොරොත්තු ඉෂ්ට කරන මෙන් ඉල්ලා සිටිනව. අභිනවයෙන් කැබි නට් මණ්ඩලයට ඇතුළු වී සිටින ගරු ඇමති වරුන් ගැනත් සඳහන් කළ යුතුය කියා මා කල්පනා කරනව. විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමා ප්‍රධාන ලංකා සමසමාජ පක්ෂයෙන් ආ ගරු ඇමතිතුමන්ලාගෙන් මා විපුල සේවයක් බලාපොරොත්තු වෙන ව. අලුත් කණ්ඩායමක් අපේ ආණ්ඩුවට සභාග කර ගන්න සිදු වුණේ මහජනයාගේ ප්‍රශ්න විසඳීමට මෙතෙක් හිටපු කැබිනට් මණ්ඩලයට බැරි වූ නිසා බව මා දන්නව.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
අන්න එක ඇත්තක් කිව්වා.

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)
ඒ නිසා අලුතින් මේ කැබිනට් මණ්ඩල යට එක් වුණු ඇමතිවරුන් තුන් දෙනා මේ රටේ දියුණුවට යම්කිසි සාර්ථක වැඩ පිළිවෙළක් යොදා හොඳ ප්‍රතිඵල පෙන්වා දෙනවා ඇතැයි විශේෂයෙන්ම බලා පොරොත්තු වෙනව.

ගරු කථානායකතුමනි, තවත් එකක් කිය යුතුව තිබෙනවා. කවුරුන් කෙසේ කීවත් මේ අවුරුදු හතර ඇතුළත මේ රටේ අධ්‍යාපනය පිළිබඳව විශාල විප්ලවයක් කර තිබෙනවා. 1960 ජූලි මාසයේ සිට 1964 ජූලි මාසය දක්වාවූ අවුරුදු 4ක කාලය ඇතුළත අපි අධ්‍යාපනික විප්ලවයක් ඇති කර තිබෙනවා. ඒ අධ්‍යාපනික විප්ලවය නිසා සාමාන්‍යයෙන් නගරබද පමණක් පැවති අධ්‍යාපනය අද ගම්බදටත් ගෙන ගොස් තිබෙනවා. ගම්බද දරුවන්ටත් අධ්‍යාපනයෙහි සම්පූර්ණ රහ අපි පොවා තිබෙනවා. ඒ නිසා මා මේ රජයෙන්, විශේෂයෙන්ම කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා අළුත් අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කරන විට විශේෂයෙන්ම මෙතෙක් එක පංක්තියකට පමණක් තිබුණු වරප්‍රසාදය නැති කර මේ රටේ සාමාන්‍ය දුප්පත්, පිටිසරබද ගොවි දරුවාටත් ඒ වරප්‍රසාදය ලැබෙන අන්දමට ඒ ප්‍රතිපත්ති සකස් කරන්නය කියා. මේ රටේ ගොවියාගේ දරුවන්ටත්, කම්කරුවා ගේ දරුවන්ටත් ඒ වරප්‍රසාදය ලැබෙන අන්දමට ඒ ප්‍රතිපත්ති සකස් කරන්නය කියා අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එමෙන්ම මේ අවස්ථාවේදී කියන් නට කැමතියි—අපි කලිනුත් සඳහන් කර තිබෙනවා—මේ රටේ එකම ක්‍රමයේ අධ්‍යා පනයක් ඇති කිරීම සඳහා තවදුරටත් ක්‍රියා කළ යුතු බව. රජයේ හැරෙන්නට වෙනත් අධ්‍යාපනික ක්‍රම මේ රටේ තිබෙ නවා නම්, ඒවා සම්පූර්ණයෙන්ම නැති කර එකම ක්‍රමයේ අධ්‍යාපනයක් මේ රටේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

ඇති කිරීම සඳහා, පංක්ති භේදයෙන් තොර, ජාති භේදයෙන් තොර, ආගම් භේදයෙන් තොර අධ්‍යාපනයක් මේ රටේ ඇති කිරීම සඳහා, කටයුතු කරන හැටියට මා ඉල්ලා සිටිනවා. මේ අවුරුද්ද ඇතුළත දී එය සම්පූර්ණ කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. මේ රටේ සිටින දුප්පත් වැසියාගේ ඉඩම් කඩම් පිළිබඳව මේ රාජාසන කථාවේ විශේෂයෙන් සඳහන් වී තිබෙනවා. මේ රටේ ජනතාව අතරේ ඉඩම් ප්‍රශ්නය බොහොම උග්‍ර වී තිබෙන බව විශේෂයෙන්ම ඉඩම් ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. රජයේ ඉඩම් තිබෙන තැන්වල මහ ජනයා බලයෙන් පදිංචි වී සිටිනවා. අපේ ප්‍රදේශයේ ඒ අන්දමින් බලයෙන් පදිංචි වන අයගේ ගණන දවසින් දවස වැඩි වෙනවා. මේ ප්‍රශ්නය විසඳීම සඳහා මේ අවුරුද්ද තුළදීම කටයුතු කරන්නය කියා ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තවත් එක කාරණයක් කියන්න ඕනෑ. මේ හවුල් ආණ්ඩුව නිසා අපි බණ්ඩාරනායක ප්‍රතිපත්ති කැඩුවාය කියා සමහරු කියනවා. මේ දෝෂාරෝපනය කරන අය කවුද කියා අහන්න කැමතියි. මේ රටේ අභිවෘද්ධිය තකන ජනතාවක් එහෙම කියනවාද, නැත්නම් දේශපාලන බලතල ලබා ගැනීමට, එයට කෑදරකමින් කට ආයාගෙන සිටින දේශපාලන පිරිසක් විසින් කියනවාද කියා දැනගන්නට කැමතියි. මේ රටේ අනාගතය ගැන, මේ රටේ ජනතාවගේ අනාගතය ගැන, කැක්කුමකින් කියනවාද, නැත්නම් තමන්ගේ දේශපාලන බලලෝභිකම නැතිවේය යන බයෙන් කියනවාද? දේශපාලන බලයට ලෝභකමින් මෙය කියනවාද? අන්න ඒ ප්‍රශ්න අහන්නට මා කැමතියි.

ඉදිරි අවුරුද්ද පමණක් නොවෙයි, ඉදිරියට 25 වසරක්ම ප්‍රගතිශීලීන් එකතු වී මේ රජය ගෙන යන්න පුළුවන් බව මා කියන්න කැමතියි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

ඡන්දයක් නැතිව.

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

ඡන්දය නැතිව නොවෙයි. තමුන්නාන්සේලාට විරුද්ධව මේ රටේ මහජනතාව සියයට සියයක්ම නැගී සිටින බව කියන්න කැමතියි. තමුන්නාන්සේලාගේ ධන බලයෙන්, චණ්ඩි බලයෙන්, තමුන්නාන්සේලාට බලය ලබා ගන්නට පුළුවන් වේය කියා හිතා ගෙන හිටියත් ලබනවර මැතිවරණයෙන් පසු තමුන්නාන්සේලාගෙන් කීදෙනෙක් මෙහි සිටීද කියා කියන්න බැහැ.

ගරු කථානායකතුමනි, අලුත් රජයට සුභ පතමින් අලුත් රජය මහජනතාවගේ ගැලවුම්කාරයා වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.18

**ඩී. පී. ආර්. වීරසේකර මයා.** (රත්නපුරය)
*(திரு. டீ. பி. ஆர். வீரசேக்கர—இரத்தினபுரி)*
(Mr. D. P. R. Weerasekera—Ratnapura)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට පාර්ලිමේන්තුවට ඇවිත් අවුරුදු ගණනක් තිස්සේ ඒ පක්ෂයේ සිට වාමාංශික ප්‍රතිපත්ති උඩ ක්‍රියා කරන්නයයි කෑගහගෙන එම පක්ෂයෙන් අස් වූ මන්ත්‍රීවරයකු හැටියට, එම ප්‍රතිපත්ති උඩම වාමාංශික පක්ෂත් සමග සභාග ආණ්ඩුවක් ඇති කරගෙන දෙගොල්ලන්ගේ සම්මුතියෙන් ඉදිරිපත් කර ඇති මේ පළමුවන රාජාසන කථා විවාදයේදී වචන ස්වල්පයක් කීමට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

1960 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජය ග්‍රහණය කළේ විශාල මහජන බලවේගයක්, මහජන සහයෝගයක් ඇතිවයි. නමුත් පාලන ක්‍රමයේ ඇති වරද නිසා, නිලධාරීන්ගේ කඩාකප්පල්කාරී ක්‍රියා නිසා, ප්‍රතිගාමී බලවේගයන් නිසා හා තවත් නොයෙකුත් විරුද්ධකම් නිසා මහජනයාත් රජයත් අතර තිබුණු සම්බන්ධකම ක්‍රම ක්‍රමයෙන් ඈත් වී ගියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රාජාසන කථාවේ ඉදිරිපත් කර තිබෙන කරුණු 14 න් වැදගත්ම හැටියට සලකන කරුණු කීපයක් ගැන කථා කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මා හිතන හැටියට මෙහි තිබෙන වැදගත්ම කරුණ නම් ජනතා කොමිටි පිහිටුවා, ඒ මඟින් ජනතාවත් රජයත් අතර තිබෙන පරතරය නැති කර, ජනතාවත් සම්බන්ධ කරගෙන මේ මාස 12 තුළ කටයුතු කිරීමට දරණ ප්‍රයත්නයයි. අවුරුදු තුනක් හතරක් තිස්සේ මේ රජයට පහර වැදුනේ—විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිගාමී කණ්ඩායම්වලින්—ප්‍රශ්න කීපයක් උඩයි. ඔවුන් බඩු මිල ප්‍රශ්නය දඩමීමා කරගෙන රජයට පහර ගැසුවා. බඩු මිල පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හෝ වෙනත් කෙනකුට දොස් කීමට එක්සත් ජාතික පක්ෂයට හෝ එම පක්ෂයේ අනුගාමිකයින්ට කිසිම අයිතියක් ඇත්තේ නැහැ. අප වාගේ අයට අයිතියක් තිබුණත් ඔවුන්ට කිසිම අයිතියක් ඇත්තේ නැහැ. හේතුව, නිලධාරීන්ගේ හෝ පාලන නීතිවල තිබෙන දුර්වලකම් ප්‍රයෝජනයට ගෙන එක්සත් ජාතික පක්ෂයට ආධාර කරන, ඔවුන්ගේ අනුගාමිකයන් හා පාක්ෂිකයින් වන ධනපති කොටස් ඉතා අයුතු ලෙස කටයුතු කරන නිසයි. මේ රටට ගෙනෙන බඩු තමන් විසින්ම හංගා බඩු හිඟයක් ඇති කොට, එම බඩුම සියයට 200 ක් ලාභ තබාගෙන වැඩි මිලට විකුණමින් ඒ ගැන දොස් කියන මහජනයාට හා බඩු ගන්නා අයට කියනවා, තමුසේලා පත් කළ මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව ආ දා සිට බ්ලේඩ් තලයක් ගන්න ඇත්තේ නැත, රෙදි යාරයක් ගන්න ඇත්තේ නැත, අරක නැත, මේක නැත කියා.

කළුකඩකාරයින්ගේ මේ ව්‍යාපාරය නවත්වා බඩු මිල පාලනය කොට ජනතාවට ආරක්ෂාව ලබා දීම සඳහා ජනතා කොමිටි පිහිටුවීමට යාම ගැන මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. ඒ මණ්ඩලවලට නීත්‍යානුකූල බලතල දී කඩ පරීක්ෂා කොට මහජනයා ආරක්ෂා කිරීම සඳහා කටයුතු යෙදීම වැදගත් කාරණයක්.

ඊළඟට වැදගත් කරුණ වශයෙන් මට පෙනී යන්නේ සුළු ජාතීන් පිළිබඳව සඳහන් කර ඇති කාරණයයි. ඉන්දියානු ප්‍රශ්නයත් භාෂා ප්‍රශ්නයත් විසඳීම සඳහා කටයුතු කරනවායයි මෙහි සඳහන් කර තිබෙනවා. සිංහල භාෂාව ආරක්ෂා කරන අතර ද්‍රවිඩ ජාතියට හානියක් නො වන අන්දමින් එම ප්‍රශ්නය විසඳනවාය කියා තිබීම ගැන මම සන්තෝෂ වෙනවා. අන්තිමට කථා කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයාගේ කථාව අසා මම සතුටු වුණා. මෙතෙක් කල් මේ ප්‍රශ්නය පිළිබඳව ඉතා පටු ලෙස කල්පනා කිරීමෙන් මෙය විසඳන්ට බැරි තත්ත්වයකට වැටුණා. සුළු ජාතියක් වන දෙමළ ජාතියේ භාෂාවට සාධාරණ අයිතියක් දීම යුතුය කියා මහජනයාට කීමට අපි බයයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අපිත් දැන් කෙළින්ම ප්‍රකාශ කර තිබෙනවා ජාතික ප්‍රශ්නය, භාෂා ප්‍රශ්නය, විසඳන්නෙ නැතිව මේ රටේ කොයිම ප්‍රශ්නයක්වත් විසඳන්න බැරි බව. අපි කියන්නෙ නැහැ සිංහල භාෂාව බල්ලට දමන්නය, නැත්නම් යටත් කරන්නය කියා. නමුත් සිංහල භාෂාවට තැන දෙන අතරම සුලු ජාතීන්ටත්, දෙමළ භාෂාව කථා කරන අයටත් සාධාරණ තැනක් දිය යුතුයි.

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)
රාජ්‍ය භාෂා නීතිය කඩන්නෙ නැතිව.

**ඩී. පී. ආර්. වීරසේකර මයා.**
*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)*
(Mr. D. P. R. Weerasekera)
අපිත් කියන්නෙ ඒක තමයි. රාජ්‍ය භාෂා නීතිය කඩන්න කියන්නෙ නැහැ. නමුත් සුලු ජාතියක් වශයෙන් ඒ අයටත් සාධාරණ තැනක් දී අප කෙරෙහි ඒ අය තුළ විශ්වාසයක් ඇති කරවන්ට ඕනෑ. පෙඩරල් පක්ෂය තර්ක කරන්නෙ භාෂා ප්‍රශ්නය දඩමීමා කර ගෙනයි. ඒ සමගම දේශපාලන නැගීමට භාෂා ප්‍රශ්නය ඉනිමගක් හැටියට ගෙන ඇත්තේ එය ජාතික විමුක්ති පෙරමුණ වගේ පක්ෂයි. එය මා කෙළින්ම කියනවා. අප පෙඩරල් පක්ෂය විවේචනය කරනව නම්, පෙඩරල් පක්ෂයට දොස් කියනව නම් එය හරි. ෆෙඩරල් මන්ත්‍රීවරුන්ට කොපමණ පහර ගැසුවත් කමක් නැහැ. නමුත් දෙමළ භාෂාව කථා කරන පළියට සියලුම කොටස්වලට පහර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. වීරසේකර මයා.]

ගසන්න ගියාම වෙන්නෙ මොකක්ද? ඔවුන් ෆේඩරල් පක්ෂයට තල්ලු කිරීමයි. අපිම ෆේඩරල් පක්ෂය කර කරනව. දැන් මෙතෙක් කල් කර තිබෙන්නෙ එයයි. දෙමළ කථා කරන කෙනෙක් සිටියොත් එයාට පහර ගහන්න ගහන්න, සිංහල ජනයා අප පාගනවාය, අප මරණවාය, අපට තැනක් දෙන්නෙ නැත කියා හැඟීමක් ඇති කර ගන්නා ඔහු භාෂාව දඩමීමා කර ගත් පෙඩරල් පක්ෂයට හේත්තු වී අපට පහර ගහනවා. ඒ අන්දමට අපම ෆේඩරල් පක්ෂය තර කර තිබෙනව. ඒ නිසා අප ෆේඩරල් පක්ෂය මේ රටින් අතුගා දැමීමට ක්‍රියා කරන අතරම, දෙමළ කථා කරන ජනතාවට සාධාරණ තැනක් දී, ඔවුන් කෙරෙහි තිබෙන භය නැති කර ඔවුන් තුළ අප කෙරෙහි විශ්වාසයක් ඇති කරවන්ට ඕනෑ.

ගරු කථානායකතුමනි, ආගම් ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉතාමත් ලක්ෂණට මේ රාජාසන කථාවේ සඳහන් කර තිබෙනව. බෞද්ධාගමට නියම තැන දෙන අතරම, සුලු ආගම් ඇදහීම පිළිබඳ සම්පූර්ණ නිද නිදහස සහතික කරන අතර, ආගම් භේද පිට කිසිදු අසාධාරණයක් සිදු නොවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනවාය කියා මෙහි සඳහන් වෙනව.

ඒ සමගම රාජාසන කථාවේ ඇති තවත් වැදගත් අංශයක් තමයි දූෂණ නැති කරනවාය යන ප්‍රශ්නය. මේ සභාග ආණ්ඩුව දූෂණ කරන නිලධාරීන් හෝ වෙනත් කොටස්වලට විරුද්ධව ක්‍රියා කරගෙන යනවාය කියා දැනටමත් මහජනයා තුළ විශ්වාසයක් තිබෙනවා. දැනටම සති දෙකක් තුළදී අංශ කීපයකම සෑහෙන පිරිසිදුකමක් ඇති කරගෙන යනවා. මා මේ රජයට එක් අවවාදයක් දෙන්ට කැමතියි. දූෂණ නැති කිරීමට ක්‍රියා කර ගෙන යන විට සමහර විට අපේ කිව්වු අයගේත් දුවර්ලකම් පෙනෙන්නට පුලුවන්. නමුත් මහජනතාවගේ විශ්වාසය කෙළින්ම දිනා ගන්ට නම් දූෂණ නැති කිරීමේ ව්‍යාපාරය ගෙන යන විට අපට පක්ෂ අයය, අපට විපක්ෂ අයය, ලොකු මිනිහාය, පොඩි මිනිහාය ආදී වශයෙන් වෙනසක් කරන්ට එපා. ලොකුම තැන්වලින් පටන් ගන්න. මේ දූෂකයන්

පාලන යන්ත්‍රයෙන් නෙරපිය යුතුය කියා අප දෙගොල්ලක්ම එකඟ වී තිබෙනව. මේ සම්බන්ධයෙන් වැඩියෙන්ම භය එක්සත් ජාතික පක්ෂයයි. [බාධා කිරීමක්] ඒ අය ගේ අනුගාමිකයන් තමයි වැඩි දෙනෙක් ඔය තැන්වල සිටින්නේ. එක්සත් ජාතික පක්ෂයට දූෂණ ගැන කථා කරන්ට බැහැ. බොරැල්ලේ මැතිවරණයේදී දිවුල් ගෙඩි දෙකට රුපියල් 20 ක් දුන් එක්සත් ජාතික පක්ෂයට අනික් අයගේ දූෂණකම් ගැන කථා කරන්ට බැහැ. [බාධා කිරීම්] බොරැල්ලේ මැතිවරණයේදී පාර පුරා මුදල් නෝට්ටු ගෙන ගොස් හොර ඡන්ද කොළ බෙදූ දුන් අයට බැහැ දූෂණ ගැන කථා කරන්ට. කථා කළොත් මා නම් කියනව. දිවුල් ගත්තෙ කව්ද කියනව.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

රුපියල් 20 ක වටිනාකම දැන් රුපියල් 2 යි.

**ඩී. පී. ආර්. වීරසේකර මයා.**
*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)*
(Mr. D. P. R. Weerasekera)

වට්ටි අම්මා කෙනෙකු ළඟට ගිහින් දිවුල් ගෙඩි දෙකක් අරගෙන රුපියල් විස්සක් දුන්න. [බාධා කිරීම්]

අපි හමුදුවක් යොදවල තිබුණ ඔය ව්‍යාපාරය නතර කරන්න. අපේ ගැටව් ටික දුවගෙන එනකොට හිමින්සීරුවෙ වත්තෙ ගම ගරු මන්ත්‍රීතුමා (ඒ. රත්නායක මයා.) කීව, "අන්න, අන්න කට්ටිය එනව" කියා. ඒ පාර හෙමින්සැරේ තවත් දිවුල් 7 ක් අරගෙන අයින් වුණා. නමුත් වට්ටිය උස්සා බැලුවාම ඒක යට රුපියල් 20 ක් තිබුන. [බාධා කිරීමක්] එදා රු එක්සත් ජාතික පක්ෂයෙ තවත් මන්ත්‍රීවරයකුගෙ කාරෙක වට කර බැලුවාම ඒක ඇතුළෙ "පෝලින් කාඩ්" මිටියක් තිබුණා. අපේ හාබර් කම්කරුවෝ එම කාරෙක ඉස්සුව. උස්සල, "අද උස්සන්නෙ තමුසෙගෙ කාරෙකයි; අනික් ගමනෙ තමුසෙ උස්සල පොළොවෙ ගහනව" කියා එළවා දැම්ම. එවැනි ව්‍යාපාර ගෙනියන අයට කිසිම අයිතියක් නැහැ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනික් අයගෙ දූෂණ ගැන කෑ ගහන්න. මා නම් එදත් කිව්වෙ එකයි. අද කියන්නෙත් එකයි. දූෂණ තිබුණොම ඒවා පෙන්වා දී ඒවා නැති කරන්න අපි උත්සාහ කරනව. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කෑ ගහන එක්සත් ජාතික පක්ෂයෙ ප්‍රජාතන්ත්‍රවාදය සීමා වන්නෙ මැතිවරණ දිනය ළඟා වන තුරු පමණයි. මහජන කැමැත්ත අනුව දිනුවත් පැරදුණත් කමක් නැහැ කියන එක නොවෙයි, අදහස. කොහොම හරි ඒ අය දිනන්න ඕනැ. බොරැල්ලේ ඡන්දයෙදි වාගෙ ලක්ෂ ගණනින් වියදම් කරල එවේලෙට කසිප්පු වීදුරුවක් හෝ දීල ඡන්දයක් ලබා ගත්තොත්, ඒකයි ප්‍රජාතන්ත්‍රවාදය. ඊට පස්සෙත් ඕනෑ දෙයක් කරන්න පුළුවනි, අවුරුදු 5 ක් තිස්සෙ.

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා**
*(திரு. சீ. பீ. ஜே. செனவிரத்ன)*
(Mr. C. P. J. Seneviratne)

වැලිමඩ ඡන්දයෙන් දිනන්න හදපු හැටි අපි දන්නව.

**ඩී. පී. ආර්. වීරසේකර මයා**
*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)*
(Mr. D. P. R. Weerasekera)

එක්සත් ජාතික පක්ෂයෙ ගරු මන්ත්‍රීන් බොහොම ලොකුවට කෑ ගහනව තමයි. නමුත් දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා) නම් ඒ ගැන වැඩි තර්ක කරන්න යන්නෙ නැහැ. එතුමා දන්නව තර්ක කරන්න ගියොත් සිදු වන දේ. පොලීසියෙ එන්ට්‍රි, කාර් නොම්මරවල සටහන්, ආදිය තියෙන නිසා වැඩි විස්තර කළොත් තරමක කැක්කුමක් ඇති වන්න පුළුවන් බව එතුමා දන්නව. මේ සභාග රජයෙ මන්ත්‍රීවරයකු හැටියට මා කෙළින්ම ප්‍රකාශ කරන්න සතුටුයි, අවුරුදු ගණනාවක් තිස්සෙ කෑ ගැසූ ප්‍රතිපත්තිවලට අනුව කිසි සැකයක් නැතිව අපට ඉදිරියට වැඩ කරන්න පුළුවන් වන බව.

මා ආණ්ඩු පක්ෂයෙන් අයින් වන අවස්ථාවේදි කී දේවල් තමුන්නාන්සේලට මතක ඇති. "මෙහෙම මේ වැඩ කරන්න බැහැ; එම නිසා වමට බර වන්න ඕනැ, ප්‍රතිගාමී කොටස්වලට පහර ගහන්න ඕනැ, ජනසතු ව්‍යාපාර ඇති කරන්න ඕනැ" කියා මා කීව. ඒවායින් දැන් සෑහෙන කොටසක් කර තිබෙන නිසා තමයි, අද මේ පක්ෂයට ඇවිත් සහයෝගය දෙන්නෙ. මා ගරු මුදල් ඇමතිතුමාගෙන් එක ඉල්ලීමක් කරන්න කැමතියි. මේ රටේ තවම ප්‍රතිගාමී ධනපති කොටස් සිටිනව. ඒ අය හැම බද්දෙන්ම නිදහස් වෙලා සිටිනව. ලක්ෂ ගණනින් කෝටි ගණනින් මේ රට සූරා කන්නන් හැටියට අපට ඒ අය හඳුන්වන්න පුළුවනි. විශේෂයෙන් මේ අවස්ථාවේදී ඔය මැණික් ව්‍යාපාරයෙ යෙදී සිටින ජාවාරම්කාරයන් ගැන සිහිපත් වෙනව. මුදල් ඇමතිතුමාට දැනට මත් එම අංශය භාර දී තිබෙන බව අපි දන්නව. එතුමා මේවර අය වැය ලේඛනය ඉදිරිපත් කරන විට අන්න ඒ ධනපති කොටස්වලට පහර ගසා දුප්පතා සහ මධ්‍යම පන්තියේ තැනැත්තා ආරක්ෂා කර ගන්න පුළුවන් වන අන්දමේ අය වැය ලේඛනයක් ඉදිරිපත් කරනවාට කිසිම සැකයක් නැහැ. එම පහර ගහන විට කොතරම් බලවේග පැමිණියත් ඒවාට බිය නොවී විශේෂයෙන් මැණික් ජාවාරම් කාරයන්ට තදින්ම වදින්න එතුමා පහර ගසාවිය කියා මා විශ්වාස කරනව. ඉල්ලීමක් හැටියටද එම කාරණය මා තමුන්නාන්සෙට ඉදිරිපත් කරමින්, මේ සභාග ආණ්ඩුව යටතෙ ඉදිරි මාස 12 තුළදී අපේ රටේ ප්‍රශ්න එක්තරා ප්‍රමාණයකටවත් විසඳා මහජන සහයෝගය ලබා ගන්න හැකි වේවා කියා ප්‍රාර්ථනය කරමින්, වාමාංශික කොටස් සියයට සියයක්ම අප සමඟ එකඟ නූනත් අපේ ඉදිරි ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ඒ සියලු දෙනාගේම සහයෝගය ලැබේවායි ප්‍රාර්ථනය කරමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 5.32

**යූ. බී. වීරසේකර මයා.** (යටිනුවර)
*(திரு. யூ. பி. வீரசேக்கர—யட்டிநுவரை)*
(Mr. U. B. Weerasekara—Yatinuwara)

Mr. Speaker, it is with great pleasure that rise to support my Government in this Throne Speech Debate. During the last two or three days we have heard various case histories, autobiographies, political analyses—all sorts of things.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යූ. බී. වීරසේකර මයා.]

It is good that the people of this country should know the history of each political party. The Sri Lanka Freedom Party and the Lanka Sama Samaj Party have joined together not with a view to holding power but it was something that was inevitable. Having regard to the political forces that are working in this country, having regard to the trends of political thought in this country, it was inevitable that the two parties should join together.

Of course, when two parties get together problems arise. I am not a Marxist, but according to Karl Marx —I know a little of Marxism having read one or two books on the subject—

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (මහියංගන)
(திரு. சி. பி. ஜே. செனவிரத்ன—மஹியங்கனை)
(Mr. C.. P J. Seneviratne—Mahiyangana)

A little learning is a dangerous thing.

යූ. බී. වීරසේකර
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

It is more dangerous with a man like you who does not know anything.

In any country, whether it be Ceylon, the United States of America or Great Britain, there is what is called thesis, antithesis and systhesis in the political field. The hon. Member for Dehiowita might laugh, the revolutionary that he is—

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Get your facts straight. He is now the Member for Bulathsinhala.

කේ. තුරෙයිරත්නම් මයා. (පේදුරු තුඩුව)
(திரு. கே. துரைரத்னம்—பருத்தித்துறை)
(Mr. K. Thurairatnam—Point Pedro)

He is not laughing at you but with you.

යූ. බී. වීරසේකර
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

In this situation people of different political parties are trying to express their views.

Why was this Coalition Government formed? There were several alternatives open to the Hon. Prime Minister. She could have taken a very undemocratic step. There were three alternatives open to her but she chose the democratic alternative.

I was very perturbed when I listened to the speech of the hon. First Member for Colombo South (Mr. J. R. Jayawardene), who is the deputy leader of the U. N. P. When people like Dr. S. A. Wickremasinghe or Dr. N. M. Perera talk about overthrowing the Government, we are not perturbed. That can be explained away. They are Marxists or Trotskyites and that is their political philosophy or political program—the overthrowing of the Government.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

And the country is behind them.

යූ. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

The hon. Member who pretends to be the deputy leader of a democratic party leading the workers and the peasants of this country says that if this Government continues in office one day beyond its legal term, his party will overthrow the Government.

Today I am going to take the hon. First Member for Colombo South to task for that statement of his. In fact, I interrupted the hon. Member while he was speaking and I felt that it was not correct on my part to have done so. He was kind enough to say that he had no time to reply to me. I said I would ask the question again

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

in the course of my speech. I ask the hon. First Member for Colombo South how he is going to overthrow any Government that comes into power in this country.

I am perturbed not because he used the word 'overthrow' but because we see today, not only in this country but also outside, people who are backed by foreign governments and foreign money and who are prepared to subscribe to that view. We see that in our villages, in the V. C. elections and in the election of chairmen. I know it because I represent a rural area, Yatinuwara.

I ask the question whether the people of this country are prepared to overthrow any Government except through the democratic process. That is the question in the minds of many people.

යූ. බී. වන්නිනායක මයා. (යාපහුව)
(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)
(Mr. U. B. Wanninayake—Yapahuwa)

Ask the people.

යූ. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

I know that the U. N. P. has enough money both in this country and outside to overthrow or buy up any Government.

Let us be clear in our minds that this Coalition Government came into being as a result of certain political forces. It was an inevitable decision that we had to make. Let me make it quite clear that when we formed this Coalition we had no intention, even in our dreams, of postponing the elections. It was the question of the elections that was discussed first. The Hon. Prime Minister and Hon. Minister of Finance, the leader of the L. S. S. P., discussed the question of an electoral pact, and the Hon. Minister of Finance said "For the next General Election you, as the Prime Minister of this Coalition Government, can nominate both S. L. F. P. and L. S. S. P. candidates".

Therefore, it is not only backbenchers like me but many people in the country who are worried about the statement made by a former revolutionary, the hon. First Member for Colombo South, who subscribed to certain Marxist views in his younger days. We are perturbed that the deputy leader of a democratic party should have used those words. If the U. N. P. in frustration or desperation uses undemocratic methods, the people of this country, both workers and peasants, are ready with the correct answer. Let it not be forgotten that the people of this country are not in any mood to be bought with money. They know their rights.

වෛද්‍යාචාර්ය එම්. සී. එම්. කලීල් (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)
(டொக்டர் எம். ஸீ. எம். கலீல்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)
(Dr. M. C. M. Kaleel—Third Colombo Central)

If you hold the elections there will be nothing to worry about. There will be no need for you to worry nor for the people to worry.

යූ. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

The people know their rights. They have suffered long enough. Today there is a breath of fresh air in the country. They are not wondering any more whether the U. N. P. with its money can buy them up or whether the Coalition Government will deliver the goods. They are certain that the Coalition Government will deliver the goods.

They are certain other problems which are worrying the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna) and the hon. Member for Uva-Paranagama (Mrs. Kusuma Rajaratna), namely, the language problem and the Indian problem. I am myself a Member representing a Kandyan area where the language problem and the Indian problem are acutely felt. I do not want to criti-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. සී. ආර්. විරසේකර මයා.

cize the two hon. Members merely for the sake of criticizing them. I listened to their speeches, and I feel that there is a certain danger. That is why we even at the S. L. F. P. Executive Committee Meeting made certain statements to the Prime Minister. We said that we would like the progressive forces to join together, but not at all costs. We gave a mandate to the Prime Minister with certain conditions and we hope and trust that she and the Leader of the L. S. S. P., the Hon. Minister of Finance, will vindicate our principles and uphold our demands, namely, that, just because these two forces have got together, we will not sell our country to the Indians nor compromise on the Sinhalese Only Act; that has become law and that cannot be touched.

I do not say that the minorities of this country should not have their true and proper place; the reasonable use of Tamil provisions must be implemented, but all the time we must remember that the interests of the minorities and the majority must be safeguarded. Long before this, I think about two years ago, I said that as long as the minorities of this country are in a permanent state of dissatisfaction there will be a permanent state of chaos in this country. We the Sinhalese have had our share of it under the Portugese, Dutch and the Britishers; then we went through a spate of it under our own people acting like the imperialists. The result of it is that we have extremism today.

I do maintain that the majority community must get its due rights and at the same time the minorities and the minority religions should have their due places. Well, I think, if, as reasonable men, we put our heads together the language question and the Indian problem can be solved.

Today, in many speeches, especially in those of the United National Party, they said that it is stated in the Throne Speech that the *Badakas*, the impediments to the solution of the Indian problem will be removed. Hence, I should like to ask the hon. Members of the United National Party why they did not solve this problem when they had a wonderful opportunity to do so when Pundit Nehru was in his young days and long before he became old and feeble. They never wanted to face this problem, but we are sure that our Prime Minister, with all her experience, can solve this problem provided the U. N. P. will not raise the communal cry on this issue. If the hon. Members are very keen to solve this problem certainly it can be done. There may be difficulties and there may be unrest in the country, but if we are genuinely interested in it and if we really want to solve it, it can be solved.

Sir, I do not wish to speak further but I should like to ask the hon. Members of this House, in this present political situation, in this context, to bear with the Government and not to use names and terms which have no meaning—terms like Marxists, Trotskyites, revolutionaries and reactionaries. Let us think as Ceylonese—(*Interruption*). I would not even use that word "progressives". Let us think reasonably and see whether as reasonable men, forgetting our political future of political camps or the next elections, we cannot solve this outstanding problem.

With regard to the economic problem I am sure and hopeful that with the Hon. Minister of Finance—though it may not be solved completely—at least a basis of solution will be formulated and that an attempt will be made to solve this question. I am con-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

fident of that. Similarly in other spheres, social, language and the Indian problem, if we only tackle it correctly and with a good heart, I think, these problems can be solved. I hope that the hon. Members on the other side of the House will bear with us and help us to solve this, and let us campaign next time very nicely as U. N. P. and S. L. F. P. Whatever it is, let us always remember that we are answerable to the people.

* * * * *

[ඉතිරි වැඩ කටයුතු 1964 ජූලි 15 වන දින නිල වාර්තාවෙන් බලාගත යුතුයි.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල ශුද්ධ කළ යුතු තැන් දක්වනු පිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි වැරදි හරිගස්සා එම පිටපත ප්‍රධාන වාර්තාකරු හා හැන්සාඩ් සංස්කාරක වෙත

1964 ජූලි 21 වන අඟහරුවාදා

නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.

---

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்ய விரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற் றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை பிரதிநிதிகள் சபை பிரதம அறிக்கையாளர்—ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1964, ஜூலை 21, செவ்வாய்க்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

---

**NOTE**

Corrections which Members suggest for the final Print should be clearly marked in this Report, and *the copy containing the corrections must reach* the Chief Reporter and Editor of HANSARD, House of Representatives,

**not later than**

**Tuesday, 21st July, 1964**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

1964

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

1964

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00) Half rates for 6 months. Each part 30 cents, by post, 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

1964

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

இலங்கை, வாழைச்சேனை ஈஸ்டேண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனால் உற்பத்திசெய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org